කාන්තා සහ ළමා කටයුතු
අමාත්‍යාංශය

# මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ
# ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම
# (NMSAP-ECCD)
2026-2030

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ
ජාතික ලේකම් කාර්යාලය

සහාය දැක්වීම

unicef
for every child
සැම දරුවෙක් වෙනුවෙන්ම
ஒவ்வொரு சிறுவர்களுக்காகவும்

**© 2026 කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය. සියලුම හිමිකම් ඇවිරිණි.**

පිටු සැලසුම සහ නිර්මාණය: අබ්දුල් බාසිත්

සහාය දැක්වීම

**UNICEF Sri Lanka**

කාන්තා සහ ළමා කටයුතු
අමාත්‍යාංශය

## මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ

# ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම

# (NMSAP-ECCD)

## 2026-2030

සහාය දැක්වීම

unicef
for every child
සෑම දරුවෙක් වෙනුවෙන්ම
ஒவ்வொரு சிறுவர்களுக்காகவும்

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ
ජාතික ලේකම් කාර්යාලය

# අමාත්‍යාංශ ලේකම්තුමියගේ
## පණිවිඩය

ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය යනු දරුවෙකු පිළිසිඳ ගැනීමේ සිට වයස අවුරුදු පහ දක්වා වූ කාලසීමාව වන අතර, එම අවධිය ජීවිත කාලය පුරා සිදුවන වර්ධනය හා සංවර්ධනය සඳහා පදනම සකස් කරනු ලබන තීරණාත්මක අවධිය ලෙස පිළිගනු ලැබේ. පර්යේෂණවලින් පෙන්නුම් කරන්නේ දරුවෙකුගේ මොළයේ වර්ධනයෙන් 90% කට ආසන්න ප්‍රමාණයක් මෙම මුල් ළමාවිය තුළ සිදුවන බවයි. එබැවින් මෙම කාලසීමාව බුද්ධිමය, ශාරීරික, චිත්තවේගීය හා සමාජීය සංවර්ධනය සඳහා වඩාත් ම බලපෑම්කාරී අවධිය ලෙස සැලකේ. ඒ අනුව ඉගෙන ගැනීමට, නව පරිසරයන්ට අනුගතවීමට නව කුසලතා අත්පත් කර ගැනීමට සහ ධනාත්මක වටිනාකම් වර්ධනය කර ගැනීමට දරුවන්ට ඇති හැකියාව වඩාත් ප්‍රබල ලෙස ප්‍රකාශ වන්නේ මෙම අවධියේ දී ය.

ජාතියක අනාගත සාර්ථකත්වය රඳා පවතින්නේ එහි ළාබාලතම පරපුරේ ගුණාත්මක සංවර්ධනය මතය. එබැවින් ශක්තිමත් පදනමකින් යුත් මුල් ළමාවියක් ගොඩනැගීමකින් තොරව, පූර්ණ ලෙස සංවර්ධනය වූ හා සමාජයට ඵලදායී දායකත්වයක් ලබා දිය හැකි පරපුරක් බිහි කළ නොහැක. මුල් ළමාවියේ දී ප්‍රමාණවත් රැකවරණය, පෝෂණය, ආරක්ෂාව, මුල් ඉගෙනුම් අවස්ථා සහ සාර සර්ව රැකවරණය හිමිවන දරුවන්, සෞඛ්‍ය සම්පන්න ආත්ම විශ්වාසයෙන් යුත්, ඵලදායී සහ වගකීමෙන් කටයුතු කරන පුරවැසියන් ලෙස වර්ධනය වීමට වැඩි ඉඩකඩක් ඇත. එබැවින් මුල් ළමාවිය සංවර්ධනය වෙනුවෙන් ආයෝජනය කිරීම යනු දරුවන් පමණක් සිදුකරන ආයෝජනයක් නොව රටේ මානව ප්‍රාග්ධනය, සමාජ සුබසාධනය සහ තිරසර සංවර්ධනය සඳහා සිදුකරන ආයෝජනයකි.

දරුවන් සඳහා ආයෝජනය කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා රජය 2004 වර්ෂයේ දී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලදී. ප්‍රතිපත්ති රාමුව මත පදනම් ව, කාලයත් සමඟ ඇති වූ සමාජ ආර්ථික වෙනස්කම්, තාක්ෂණික ප්‍රගතිය මෙන්ම දරුවන් හා පවුල් මුහුණ දෙන නව අභියෝග ද සැලකිල්ලට ගනිමින්, මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික බහු ආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (2026-2030) සකස් කර ඇත. එම සැලැස්මේ අරමුණ වන්නේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව අංශ අතර ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීමයි.

මෙම උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම, සෑම දරුවෙකුගේ ම සෞඛ්‍ය සම්පන්න වර්ධනය හා සංවර්ධනය උදෙසා රාජ්‍ය ආයතන, සංවර්ධන හවුලකරුවන්, සිවිල් සමාජ සංවිධාන, පෞද්ගලික අංශය, ප්‍රජාවන් හා පවුල් ඇතුළු සියලු පාර්ශවයන්ගේ සාමූහික කැපවීම අත්‍යවශ්‍ය බව පිළිගනිමින්, සමස්ත රාජ්‍ය සහ බහු ආංශික ප්‍රවේශයක් අනුගමනය කරයි. අංශ අතර සහයෝගීතාවය ශක්තිමත් කිරීම හා ගුණාත්මක මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවාවන් සඳහා සාධාරණ හා සමාන ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම මගින්, ශ්‍රී ලංකාවේ සෑම දරුවෙකුටම ආරක්ෂිත, සුරක්ෂිත, සාරසර්ව රැකවරණය, අන්තර්කරණ සහ සමස්ත සංවර්ධනය දිරිගන්වන පරිසරයක් තුළ වර්ධනය වීමට අවස්ථාව සැලසීම අපේක්ෂා කරනු ලැබේ.

මෙම උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සියලු ම පාර්ශවකරුවන්ගේ අඛණ්ඩ සහයෝගය සහ කැපවීම කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යංශය අපේක්ෂා කරයි. සියලු දෙනාගේ සාමූහික දායකත්වය තුළින් සෞඛ්‍ය සම්පන්න, අභියෝග ජයගත හැකි, දක්ෂතා සහිත දරු පරපුරක් බිහිකර, ඔවුන් වගකීමෙන් යුතු හා ඵලදායී පුරවැසියන් ලෙස වර්ධනය වීමට අවශ්‍ය ශක්තිමත් පදනම ගොඩනැගිය හැකිය.

මෙම උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී ලබා දුන් නායකත්වය සහ කැපවීම වෙනුවෙන්, මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවට හා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ට මාගේ අවංක කෘතඥතාවය පළ කරමි. මෙම ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා සිය විශේෂඥ දැනුම හා කැපවීම තුළින් දායක වූ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, අධ්‍යයන ක්ෂේත්‍ර, වෘත්තීය ආයතන හා අනෙකුත් හවුල්කාර සංවිධානවල සියලූ ම නියෝජිතයින් වෙත ද මාගේ කෘතඥතාවය පළ කර සිටින අතර ජාතික උද්දේශන (Advocacy) ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම සහ මෙම බහු ආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සාර්ථකව සකස් කිරීම සඳහා ලබා දුන් මූල්‍ය හා තාක්ෂණික අගනා සහාය වෙනුවෙන් එක්සත් ජාතීනගේ ළමා අරමුදල (UNICEF) වෙත ද මාගේ විශේෂ ස්තූතිය පුද කර සිටිමි.

**තරංගනී වික්‍රමසිංහ**
ලේකම්
කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

# තාක්ෂණික කමිටුව

**තාක්ෂණික උපදේශක:**
**වෛද්‍ය යසස්වි එන් වල්පිට මහත්මිය**
ප්‍රජා වෛද්‍ය විශේෂඥ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය

**සහාය දැක්වීම:**
**වෛද්‍ය අරුණි ගාල්ලගේ මහත්මිය**
කථිකාචාර්ය, ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය

**තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම:**

**එන්. එච්. එම්. ඩබ්ලිව්. ඩබ්ලිව්. හේරත් මහත්මිය**
අතිරේක ලේකම් (සංවර්ධන), කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

**එච්. එච්. හේමා පෙරේරා මහත්මිය**
අතිරේක ලේකම් (සංවර්ධන), කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

**ඩී. ඩී. වරුණි රසාදරී මහත්මිය**
අධ්‍යක්ෂ, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

**අනෝමා සිරිවර්ධන මහත්මිය**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**ශානිකා මලල්ගොඩ මිය**
අධ්‍යක්ෂ (සැලසුම්), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**සඳරේකා ලියනගේ මහත්මිය**
සහකාර කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

**පද්මිණී රණවීර මහත්මිය**
උප සභාපති (ප්‍රතිපත්ති), ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

**රුක්මලී කාරියවසම් මහත්මිය**
අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන), අධ්‍යාපන අමාත්‍යාංශය

**ආර්. එම්. කේ. ද සිල්වා මහත්මිය**
අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධන ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

**වෛද්‍ය ආසිරි හේවාමාලගේ මිය**
ප්‍රජා වෛද්‍ය විශේෂඥ අංශ ප්‍රධානී (ළමා සංවර්ධන හා විශේෂ අවශ්‍යතා ඒකකය),
පවුල් සෞඛ්‍ය කාර්යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය

**වෛද්‍ය ලක්මිණි මාගොඩරත්න මහත්මිය**
අධ්‍යක්ෂ, පෝෂණ අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය

**වෛද්‍ය එනෝකා වික්‍රමසිංහ මහත්මිය**
ප්‍රජා වෛද්‍ය විශේෂඥ උපායමාර්ගික තොරතුරු, සැලසුම්, අධීක්ෂණ සහ
ඇගයීම් ඒකක ප්‍රධානී, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය

**එස්. එම්. ආර්. එස්. බණ්ඩාර මහතා**
අධ්‍යක්ෂ, මුදල් කොමිෂන් සභාව

**ටී. කේ. ගුණතිලක මහතා**
අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධන ඒකකය), මධ්‍යම පළාත

**එස්. ජේ. යූ. බී. කෝරලේගෙදර මහතා**
අධ්‍යක්ෂ (පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව), සබරගමුව පළාත

**ඩී. එම්. සී. දිසානායක මහතා**
අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධන ඒකකය), ඌව පළාත

**අචිනි වීරසිංහ මහත්මිය**
සෞඛ්‍ය කළමනාකාරිනි, වැව්ලි මානව සංවර්ධන භාරය

**සී. එන්. නදීකා මහත්මිය**
මුල් ළමා සංවර්ධන නිලධාරි, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

**ඩබ්ලිව්. ඩී. පී. කුමාරි මහත්මිය**
මුල් ළමා සංවර්ධන නිලධාරි, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

**වෛද්‍ය ඇබ්නර් ඩැනියෙල් මහතා**
සෞඛ්‍ය සහ පෝෂණ කළමනාකරු, UNICEF

**තකාහෝ ෆුකාමි මහත්මිය**
අධ්‍යාපන ප්‍රධානී, UNICEF

**ශෂිකලා රත්නායක මහත්මිය**
අධ්‍යාපන නිලධාරි, UNICEF

**විශේෂඥ උපදෙස්:**
**ආචාර්ය ඉන්ද්‍රානි තලගල මහත්මිය,** මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ විශේෂඥ

# පටුන


අමාත්‍යාංශ ලේකම්තුමියගේ පණිවිඩය 02

තාක්ෂණික කමිටුව 04

කෙටි යෙදුම් සහ සංකේත නාම ලැයිස්තුව 06

රූප සටහන් පෙළගැස්ම 09

**01. පසුබිම 11**

- 1.1. ජීවන චක්‍රය හරහා මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන ක්‍රියා මාර්ග බල ගැන්වීම 14
- 1.2. මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධන මැදිහත්වීම් සඳහා බහුආංශික සහභාගීත්වය 14
- 1.3. මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සදහා වූ ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ සන්දර්භය 16
- 1.4. දැක්ම, මෙහෙවර සහ අරමුණු- මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය 2018 17

**02. මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (NMSAP-ECCD) 2026-2030 සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය 21**

**03. මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම NMSAP-ECCD (2026-2030) 27**

උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 01
**සෞඛ්‍යය සහ පෝෂණය** 28

උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 02
**මුල් ළමාවිය අධ්‍යාපනය** 44

උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 03
**රැකවරණය සහ ආරක්ෂාව** 66

උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 04
**දෙමාපියන්, පවුල සහ ප්‍රජාව** 80

උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 05
**මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා ආයෝජන** 90

උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 06
**පාලනය සහ ගුණාත්මක ව්‍යුහය වැඩිදියුණු කිරීම** 100

**04. ප්‍රධාන කාර්ය සාධන දර්ශක 107**

**05. ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණය 115**

ඇමුණුම 119

# කෙටි යෙදුම් සහ සංකේත නාම ලැයිස්තුව

| | |
|---|---|
| ADB | ආසියානු සංවර්ධන බැංකුව |
| ADIC | මත්පැන් සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය |
| CBO | ප්‍රජා මූලික සංවිධාන |
| CHDR | ළමා සෞඛ්‍ය සංවර්ධන වාර්තාව |
| CPD | අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය |
| CRC | ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය |
| CRPO | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී |
| CSO | සිවිල් සමාජ සංවිධාන |
| CWC | ළමා සුභසාධන සායන |
| DCC | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව |
| DCS | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| DDG-PHS | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්-මහජන සෞඛ්‍ය සේවා |
| DMC | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| DPCCS | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| DPRD | ආපදා පෙර සූදානම් සහ ප්‍රතිචාර අංශය |
| DRR | ආපදා අවදානම අවම කිරීම |
| DS | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| DSS | සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| E & OH | පරිසරය සහ වෘත්තීය සෞඛ්‍යය |
| ECCD | මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය |
| ECD | මුල් ළමාවිය සංවර්ධනය |
| ECE | මුල් ළමාවිය අධ්‍යාපනය |
| ERHMIS | ඉලෙක්ට්‍රොනික ප්‍රජනක සෞඛ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය |
| ET & R | අධ්‍යාපනය, පුහුණුව සහ පර්යේෂණ |
| EUH | වතු සහ නාගරික සෞඛ්‍යය |
| FGD | ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව |
| FHB | පවුල් සෞඛ්‍ය කාර්යාංශය |
| GDP | දළ දේශීය නිෂ්පාදිතය |
| GP | සාමාන්‍ය වෛද්‍යවරයා |
| HIS | සෞඛ්‍ය තොරතුරු පද්ධති |
| HPB | සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය |
| HR | මානව සම්පත් |
| IEC | තොරතුරු අධ්‍යාපනය සහ සන්නිවේදනය |
| INGO | ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානය |

| | |
|---|---|
| **IYCF** | ළදරු හා කුඩා දරුවන්ගේ අනුපූරක පෝෂණය |
| **KII** | ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ සාකච්ඡා |
| **LG** | පළාත් පාලන |
| **M & E** | අධීක්ෂණය සහ ඇගයීම |
| **MC** | නගර සභාව |
| **MCH** | මාතෘ සහ ළමා සෞඛ්‍යය |
| **MCN** | මාතෘ සහ ළමා පෝෂණය |
| **MDPU** | කළමනාකරණ, සංවර්ධන සහ සැලසුම් ඒකකය |
| **DMD** | ආපදා කළමනාකරණ අංශය (ආරක්ෂක අමාත්‍යාංශය) |
| **MoE** | අධ්‍යාපන අමාත්‍යාංශය |
| **MoF** | මුදල් අමාත්‍යාංශය |
| **MOH** | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී |
| **MoH** | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| **MoJ** | අධිකරණ අමාත්‍යාංශය |
| **MoL** | කම්කරු අමාත්‍යාංශය |
| **MoPI** | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| **MoRDSSCE** | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය |
| **MRI** | වෛද්‍ය පර්යේෂණ ආයතනය |
| **MSG** | මාතෘ උපකාරක කණ්ඩායම් |
| **MWCA** | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |
| **MWSEID** | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය |
| **NATA** | දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය |
| **NCC** | ජාතික සම්බන්ධීකරණ කමිටුව |
| **NCPA** | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය |
| **NEC** | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| **NIE** | ජාතික අධ්‍යාපන ආයතනය |
| **NIHS** | ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය |
| **NSECD** | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය |
| **NMSAP-ECCD** | ECCD පිළිබඳ ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම |
| **NWSDB** | ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය |
| **PC** | පළාත් සභාව |
| **PCC** | පළාත් සම්බන්ධීකරණ කමිටුව |

| | |
|---|---|
| **PDHS** | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| **PDPCCS** | පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| **PHDT** | වැවිලි මානව සංවර්ධන භාරය |
| **PHI** | මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| **PHM** | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී |
| **PHSRC** | පෞද්ගලික සෞඛ්‍ය අංශ නියාමන කොමිෂන් සභාව |
| **PMCUs** | ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක |
| **QS** | තත්ත්ව ලේකම් කාර්යාලය |
| **RDHS** | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| **RMNCAYH** | ප්‍රජනක, මාතෘ, නවජ, ළමා, නව යොවුන් වියේ සහ තරුණ සෞඛ්‍යය |
| **SDG** | තිරසර සංවර්ධන ඉලක්ක |
| **SMEHCI** | වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය |
| **SS** | සමාජ සේවා |
| **TAC** | තාක්ෂණික උපදේශක කමිටුව |
| **TOR** | යොමුකිරීමේ අනුදේශ |
| **TOT** | පුහුණුකරුවන් පුහුණු කිරීම |
| **TVEC** | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| **TWG** | තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම |
| **UC** | නගර සභාව |
| **UDA** | නාගරික සංවර්ධන අධිකාරිය |
| **UNCRC** | එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය |
| **UNICEF** | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල |
| **USDA** | නාගරික අංශ සංවර්ධන අධිකාරිය |
| **VCDC** | ග්‍රාමීය ළමා සංවර්ධන කමිටුව |
| **VTA** | වෘත්තීය පුහුණු අධිකාරිය |
| **WASH** | ජලය, සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව |
| **WB** | ලෝක බැංකුව |
| **WHO** | ලෝක සෞඛ්‍ය සංවිධානය |

# රූප සටහන් පෙළගැස්ම


| | |
|---|---|
| **රූපය 1.1** | පළමුවැනි අවුරුදු 05 තුළ මොළයේ සංවර්ධනය |
| **රූපය 1.2** | ECCD සම්බන්ධ තිරසර සංවර්ධන ඉලක්ක |
| **රූපය 1.3** | සාරසර්ව රැකවරණ රාමුව |
| **රූපය 1.4** | ECCD සඳහා ඒකාබද්ධ සහයෝගිතා ජාලය |
| **රූපය 1.5** | සාක්ෂිමත පදනම් වූ ECCD මැදිහත්වීම් |
| **රූපය 1.6** | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2018 හි මූලික ක්‍රියාකාරී කොටස් |
| **රූපය 2.1** | NMSAP-ECCD සංවර්ධනයේ හි ක්‍රියාවලිය |
| **රූපය 5.1** | බහු ආංශික සැලැස්මේ ප්‍රධාන කොටස්කරුවන් |
| **රූපය 5.2** | සම්බන්ධීකරණ කමිටු හා තාක්ෂණික කමිටුව අතර සම්බන්ධතා |

# 01

# පසුබිම

මුල් ළමා වියේදී මනා රැකවරණය සහ සංවර්ධනය (ECCD) සැලසීම මගින් දරුවන්ගේ කායික, සංජානන, භාෂා, සමාජීය සහ චිත්තවේගීය සංවර්ධනය ඇතුළු පරිපූර්ණ සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම පහසු කිරීම අරමුණු කරයි. මුල් ළමාවිය සාමාන්‍යයෙන් උපතේ සිට වයස අවුරුදු 8 දක්වා කාලය ලෙස අර්ථ දැක්වේ[1]. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල්, ඔවුන්ගේ මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධන වැඩසටහන් තුළ ජීවිතයේ පළමු දින 1,000 (වසර 3) කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් උපතේ සිට ප්‍රාථමික පාසල් ප්‍රවේශය දක්වා කාලය ඉලක්ක කරමින් මැදිහත් වීම් සිදු කරයි.

ජීවිතයේ මුල් වසරවලදී, මොළය බාහිර බලපෑම්වලට වඩාත් සංවේදී වන අතර යහපත් බලපෑම් මගින් මෙම අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම අපේ වගකීමයි. අවදානම් සාධක කෙරෙහි විශේෂ සංවේදීතාවයක් දැක්වීමද මෙහි අතුරු සාධකයක් වන අතර එම සෘණාත්මක බලපෑම් අවම කර ගනිමින්, පූර්ව මැදිහත්වීම්වල ප්‍රතිලාභ විස්තාරණය කිරීමේ අවස්ථාව අප විසින් ප්‍රයෝජනයට ගත යුතුය. 2016 දී ප්‍රකාශයට පත් කරන ලද මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ඉහළම නිර්දේශ ඇතුලත් Lancet ප්‍රකාශන මාලාවේ සඳහන් වන්නේ, ජීවිතයේ මුල් වසරවලදී, මොළය තත්පරයකට නව ස්නායු සම්බන්ධතා මිලියනයකට වඩා වැඩි ප්‍රමාණයක් ගොඩ නගා ගනිමින් වර්ධනය වන බවයි[2]. නැවත කිසිදා සිදු නොවන මෙම වේගවත් වර්ධනය සහ සංවර්ධනය පළමු දින 1,000 තුළ වඩාත් කැපී පෙනෙන අතර ජීවිත කාලය පුරාම ශාරීරික, සංජානන, චිත්තවේගීය සහ සමාජීය ක්‍රියාකාරිත්වය සඳහා පදනම සපයයි.

එබැවින් ප්‍රශස්ත මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය, සෑම දරුවෙකුගේ ම මූලික අයිතිවාසිකමක් ලෙස හඳුනා ගත්තද, අඩු සහ මධ්‍යම ආදායම් ලබන රටවල වෙසෙන වයස අවුරුදු පහට අඩු ළමුන්ගෙන් 43%ක් එනම් ඇස්තමේන්තුගත මිලියන 250ක් පමණ දරුවන් ප්‍රශස්ත නොවන සංවර්ධනයේ අවදානමට ලක්ව සිටී[3].

මෙම දරුවන්ට, දුප්පත්කමත් ඒ හා බැඳුණු පෝෂණ ඌණතාවන් ඇතුළු කාරණා නිසා ඔවුන්ගේ සම්පූර්ණ වර්ධනය හා සංවර්ධන විභවය සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී ඇත. ප්‍රශස්ථ මුල් ළමාවිය සංවර්ධන අයිතිය, ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCRC) මගින් ද පිළිගනී[1]. එබැවින් ශ්‍රී ලංකාව ඇතුළු 'ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය' (CRC) අනුමත කර ඇති සියලුම රටවල්, වඩාත් අවදානමට ලක්විය හැකි දරුවන් ආරක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, මුල් ළමාවිය වර්ධනය සහ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සේවාවන් සියලු දරුවන්ට ලබා දීම සඳහා බැඳී සිටී.




රූපය 1.1: ජීවිතයේ පළමු වසර 5 තුළ මොළයේ සංවර්ධනය
මූලාශ්‍රය: සංවර්ධනය වෙමින් පවතින ළමයින් පිළිබඳ මධ්‍යස්ථානය, "මොළයේ ව්‍යුහය", හාවඩ් විශ්වවිද්‍යාලය, 2019 ජූලි 2. https://developingchild.harvard.edu/science/key-concepts/brainarchitecture/

මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනයහි අවශ්‍යතාවය, 2030 තිරසාර සංවර්ධන ඉලක්ක තුළ ළමා සංවර්ධනය සඳහා ප්‍රශස්ත පරිසරයක් නිර්මාණය කිරීමට කැපවීම හරහා ගෝලීය වශයෙන් ද අනුමත කර ඇත. මුල් ළමාවිය මැදිහත්වීම් තුළින් දරිද්‍රතාවය සහ අසමානතාවය තුරන්කිරීම මෙන්ම සාමය හා සමෘද්ධිය සහතික කිරීම මෙහි අරමුණු වේ. 1.2 රූපය මගින් තිරසාර සංවර්ධන ඉලක්ක සහ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන ඉලක්ක අතර සම්බන්ධය විදහා දක්වයි.

1 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989), සාමාන්‍ය අදහස් අංක 7, (2005). ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම
2 Lancet ප්‍රකාශනමාලාව (ඔක්. 2016). මුල් ළමාවිය සංවර්ධනය: විද්‍යාවේ සිට පරිමාණය දක්වා https://www.thelancet.com/series/ECD2016
3 UNICEF (2023). මුල් ළමාවිය සංවර්ධනය - සෑම දරුවෙකුටම UNICEF දැක්ම https://www.unicef.org/reports/early-childhood-development-unicef-vision-every-child

1 NO POVERTY

**අභිමතාර්ථ 1. සියලු ආකාරවලින් දරිද්‍රතාවය සෑම තැනකම තුරන් කිරීම.**

**ඉලක්කය 1.2: 2030 වන විට, සියලු මානයන්හි දරිද්‍රතාවයෙන් පෙළෙන සියලුම වයස්වල පිරිමින්, කාන්තාවන් සහ ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩු කිරීම.**

මුල් ළමාවිය සංවර්ධනය සඳහා කරනු ලබන ආයෝජන දරුවන්ගේ පෝෂණය, සෞඛ්‍යය සහ ඉගෙනීම වැඩිදියුණු කරයි. තවද අධ්‍යාපනය හැර යාම අවම කරමින්, ශ්‍රම බලකායේ කාර්ය සාධනය සහ වේතන අනුපාත වැඩි ද කරයි. මෙමගින් ඉදිරි පරම්පරාවල අතර දරිද්‍රතාවය ද අඩු කරයි.

2 ZERO HUNGER

**අභිමතාර්ථ 2. කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සාක්ෂාත් කර ගැනීම සහ පෝෂණය වැඩි දියුණු කිරීම.**

**ඉලක්කය 2.2: 20230 වන විට, වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ කුරු භාවය සහ කෘශ භාවය පිළිබඳ ජාත්‍යන්තරව එකඟ වූ ඉලක්කය සපුරා ගැනීම සහ සියලු ආකාරයේ මන්දපෝෂණය තුරන් කිරීම.**

මුල් ළමාවියේ දී පෝෂ්‍යදායී සහ ආරක්ෂිත ආහාර වේල්, අත්‍යවශ්‍ය පෝෂණ සේවා සහ ධනාත්මක ආහාර පිළිවෙත්, උත්තේජනය සහ රැකවරණය තුළින් දරුවන්ට හොඳ පෝෂණය, වර්ධනය සහ සංවර්ධන ප්‍රතිලාභ ලැබේ.

3 GOOD HEALTH AND WELL-BEING

**අභිමතාර්ථ 3. සැමට සෞඛ්‍ය සම්පන්න ජීවිත සහතික කිරීම සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.**

**ඉලක්කය 3.2: 2030 වන විට, අලුත උපන් බිළිඳුන්ගේ සහ අවුරුදු 5 ට අඩු දරුවන්ගේ වළක්වා ගත හැකි මරණ අඩු කිරීම, සියලුම රටවල් නවජ මරණ සජීවී උපත් 1,000 කට 12 ක් වැනි අවම මට්ටමකට සහ අවුරුදු 5 ට අඩු මරණ සජීවී උපත් 1,000 කට 25 ක් වැනි අවම මට්ටමකට අඩු කිරීම.**

රෝගවලින් ආරක්ෂා කරන ලද දරුවන් මියයාමට, මන්දපෝෂණයෙන් පෙළීමට හෝ සංජානන දුර්වලතා ඇතිවීමට ප්‍රවණතාවය අඩු වෙයි.

4 QUALITY EDUCATION

**අභිමතාර්ථ 4. සැමට අද්විතීය සහ සාධාරණ සමානාත්මතාවයෙන් යුත් අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.**

**ඉලක්කය 4.2: 2030 වන විට, සියලුම පිරිමි ළමයින්ට සහ ගැහැණු ළමයින්ට ගුණාත්මක ළමා සංවර්ධනය, රැකවරණය සහ ප්‍රාථමික අධ්‍යාපනයට අවශ්‍ය වන පූර්ව ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීම.**

පාසල් සාර්ථකත්වය සහ අනාගත ඵලදායිතාව සඳහා අඩිතාලම සැපයීම පිණිස මොළයේ සංවර්ධනය, මුල් කාලීන ඉගෙනීම් කටයුතු (සමාජ-චිත්තවේගීය ඉගෙනීම ඇතුළුව) සහ පාසල් සූදානම ප්‍රවර්ධනය කිරීම සඳහා මැදිහත්වීම.

5 GENDER EQUALITY

**අභිමතාර්ථ 5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමයින් බලගැන්වීම**

**ඉලක්කය 5.4: රාජ්‍ය සේවා, යටිතල පහසුකම් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සැපයීම තුළින් පවුල තුළ හවුල් වගකීම සුදුසු ලෙස ප්‍රවර්ධනය කිරීම හරහා වේතන රහිත රැකවරණ සේවය සහ ගෘහ සේවය හඳුනාගෙන එවා ඇගයීමට ලක් කිරීම.**

පවුල් හිතකාමී ප්‍රතිපත්ති සහ දැරිය හැකි මිලකට ළමා රැකවරණ සේවා සැපයීමට ආයෝජනය කිරීම තුළින්, කාන්තාවන් සඳහා වැඩි අවස්ථාවන් ලබා දීමට සහ ළමයින් සඳහා යහපත් ප්‍රතිඵල ගෙන දීමට හැකි වෙයි.

6 CLEAN WATER AND SANITATION

**අභිමතාර්ථ 6. සැමට ජලය සහ සනීපාරක්ෂාව ලැබීම සහ තිරසාර කළමනාකරණය සහතික කිරීම.**

**ඉලක්කය 6.1: 2030 වන විට, සැමට ආරක්ෂිත සහ දැරිය හැකි පානීය ජලය සඳහා ගෝලීය හා සමාන ප්‍රවේශයක් ලබා දීම.**

**ඉලක්කය 6.2: 2030 වන විට, සැමට ප්‍රමාණවත් සහ සාධාරණ සනීපාරක්ෂාව සහ සුවස්ත සඳහා ප්‍රවේශය ලබා දීම.**

නිවසේ සහ අනෙකුත් ස්ථාන තුළ පිරිසිදු හා ආරක්ෂිත ජලය, ප්‍රමාණවත් සනීපාරක්ෂක සහ සුවස්ත පරිසරයන් තිබීම කුඩා දරුවන්ගේ ප්‍රශස්ත වර්ධනය හා සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ.

13 CLIMATE ACTION

**අභිමතාර්ථය 13. දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව මුහුණ දීම සඳහා හදිසි පියවර ගැනීම.**

**ඉලක්කය 13.1: සියලුම රටවල දේශගුණ ආශ්‍රිත උපද්‍රව සහ ස්වාභාවික විපත් වලට ඔරොත්තු දීමේ ශක්තිය සහ අනුවර්තනය වීමේ ධාරිතාව ශක්තිමත් කිරීම.**

මුල් ළමාවිය සඳහා කරනු ලබන ආයෝජන දරුවන්ගේ සහ පවුල්වල ඔරොත්තු දීමේ ශක්තිය වැඩි කරන අතර දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීමේ හැකියාව සඳහා ද දායක වේ. එම ආයෝජන දේශගුණික විපර්යාස අසමානතාවයන් සමකිරීමට පවා උපකාරී වේ.

16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

**අභිමතාර්ථ 16. තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ අද්විතීය සමාජයන් ප්‍රවර්ධනය කිරීම.**

**ඉලක්කය 16.2: ළමයින්ට එරෙහි සියලු ආකාරයේ අපයෝජනය, සූරාකෑම, ජාවාරම සහ හිංසනය තුරන් කිරීම.**

ළමයින්ට එරෙහිව සිදුකරනු ලබන අපයෝජන සහ හිංසාවන් තුරන් කිරීම සඳහා මැදිහත්වීම මුල් ළමාවිය සංවර්ධනය වැඩිදියුණු කර, ප්‍රජාවන් තුළ වැඩි සමාජ සහජීවනයකට මග පාදයි.

රූපය 1.2: තිරසාර සංවර්ධන ඉලක්ක සහ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධන ඉලක්ක අතර සම්බන්ධය

## 1.1 ජීවන චක්‍රය හරහා මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන ක්‍රියා මාර්ග බල ගැන්වීම




රූපය 1.3: සාර සර්වරැකවරණ රාමුව
මූලාශ්‍රය: nurturing-care.org

ජීවිත කාලය පුරා අප අත්පත් කර ගන්නා නිපුණතා හා හැකියාවන් සඳහා විවිධ බාහිර සාධක බලපාන අතර මෙම බලපෑම මුල් ළමා වියේදී වඩාත් වැදගත් වන බව පෙර පැහැදිලි කරන ලදී. "සාර සර්ව රැකවරණ රාමුව (Nurturing care framework)" යන සංකල්පය තුළ **යහපත් සෞඛ්‍යය, ප්‍රමාණවත් පෝෂණය, ආරක්ෂාව, මුල් ඉගෙනීමේ අවස්ථා සහ ප්‍රතිචාරාත්මක රැකවරණය** යන සාධක ප්‍රශස්ත කිරීමට ප්‍රජාවන්ට සහ රැකබලා ගන්නන්ට හැකි වන පරිදි පොදු ප්‍රතිපත්ති, වැඩසටහන් සහ සේවාවන් රාමුගත වී තිබීම අදහස් වෙයි. මෙම 'සාර සර්ව රැකවරණ රාමුව'[4] (යොමුව: රූපය 1.3) ජීවිතයේ පළමු වසර 3 තුළ මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධන මැදිහත්වීම් සඳහා මාර්ග සිතියම සපයයි. මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ 2016 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද Lancet[5] නිර්දේශ මාලාවේ, ඉහත අංශ පහ යටතේ ළමා සංවර්ධනය සඳහා සැලකිය යුතු ප්‍රතිලාභ ඇති බව පෙන්වා දෙන එවැනි විවිධ මැදිහත්වීම් සාරාංශ කර පැකේජවලට සංවිධානය කර ඇත. ගෝලීය වශයෙන් ද මෙම සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධන ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සඳහා පදනම සකසා ඇත (යොමුව: රූපය 1.4). එබැවින්, මෙම ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (NMSAP) සඳහා පදනම් කරගෙන ඇත්තේද එම සාධනීය මැදිහත්වීම් ය. එවැනි මැදිහත්වීම් සඳහා උදාහරණ ලෙස මාපිය ආධාර වැඩසටහන්, ජලය, සහ සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම, මාතෘ සෞඛ්‍ය රැකවරණය සහ මුල් ඉගෙනුම් සහාය සැලකිය හැකිය.

## 1.2 මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධන මැදිහත්වීම් සඳහා බහුආංශික සහභාගීත්වය

මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධන මැදිහත්වීම් ඉහළ නැංවීම සඳහා දේශපාලන ප්‍රමුඛතාවය, නීති සම්පාදනය, ප්‍රතිපත්ති, පවතින සේවා පද්ධති භාවිතය සහ මූල්‍යකරණයේ වැදගත්කම සාක්ෂි මගින් විදහා දක්වයි.

සාර්ථකව ක්‍රියාවට නංවන ලද මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධන වැඩසටහන්හි බොහෝ විට ළමයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා විධිමත් ලෙස ස්ථාපිත කල, රජය මගින් බර පැන දරන ඒකාබද්ධ හා පූර්ණ සහාය සේවා වැඩපිළිවෙලක් ඇත. අනෙකුත් දෙපාර්තමේන්තු සහ සිවිල් සමාජ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කරන රජයේ දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් විසින් මැදිහත්වීම් මෙහෙයවනු ලැබීමද සාර්ථකත්වයට මහත් රුකුලක් බව තහවුරු වී ඇත.

ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධන ප්‍රතිපත්තිය සහ මෙම ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම ඉහත පාර්ශ්වයයන් සාර්ථකව හා කාර්යක්ෂමව සහභාගී කර ගැනීමේ අරමුණින් සකස් කර ඇත.

රූපය 1.4: ECCD සඳහා ඒකාබද්ධ සහයෝගිතා ජාලය
මූලාශ්‍රය: nurturing-care.org




4 ලෝක සෞඛ්‍ය සංවිධානය, ලෝක බැංකු සමූහය සහ UNICEF (2018). මුල් ළමාවිය සංවර්ධනය සඳහා රැකවරණය https://nurturing-care.org/nurturing-care-framework-executive-summary

5 Lancet ප්‍රකාශන මාලාව (ඔක්. 2016). මුල් ළමාවිය සංවර්ධනය: විද්‍යාවේ සිට පරිමාණය දක්වා https://www.thelancet.com/series/ECD2016




රූපය 1.5: සාක්ෂිමත පදනම් වූ ECCD මැදිහත්වීම්
මූලාශ්‍රය: Lancet Series Paper ECD 2-2016

## 1.3 මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා වූ ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ සන්දර්භය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව, ජනගහනය පුද්ගලයන් 1000කට 12.4 ක් වන දළ උපත් අනුපාතයක්[6] සමඟින් 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 22.18 ක් විය. 2022 වර්ෂයේදී 'රැකවරණය යටතේ සිටින අවුරුදු 5ට අඩු ළමයින්' සංඛ්‍යාව මිලියන 1.48 ක් බව පවුල් සෞඛ්‍ය කාර්යාංශය වාර්තා කර ඇත[7]. ශ්‍රී ලාංකීය දරුවන්ගේ සමස්ත සෞඛ්‍ය දත්ත ඉහළ ආර්ථික මට්ටමක් ඇති රටවල් සමඟ බොහෝ දුරට සමගාමීව පවතී. තවද ළදරු මරණ අනුපාතය සජීවී උපත් 1000කට 10.1 ක් වේ. අවුරුදු 1-5 අතර ළමා මරණ අනුපාතය සජීවී උපත් 1000කට 1.9ක් වේ. පවුල් සෞඛ්‍ය කාර්යාංශය මීට අමතරව මුල් ළමාවිය සංවර්ධන දර්ශකයක් (ECDI, 2030) හඳුන්වා දීමට කටයුතු කරමින් පවතින අතර මෙය ලෝකයේ අනිත් රටවලද මාස 24-59 අතර සංවර්ධන ඉලක්ක කරා ළඟා වී ඇති දරුවන්ගේ ප්‍රතිශතය වාර්තා කිරීමට භාවිතා වේ.

පිළිසිඳගැනීමේ සිට පාසල් ප්‍රවේශය දක්වා (අවුරුදු 0-5) සියලුම දරුවන්ට සංවර්ධනයේ උපරිම විභවයන් කරා ළඟා වීමට උපකාර වන පරිසරයක් නිර්මාණය කිරීමට සහාය වීම සහතික කිරීම සඳහා 2004 වර්ෂයේදී ශ්‍රී ලංකාව ප්‍රථම වරට මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය (ECCD) සඳහා ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. 2018 වර්ෂයේ දී යාවත්කාලීන කරන ලද ජාතික ප්‍රතිපත්තියෙන් මේ සඳහා වූ රජයේ කැපවීම යළි තහවුරු කරන ලදී. මෙම ප්‍රතිපත්තිය[8] මගින් මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධන සේවාවන් අර්ථ දක්වා ඇත්තේ, මුල් ළමාවියේ දරුවන්ට සෞඛ්‍ය, පෝෂණය, අධ්‍යාපනය, සමාජ සේවා, රැකවරණය සහ ආරක්ෂාව ලබා දීමට අදාළ අත්‍යවශ්‍ය සහායන් ලෙසටයි. මෙහි දක්වා ඇති පරිදි පිළිසිඳ ගැනීමේ සිට විධිමත් පාසලක පළමු ශ්‍රේණියට ඇතුළත් වන වයස දක්වා සියලුම දරුවන් කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර අවදානම් හා අවාසි සහගත තත්ත්වවලට ලක්වූ දරුවන් ගැන වැඩි අවධානයක් දැක්විය යුතු බවද සඳහන් වේ.

මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සම්බන්ධ සේවා සැපයීම වඩාත් ප්‍රශස්ත කිරීම සඳහා සියලුම සේවා (සෞඛ්‍යය, පෝෂණය, අධ්‍යාපනය, සමාජ සේවා, රැකවරණය සහ ආරක්ෂාව, ආබාධිතයන් සඳහා වූ පහසුකම්, ආයෝජන) සහ එම සේවා සපයන විවිධ අංශ (රාජ්‍ය, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGOs), දේශීය රාජ්‍ය නොවන සංවිධාන (NGOs) සහ පුද්ගලික අංශයේ සංවිධාන ඒකාබද්ධ කිරීම හරහා බහුආංශික ප්‍රවේශයක් ඇති කිරීම මෙම ප්‍රතිපත්තියේ අරමුණ වේ.

මෙම යාන්ත්‍රණය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා මූලික රාජ්‍ය ආයතනයක්, ප්‍රතිපත්තිය තුළ හඳුනාගෙන ඇත. එය කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වේ. අනෙකුත් අදාළ ප්‍රධාන මධ්‍යම රජයේ අමාත්‍යාංශ, පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සහ රාජ්‍ය නොවන මුල් ළමාවියේ දරුවන් සමඟ සම්බන්ධ ආයතන එයට සහාය දක්වනු ලැබේ.

වත්මන් පරිපාලන ව්‍යුහය අනුව, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා ළමා කටයුතු විෂයභාර කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය තුළ ස්ථාපනය කර ඇති කේන්ද්‍රස්ථානය මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය (NSECD) වේ.

සෑම තැනකම ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති, වැඩසටහන් සහ භාවිතයන්ගෙන් සියලුම දරුවන්ට ප්‍රතිලාභ ලබා දීම මෙම බහුආංශික ප්‍රවේශය මගින් සහතික කරනු ඇත. මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව (NCC) මෙම ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා පිහිටුවා ඇත.

මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා ඉහත ප්‍රතිපත්තිය තුල පිහිටා බහුආංශික ක්‍රියාමාර්ග සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වූ මෙවලමක දිගුකාලීන අවශ්‍යතාවයක් පැවතිණි. ඒ සඳහා, ප්‍රතිපත්තියේ දක්වා ඇති අරමුණු සහ ප්‍රධාන ක්‍රියාකාරී අංශ මත පදනම්ව මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

---

6 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2023). http://www.statistics.gov.lk/Population/StaticalInformation/VitalStatistics
7 පවුල් සෞඛ්‍ය කාර්යාංශය (2022). නවතම සංඛ්‍යාලේඛන. https://fhb.health.gov.lk/
8 කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය (2018) මුල් ළමාවිය රැකවරණය සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය.

## 1.4 දැක්ම, මෙහෙවර සහ අරමුණු-මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය - 2018

### දැක්ම

ප්‍රශස්ත සංවර්ධනය සඳහා සෑම ළමයකුට ම ඇති අයිතිය සහතික කෙරෙන පරසරයක්.

### මෙහෙවර

පුළුල් හා සමෝධානිත මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවා පද්ධතියක මනා සහාය ලබමින් නිවස හා වෙනත් ස්ථාන වලින් සැපයෙන සුරක්ෂිත රැකවරණයකින් යුතු හිතකර පරිසරයක් තුළ ශ්‍රී ලංකාවේ මුල් ළමා වියේ වෙසෙන සියලු ම ළමයින්ගේ ප්‍රශස්ත දිවි පැවැත්ම වර්ධනය සහ සංවර්ධනය.

### ප්‍රතිපත්තියේ අරමුණු

1. අතිශයින් අවදානමට ලක් විය හැකි හා අවාසිදායක තත්ත්වයේ වෙසෙන ළමයින් ඇතුළු සියලුම මුල් ළමා වියේ පසුවන ළමයින්ගේ ජීවත්වීම, පැවැත්ම සහ සංවර්ධනය ප්‍රවර්ධනය කෙරෙන ගුණාත්මක මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවා සදහා සාධාරණ ප්‍රවේශයක් තහවුරු කරමින් ඉතාමත් යහපත් ජීවිතයක ආරම්භය සහතික කිරීම.
2. ළමයින් හදා වඩා ගැනීමේ දී සිය වගකීම සහ කාර්ය භාරය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සදහා දෙමව්පියන්, පවුල සහ ප්‍රජාව බල ගැන්වීම සහ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවා සහ වැඩසටහන් සදහා ඔවුන්ගේ ප්‍රශස්ත සහභාගීත්වය ලබා ගැනීම.
3. මූල්‍ය හා මානව සම්පත් එක් රැස් කර යෙදවීම, සාධාරණ ලෙස පැවරීම හා කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සහතික කිරීමෙන් අතිශයින් අවදානමට ලක් විය හැකි සහ අවාසිදායක තත්ත්වයේ පසු වන ළමයින්ට සැපයෙන සේවා ඇතුළු මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට සැපයෙන සියලු ම සේවා සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
4. ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, නියාමනය සහ ඇගයීම සඳහා කළමනාකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
5. දත්ත පදනම් කර ගනිමින් තීරණ ගැනීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි පර්යේෂණ දිරි ගැන්වීම.

### ක්‍රියාකාරී අංශ සහ උපායමාර්ග

ඉහත ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගෙන ඇති උපාය මාර්ග ප්‍රධාන ක්‍රියාකාරී අංශ පහක් යටතේ පෙළ ගස්වා ඇත. (යොමුව: රූපය 1.6). එයට අමතරව පොදුවේ සියලු මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වූ උපාය මාර්ගික ක්‍රියාකාරකම්ද මෙම ක්‍රියාකාරී සැලැස්ම තුළ හඳුනාගෙන ඇත.




රූපය 1.6: මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය-2018 හි ප්‍රධාන ක්‍රියාකාරී අංශ

මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා වූ 2018 ජාතික ප්‍රතිපත්තියේ හඳුනාගෙන ඇති ප්‍රධාන ක්‍රියාකාරී අංශ,'සාර සර්ව රැකවරණ රාමුව'[9,10] සහ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ හොඳින් ගැලපීම මඟින් එහි ගෝලීය වලංගුභාවය ඉස්මතු කරයි. තවද ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා බහු ආංශික මැදිහත්වීමට මාර්ගෝපදේශ ද සපයයි.

මුල් ළමාවිය  රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2018 හි හඳුනාගෙන ඇති උපායමාර්ග යටතේ ඉදිරි වසර පහ තුළ සිදු කළ යුතු ක්‍රියාකාරකම් හඳුනාගැනීම සඳහා මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික බහු ආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (NMSAP) ECCD) 2026-2030 සකස් කර ඇත. මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී සහ ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛත්වය දීමේදී රටේ අවදානමට ලක්විය හැකි ආර්ථික තත්ත්වය සහ කොවිඩ්-19 වසංගතයේ බලපෑම පිළිබඳව වැඩි දුරටත් සලකා බලන ලදී.

මෙම සැලස්ම මගින් මුල් ළමාවිය අධ්‍යාපනය (ECE) සඳහා ළමයින් ඇතුළත් වීම් අඩුවීම, මානව සම්පත් සීමාවීම, යෝජිත ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාමුව තුළ (NERF 2023-2028) මුල් ළමාවිය අධ්‍යාපන ක්‍රමයේ හා මූල්‍ය කරණයේ වෙනස් වීම වැනි විවිධ අභියෝගයන් වලට ඉදිරි වර්ෂවල මුහුණ දීම සඳහා අවශ්‍ය බල ගැන්වීම් කර ඇත. ඒබැවින් මෙහි 2 වන කොටසෙහි විස්තර කර ඇති පරිදි සංවර්ධන සැලසුමෙහි මධ්‍යම මෙන්ම පළාත් පාලන සහ ප්‍රාදේශීය මට්ටම්වලින් යුත් ප්‍රබල සහභාගීත්ව ප්‍රවේශයක් අනුගමනය කරන ලදී.

වගුව 1.1: මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය ප්‍රතිපත්තියේ ගෝලීය නිර්දේශ සහ ඉලක්ක සමඟ සේවා ඒකාබද්ධ කිරීම සහ පෙළගැස්වීම

| **ප්‍රතිඵලය** | **මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය** | | | | |
|---|---|---|---|---|---|
| **ECCD ප්‍රතිපත්තියේ ප්‍රධාන ක්‍රියාකාරී අංශ** | **සෞඛ්‍යය සහ පෝෂණය** | **මුල් ළමාවිය අධ්‍යාපනය** | **රැකවරණය සහ ආරක්ෂාව** | **දෙමාපියන්, පවුල, ප්‍රජාව** | **මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා ආයෝජනය** |
| **සාර සර්ව රැකවරණ රාමුව** | මනා සෞඛ්‍යය ප්‍රමාණවත් පෝෂණය | මුල් අධ්‍යාපනය සඳහා අවස්ථාවන් | සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව | ප්‍රතිචාරාත්මක රැකවරණ ලබාදීම | |
| **අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs)** | 2 ZERO HUNGER; 3 GOOD HEALTH AND WELL-BEING; 4 QUALITY EDUCATION | 4 QUALITY EDUCATION | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS | 5 GENDER EQUALITY | 1 NO POVERTY; 13 CLIMATE ACTION |

සටහන: මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2018, ළමා අයිතිවාසිකම් සම්මුතිය (CRC) අනුව, මෙම ක්‍රියාකාරී සැලැස්මේ අරමුණ සඳහා වඩාත්ම අවදානමට ලක්විය හැකි සහ ප්‍රතිලාභ අහිමිදරුවන් පහත පරිදි අර්ථ දක්වා ඇත.

අනාථ දරුවන්, අපයෝජනයට ලක් වූ සහ නොසලකා හරින ලද දරුවන්, පවුල් නොමැති දරුවන්, සරණාගතයින්, ආබාධ සහිත දරුවන්, හානිකර රැකියාවල නිරත දරුවන්, මත්ද්‍රව්‍ය අනිසි භාවිතය, ලිංගික අපයෝජන සහ සූරාකෑමට ලක් වූ දරුවන්, විකිටම, ජාවාරම් සහ පැහැරගැනීම්වලට ලක් වූ දරුවන්, වීථි දරුවන් සහ අන්ත දරිද්‍රතාවයේ ජීවත් වන දරුවන් බොහෝ අවදානම් සහ ප්‍රතිලාභ අහිමි දරුවන් කාණ්ඩයට ඇතුළත් වේ. තවද තම මව්වරුන් සමඟ සිරගෙවල්වල ජීවත් වන මුල් ළමාවියේ දරුවන් ද මෙම කාණ්ඩයට අයත් වේ.

9 ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය, සාමාන්‍ය අදහස් අංක 7, (2005). ළමා අයිතීන් ක්‍රියාත්මක කිරීම

10 ලෝක සෞඛ්‍ය සංවිධානය, ලෝක බැංකු සමූහය සහ UNICEF (2018). මුල් ළමාවිය සංවර්ධනය සඳහා පෝෂණ රැකවරණය https://nurturing-care.org/nurturing-care-framework-executive-summary

# 02

# මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම NMSAP-ECCD (2026-2030) සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය

මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය-2018 ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සිතියමක් ලෙස ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම ප්‍රතිපත්ති ලේඛනයේම අත්‍යවශ්‍ය කාරණයක් ලෙස දක්වා ඇත.

ඒ අනුව මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වසර 5ක බහු ආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට තීරණය කරන ලදී. එක් එක් ප්‍රධාන ක්‍රියාකාරී අංශය යටතේ මුල් ළමාවිය රැකවරණය සංවර්ධන ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සිදු කළ යුතු ක්‍රියාමාර්ග හඳුනා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ප්‍රධාන ක්‍රියාකාරී අංශ යටතේ අනුගමනය කළ යුතු උපාය මාර්ග ප්‍රතිපත්ති, ලේඛනය තුළ දැනටමත් හඳුනාගෙන ඇත.

අදාළ නියෝජිතායතන විසින් එක් එක් උපායමාර්ගය යටතේ කළ යුතු ක්‍රියාකාරකම් සහ උප ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා බහු ආංශික සහභාගීත්ව ක්‍රියාවලියක් වූ සැලැස්ම සංවර්ධනය කිරීමේදී පහත පියවර අනුගමනය කරන ලදී. මෙලෙස හඳුනාගත් සමහර ක්‍රියාකාරකම් දැනටමත් හොඳින් ක්‍රියාත්මක වෙමින් පවතී. තවද ඇතැම් ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය වූ අතර, වෙනත් ක්‍රියාකාරකම් අලුතින් ද යෝජනා කරන ලදී. මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධන ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ දැක්මෙහි සඳහන් කර ඇති පරිදි සෑම දරුවෙකුටම ප්‍රශස්ත සංවර්ධනයක් සඳහා ඇති අයිතිය සහතික කෙරෙන සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය බව මෙම සියලු ක්‍රියාමාර්ග මඟින් සාමූහිකව හඳුනාගෙන ඇත. එබැවින් අදාළ අධිකාරිය විසින් මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ.

## 1. තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම ස්ථාපිත කිරීම (TWG)

ක්‍රියාවලියේ පළමු පියවර ලෙස මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධන සේවා සැපයීමට සම්බන්ධ ප්‍රධාන සංවිධානවල කේන්ද්‍රස්ථාන නියෝජනය කරන තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කරන ලදී. මෙහි සංයුතිය පිටුව 4 හි දක්වා ඇත. සැලසුම් කිරීමේ ඊළඟ පියවරවලදී උපදෙස් ලබා ගැනීම සඳහා පසුව තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම විසින් ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය රැ කවරණ සහ සංවර්ධන සේවා සැපයීම සම්බන්ධ පාර්ශවකරුවන්ගේ සවිස්තරාත්මක ලැයිස්තුවක් හඳුනාගන්නා ලදී.

මුල් ළමාවිය රැකවරණ සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ උපායමාර්ග යටතේ පවතින සහ යෝජිත ක්‍රියාකාරකම් සැලසුම් සිතියම්ගත කිරීම ඊළඟ කාර්යය විය. ප්‍රතිපත්තිය මඟින් දැනටමත් ප්‍රධාන ක්‍රියාකාරී අංශ පහක් යටතේ සහ සමස්ත සේවාව වැඩිදියුණු කිරීමේ තේමාව යටතේ උපාය මාර්ග ලැයිස්තුගත කර ඇත. එබැවින් මෙම රාමුව මත පදනම්ව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට එකඟ විය. ඒ අනුව දත්ත රැස් කිරීමේ මෙවලම් සකස් කරන ලදී.

## 2. එක් එක් ප්‍රධාන ක්‍රියාකාරී අංශය යටතේ ඇති හිදැස් සහ ක්‍රියාමාර්ග හඳුනාගැනීම සඳහා දෙදින බහුආංශික වැඩමුළුව

රාජ්‍ය (ජාතික සහ පළාත් මට්ටමේ), රාජ්‍ය නොවන, පෞද්ගලික අංශයේ, ශාස්ත්‍රීය හා වෘත්තීය සංවිධානවල පුළුල් කණ්ඩායමක් ක්‍රියාකාරකම්, ක්‍රියාකාරකම් සිදු කිරීමට වගකිව යුතු ආයතන, ප්‍රමුඛතා තත්ත්වය මෙන්ම ඇගයීම් නිර්ණායක හඳුනාගැනීම සඳහා දෙදින වැඩමුළුවකදී කණ්ඩායම් වශයෙන් එක්ව කටයුතු කරන ලදී. මෙම වැඩමුළුවට සහභාගී වූ සංවිධාන පිළිබඳ විස්තර ඇමුණුම 1හි දක්වා ඇත.

## 3. ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවීම

පාර්ශ්වකරුවන් ප්‍රධාන ක්‍රියාකාරී අංශ වලට කණ්ඩායම් ගත කරන ලදී. එක් එක් ප්‍රධාන අංශ යටතේ ක්‍රියාකාරකම් සම්පූර්ණ වන තෙක් අඛණ්ඩ සන්නිවේදනය මාර්ග ගත ක්‍රමය ඔස්සේ සිදු කරන ලදී.

## 4. ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (FGDs) සහ ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ සාකච්ඡා (KIIs)

ක්‍රියාකාරී අංශ කිහිපයකටම අදාළවන පාර්ශ්වකරුවන් සමඟ වෙනම කණ්ඩායම් සාකච්ඡා (සිවිල් සමාජ සංවිධාන හවුල්කරුවන් (ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා පාදක සංවිධාන), මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලෙය් කාර්ය මණ්ඩලය, UNICEF තාක්ෂණික කාර්ය මණ්ඩලය, පළාත් මුල් ළමාවිය අධ්‍යාපන ඒකක) ලෙස හෝ අදාළ ප්‍රධාන තොරතුරු සපයන්නන් සමග හඳුනාගත් ක්‍රියාකාරී ක්ෂේත්‍ර පිළබඳව විස්තරාත්මකව සාකච්ඡා කරන ලදී.

## 5. වට මේස සමාලෝචනය-ප්‍රතිපත්ති, උපායමාර්ග සහ සම්පත් මෙවලම් සිතියම්ගත කිරීම

මෙම ක්‍රියාකාරී සැලැස්ම මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධ වෙනත් ආයතනවල ප්‍රතිපත්ති, උපාය මාර්ගික සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් සමඟ ද්විත්වකරණය වැළැක්වීම හා සුසංයෝගය පවත්වාගැනීම පිණිස පුළුල් වට මේස සමාලෝචනයක් පවත්වන ලදී. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවා සැපයීම සම්බන්ධ සම්පත් මෙවලම් රැස්කිරීම පිණිස මෙම ක්‍රම වේදයම ව්‍යාප්ත කරන ලදී.

## 6. දත්ත ඒකාබද්ධ කිරීම සහ ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීම

ඉහත ක්‍රම මඟින් රැස්කර ගත් තොරතුරු ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය සහ UNICEF හි තාක්ෂණික කාර්ය මණ්ඩලය සමඟ හාෂාත්‍රයෙන් ම වැඩමුළු මාලාවක් පවත්වන ලදී.

## 7. කෙටුම්පත් කළ ක්‍රියාකාරී සැලැස්මේ වලංගු කිරීම තහවුරු කිරීම

**1 වන වටය:** කෙටුම්පත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම වලංගු කිරීම තහවුරු කිරීමේ වැඩමුළුවට ප්‍රථම තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයින් අතර බෙදා හරින ලදී. අර්ධ දින වැඩමුළුවකදී වලංගු කිරීමේ පළමු වට සමාලෝචනය පවත්වන ලදී. මෙලෙස ඉදිරිපත් කරන ලද අදහස් ඇතුළත් කර යාවත්කාලීන කරන ලද සංස්කරණය දෙවන වට සමාලෝචනයේ දී වලංගු කිරීම තහවුරු කිරීම සඳහා අනෙකුත් පාර්ශ්වකරුවන් අතර බෙදා හරින ලදී.

**2 වන වටය:** ජාතික සහ පළාත් මට්ටමින් සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් එක් දින වැඩමුළුවකදී වලංගු කිරීම තහවුරු කිරීම සඳහා දෙවන වට සමාලෝචනය පවත්වන ලදී. කාල සීමාවක් තුළ, පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ ආයතනවලින් ප්‍රතිපෝෂණ ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී.

## 8. මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම - 2026-2030 - අවසාන සංස්කරණය

අවසාන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන ක්‍රියාකාරී අංශ 6ක් යටතේ ඉදිරිපත් කෙරේ. එක් එක් ක්‍රියාකාරකම සිදු කිරීම සඳහා වගකිව යුතු ආයතන (ප්‍රාථමික සහ ද්විතීයික) සහ එම ක්‍රියාකාරකම් සිදු කළ යුතු කාල රාමුව එයට ඇතුළත් වේ. තවද, ක්‍රියාවන් සිදුවෙමින් පවතින බව සහතික කිරීම සඳහා ක්‍රියාවලීන් පිළිබඳ දර්ශක හඳුනාගෙන ඒවා ක්‍රියාකාරී සැලැස්මට සත්‍යාපනය කිරීමේ ක්‍රම සමඟ ඇතුළත් කර ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක දර්ශකවලට අනුකූලව තෝරාගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහිත අධීක්ෂණ සහ ඇගයීම් රාමුවක් ද මෙම ලේඛනයේ අඩංගු වේ.

## NMSAP – ECCD – 2026-2030 සකස්කිරීමේ ක්‍රියාවලිය






රූපය 2.1: NMSAP-ECCD සංවර්ධනයේ ක්‍රියාවලිය
මූලශ්‍රය: Lancet Series Paper ECD 2-2016

03

# මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික බහු ආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම

## NMSAP-ECCD (2026-2030)

## උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 01:

# සෞඛ්‍යය සහ පෝෂණය

**සුවිශේෂී අරමුණ:**
**අතිශයින් අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්ත්වයේ වෙසෙන ළමයින් ඇතුළු ව සියලූ ම මුල් ළමාවියේ පසුවන ළමයින්ට යහපත් සෞඛ්‍ය සහ පෝෂණ සේවාවාන්ට ප්‍රවිෂ්ට වීමට සමාන හා සාධාරණ අවස්ථා ලබා දීම.**

## මූලික විශ්ලේෂණය

2018 මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ විෂය පථය දරුවා පිළිසිඳගැනීමේ සිට ප්‍රාථමික පාසලට ඇතුළත් වීමේ වයස දක්වා විහිදේ. එබැවින් ගැබිණි මව්වරුන් මෙන්ම අවුරුදු 5ට අඩු දරුවන් ආවරණය වන පරිදි සෞඛ්‍ය හා පෝෂණය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික ක්‍රියාමාර්ග සැලසුම් කරන ලදී. ශ්‍රී ලංකාවේ 2022 වසරේ වාර්තා වූ උපත් සංඛ්‍යාව 275,321 ක් වන අතර ක්ෂේත්‍ර මාතෘ හා ළමා සෞඛ්‍ය අංශ රැකවරණය යටතේ සිටින වයස අවුරුදු 5 ට අඩු ළමුන් සංඛ්‍යාව 1,406,157[11] ක් ලෙස වාර්තා වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය (MoH) විසින් ක්‍රියාත්මක කරනු ලබන 'පූර්ණ ප්‍රජනක, මාතෘ, අලූත උපන්, ළමා, නව යොවුන් වියේ සහ තරුණ සෞඛ්‍ය' වැඩසටහනක් ශ්‍රී ලංකාවේ තිබේ. එය වසර ගණනාවක් පුරා සෞඛ්‍ය සහ පෝෂණ සේවා සැපයීමේ අතිවිශාල ප්‍රගතියක් ලබා ගැනීමට ඉවහල් විය. එබැවින්, ජාතික මාතෘ හා ළමා සෞඛ්‍ය ප්‍රතිපත්තිය[12] සහ ජාතික පෝෂණ ප්‍රතිපත්තිය 2021-2030[13] මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ සෞඛ්‍ය සහ පෝෂණ ක්‍රියාකාරී අංශය ක්‍රියාත්මක කිරීම සඳහා විශාල වශයෙන් සහාය දක්වයි.

11 පවුල් සෞඛ්‍ය කාර්යාංශය (2022). නවතම සංඛ්‍යාලේඛන. https://fhb.health.gov.lk/
12 සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව (2012). ජාතික මාතෘ හා ළමා සෞඛ්‍ය ප්‍රතිපත්තිය. https://extranet.who.int/nutrition/gina/en/node/8226
13 සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව (2022). ජාතික පෝෂණ ප්‍රතිපත්තිය 2021-2030. https://nutrition.health.gov.lk/wp-content/uploads/2020/11/NNP-English.pdf

මේ වනවිට ශ්‍රී ලංකාවේ සියලුම උපත් (99%) පාහේ රෝහලක හෝ මාතෘ නිවාසයක සිදු වේ. එම උපත් සඳහා වෛද්‍යවරයකු හෝ පවුල් සෞඛ්‍ය නිලධාරිනියක (PHM) සහාය වේ. ඉන් 94% ක් රජයේ සෞඛ්‍ය මධ්‍යස්ථානයක සිදු වේ[14]. ආර්ථික අර්බුදය මධ්‍යයේ මෙම සේවාවන් සැපයීම සඳහා සහය වන ක්‍රියාකාරකම් හඳුනාගැනීමේ අභියෝගය නව NMSAP-ECCD ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත වේ.

තවද, ශ්‍රී ලංකාව එහි දළ දේශීය නිෂ්පාදිතයට (GDP) සාපේක්ෂව සමස්ත නවජ, ළදරු සහ කුඩා දරුවන්ගේ මරණ අනුපාතය ඉතා අඩු මට්ටමක පවත්වා ගෙන යයි. 2022 වසර සඳහා නවජ, ළදරු සහ අවුරුදු 5ට අඩු මරණ අනුපාතිකය සජීවී උපත් 1000කට 4, 10 සහ 7 පරාසයක පවතී[15].

කෙසේවෙතත්, ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය හි අත්‍යවශ්‍ය අංගයක් වන දරුවන්ගේ පෝෂණ මට්ටම් ප්‍රශස්ත කිරීමයි. ශ්‍රී ලංකා වෛද්‍ය පර්යේෂණායතනයේ (MRI) නවතම සමීක්ෂණයට අනුව, මාස 6-59 ළමුන් අතර, අඩු බර, කෘශ සහ කුරු භාවයේ ව්‍යාප්තිය පිළිවෙලින් 22.7%, 19.5% සහ 13.7% තරම් ඉහළ මට්ටමක පවතී[16].

මාස 6-59 ළමුන් අතර මන්දපෝෂණය (කෘශ භාවය, කුරු භාවය, අඩු බර, අධික බර හෝ එක් තත්ත්වයකට වඩා) පැතිරීම, 69.2% ක් වැනි ඉහළ මට්ටමක පවතී. මෙම වයස් කාණ්ඩය තුළ 14.6% ක රක්තහීනතාවයේ ව්‍යාප්තියක්ද පවතී[17].

ප්‍රශස්ත පෝෂණය මුල් ළමාවියේ දී පූර්ණ හැකියාවන් කරා ළඟා වීමට අත්‍යවශ්‍ය අංගයක් වන බැවින් මෙම ක්‍රියාකාරී සැලැස්ම තුළ මෙම දුර්වලතා සමනය කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරකම් හඳුනා ගැනීම අත්‍යවශ්‍ය විය. ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ ලෝක ආහාර වැඩසටහන (FAO-WFP) විසින් නිකුත් කරන ලද '2023 භෝග සහ ආහාර සුරක්ෂිතතා ඇගයීම් මෙහෙවර වාර්තාවට'[18] අනුව ඇස්තමේන්තුගත ජනගහනයෙන් 17% ක් ආහාර අනාරක්ෂිත බවින් පීඩා විඳින බව පෙනී යයි. කෙසේවෙතත්, මෙය කුටුම්භවලින් 28% ක් ආහාර අනාරක්ෂිත ලෙස 2022 වසරේ වාර්තා වූ මට්ටමට වඩා පහළ මට්ටමක පවතී. ජනගහනයෙන් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක් තම පවුල් පෝෂණය කිරීම සඳහා මුදල් ණයට ගැනීම හෝ ඔවුන් වෙහෙස මහන්සි වී උපයාගත් ඉතුරුම් භාවිතයට ගැනීම වැනි ජීවනෝපාය පදනම් කරගත් අනුගත වීමේ ක්‍රමෝපායන් අනුගමනය කරමින් සිටී. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ දත්ත වලට අනුව, පෙරපාසල් ළමුන් 86,168 දෙනෙකුට දැන් පෙරපාසලෙන් ආහාර වේලක් ලැබේ. නමුත් එය සමස්ත පෙරපාසල් ජනගහනයෙන් 17.8%ක් පමණි[19]. එබැවින්, ඉදිරි වසර 5 තුළ සෞඛ්‍ය සහ පෝෂණ ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සමාජ ආධාර සහ බලගැන්වීම් ඉහළ නැංවීමේ අවශ්‍යතාවයක් පවතී.

---

14 පවුල් සෞඛ්‍ය කාර්යාංශය (2022). නවතම සංඛ්‍යාලේඛන. https://fhb.health.gov.lk/

15 UNICEF (2023). Early Childhood Development-UNICEF Vision for Every Child. https://www.unicef.org/reports/early-childhood-development-unicef-vision-every-child

16 වෛද්‍ය පර්යේෂණ ආයතනය (2022). ශ්‍රී ලංකාවේ ජාතික පෝෂණ හා ක්ෂුද්‍ර පෝෂක සමීක්ෂණය.

17 වෛද්‍ය පර්යේෂණ ආයතනය (2022). ශ්‍රී ලංකාවේ ජාතික පෝෂණ හා ක්ෂුද්‍ර පෝෂක සමීක්ෂණය.

18 ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ ලෝක ආහාර වැඩසටහන (2023) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත විශේෂ වාර්තාව FAO/WFP භෝග සහ ආහාර සුරක්ෂිතතා ඇගයීම් මෙහෙයුම (CFSAM) - 25 මැයි 2023 https://docs.wfp.org/api/documents/WFP-0000151993/download/?_ga=2.168281889.1864452308.1701162258-2111559015.1700372107

19 මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය (2022). පෙර පාසල් සංඛ්‍යාලේඛන.

**2026-2030 වසර සඳහා වන සමස්ත අංශයේ අයවැය | රු. මි 29, 267.3**

**උපායමාර්ගය 01**

සියලු ම මුල් ළමාවියේ පසුවන ළමයින්ට ක්ෂේත්‍රගත හා ආයතන ගත සෞඛ්‍ය සහ පෝෂණ සේවාවලට සාධාරණ ලෙස ප්‍රවිෂ්ට වීමට අවස්ථා ලබා දීම සහතික කිරීම පිණිස අදාළ ජාතික සහ පළාත් ආයතන ශක්තිමත් කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **1.1** අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්වයේ වෙසෙන ළමයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අවුරුදු 5 ට අඩු සියලුම දරුවන්ට ක්ෂේත්‍රගත මාතෘ සහ ළමා සෞඛ්‍ය රැකවරණ සේවා සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම | සියලුම දිස්ත්‍රික්කවල ක්ෂේත්‍රගත මාතෘ සහ ළමා සත්කාර සේවා තුළ 'සම්මත මුල් ළමා සුරැකුම් සහ සංවර්ධන පැකේජය' හඳුන්වා දීම සහ එහි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම | FHB | HPB, PDHS, RDHS, MOHs, MWSEID-PHDT, E&UH-MoH, | X | X | X | X | X | 3.5 Mn | ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයෙන් රැකවරණය යටතේ සිටින ළදරුවන්, වයස අවුරුදු 1-2 සහ වයස අවුරුදු 2-5 අතර % | MCH ප්‍රතිඵල FHB |
| | වයස අවුරුදු 5 ට අඩු ළමුන් සහ ඔවුන්ගේ මව්වරුන් ක්ෂේත්‍රගත මාතෘ සහ ළමා සෞඛ්‍ය රැකවරණ සේවා වෙත ප්‍රවේශය සහ භාවිතය පිළිබඳ ජාතික මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සමීක්ෂණය හරහා තොරතුරු ලබා ගැනීම | FHB & NSECD | MRI, PDHS, RDHS, MOHs, DCS, DS, NSECD | | | X | | | 6 Mn | ක්ෂේත්‍රගත මාතෘ සහ ළමා සෞඛ්‍ය සේවා භාවිතා කරන 5ට අඩු ළමුන්ගේ % | DHS-සමීක්ෂණ වාර්තාව |
| | විශේෂයෙන් අවදානමට ලක්විය හැකි සහ ප්‍රතිලාභ අහිමි දරුවන් ගේ නිවෙස් වලට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් (PHM) ගොස් සේවා සැපයීම අධීක්ෂණය කිරීම | MOH | FHB, PDHS, RDHS | X | X | X | X | X | 0 Mn | සැලසුම් කරන ලද මුල් ළමාවිය සම්බන්ධ නිවාස සංචාර වලින් සිදු කර ඇති % | MCH ප්‍රතිඵල |
| | සියලුම පළාත්වල පුරප්පාඩු වන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරු පිරවීම සඳහා විධිමත් ලෙස බඳවා ගැනීම් සිදු කිරීම. | MoH-ET & R division | FHB, NIHS, PDHS, RDHS, MOHs, MWCA | | | X | X | X | 45 Mn | පුරප්පාඩු පවතින ප.සෞ. සේවා නිලධාරි තනතුරු සංඛ්‍යා % | FHB-වාර්ෂික වාර්තාව |
| | සියලුම ක්ෂේත්‍ර සෞඛ්‍ය සේවකයින්ට දුෂ්කර ප්‍රදේශවලට යාම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම | MoH | MoH, FHB, MoF, PDHS, INGOs | | | X | X | | 40 Mn | ප්‍රවාහන පහසුකම් සහිත ප.සෞ. සේවා නිලධාරි % | MoH-වාර්ෂික වාර්තාව |
| | නව ක්ෂේත්‍ර සෞඛ්‍ය මධ්‍යස්ථාන/සායන ඉදිකිරීම සහ අඩු පහසුකම් සහිත ප්‍රදේශවල පවතින මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම | MoH | PDHS, RDHS, MoF, MWCA, INGO, NGOs, CBOs, PHDT | | | X | X | X | 245 Mn | වසරකට ස්ථාපිත නව අංශ සෞඛ්‍ය මධ්‍යස්ථාන/සායන සංඛ්‍යාව | සෞඛ්‍ය පහසුකම් සමීක්ෂණය, වෛද්‍ය සංඛ්‍යා ලේඛන ඒකක-MoH |
| | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල සපයනු ලබන පෝෂණ සායන සේවා පුළුල් කිරීම සහ පහසුකම් සැලසීම | PDHS | FHB, Nutrition division-MoH, MWCA, INGOs | | X | X | | | 20 Mn | පෝෂණ සායන පවත්වාගෙන යන සෞ. වෛ. නි. ප්‍රදේශ % | PDHS |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1.2** ප්‍රවේශ විය හැකි දුරින් වෙසන අවුරුදු 5ට අඩු සියලුම දරුවන් සඳහා මූලික රෝග නිවාරණ සෞඛ්‍ය සේවා සැපයීම | මහනගර සභා බලප්‍රදේශ සහ වතුකර ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් විවිධ ප්‍රදේශවල රෝග නිවාරණ ළමා සෞඛ්‍ය සේවා සඳහා සම්පත් වෙන්කිරීම් සහ උපයෝගිතා රටාවන් පිළිබඳ සමාලෝචනයක් පැවැත්වීම | MoH | MDPU-MoH, E&UH-MoH, MWCA, PDHS, MWSEID-PHDT, MCs | | X | | | | 0.15 Mn | සම්පත් බෙදී ඇති ආකාරය පිළිබද සිතියම් ගත වී තිබීම | සෞඛ්‍ය පහසුකම් සමීක්ෂණය, වෛද්‍ය සංඛ්‍යාලේඛන ඒකකය - MoH |
| | මානව සම්පත් බෙදා හැරීමේ දී සමානාත්මතාවය සහතික කිරීම සඳහා මානව සම්පත් ප්‍රතිස්ථාපනය කිරීමේ ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම සඳහා සහායවීම | PDHS | MoH-MDPU, MWCA, MWSEID-PHDT | | X | X | | | 0.7 Mn | කාර්ය මණ්ඩල/ජනගහන අනුපාතය | MoH - වාර්ෂික වාර්තාව |
| | පුද්ගලික අංශය ඇතුළුව සියලුම පළාත්වල ළදරු හිතකාමී රෝහල් සංකල්පය (Baby Friendly Hospital Initiative) ප්‍රවර්ධනය කිරීම | FHB | PDHSs, MoF, UNICEF, WHO | X | X | X | | | 13 Mn | එක් එක් පළාතේ ළදරු හිතකාමී රෝහල් සංඛ්‍යාව | FHB - වාර්ෂික වාර්තාව |
| | ළමා සෞඛ්‍ය සම්බන්ධ තොරතුරු දේශීය භාෂාවෙන් සැපයීම සඳහා සෞඛ්‍ය සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය | MoH | MWCA, PDHS, MWSEID-PHDT, Dep.of official languages | | X | X | X | | 1.5 Mn | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | - |
| | දිවයින පුරා ළමා රෝග පිළිබඳ විශේෂඥ සේවා නියමානුකූලව බෙදා හැරීම සඳහා සහායවීම | PDHS | MoH, MWSEID-PHDT, CSOs | X | X | X | X | X | 0 Mn | එක් එක් පළාතේ ළමා රෝග විශේෂඥ / ජනගහන අනුපාතය | මානව සම්පත් දත්ත සමුදාය-MoH |
| | සෞ. වෛ. නි. - පෝෂණ සායන සහ විශේෂඥ ළමා/පෝෂණ සායන අතර යොමු කිරීමේ සම්බන්ධතා ඇති කිරීම | PDHS | MoH | | | X | X | X | 3.9 Mn | යොමු කළ ළමුන් සංඛ්‍යාව | පෝෂණ මාසයේ දත්ත |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1.3**<br>වැඩ කරන මව්වරුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විකල්ප සේවා ලබා දීමේ ක්‍රම හඳුන්වාදීම | වැඩ කරන වේලාවෙන් පසු, සති අන්තයේ ආදියෙහි රාජ්‍ය සායන සේවා (පූර්ව ප්‍රසව, ළමා රෝග, පෝෂණ, සංවර්ධන, ළමා සංවර්ධන සායන) සැපයීමේ නියමු ව්‍යාපෘති හා එහි කාර්යසාධනය අධීක්ෂණය | PDHS | MOHs, PMCUs | | X | X | | | 8 Mn | එක් එක් දිස්ත්‍රික්කයක සති අන්තයේ ක්‍රියාත්මක වන සායන සංඛ්‍යාව | සැලසුම් ඒකක දත්ත/PDHS |
| | පුද්ගලික අංශයේ පූර්ව ප්‍රසව හා ළමා සුව සේවා සැපයීමේදී මුල් ළමාවිය රැකවරණ හා එහි සංවර්ධන සංකල්ප ප්‍රවර්ධනය කිරීම | පුද්ගලික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - MoH | FHB, Private sector hospitals, College of Paediatrics, PHSRC | | X | X | | | 0.2 Mn | පුද්ගලික අංශයේ ළදරු හිතකාමී රෝහල් සංඛ්‍යාව | M & E ඒකකය - FHB |
| **1.4**<br>ගර්භණී සහ කිරි දෙන මව්වරුන් සහ අවුරුදු 5 ට අඩු දරුවන් අතර යහ පෝෂණය සහතික කිරීම සඳහා අඛණ්ඩ පහසුකම් සැපයීම | සියලූම පෙර පාසල් දරුවන්ගේ නිසි පෝෂණයට සහාය වීම සඳහා අවශ්‍යතා ඇති සියලූම පෙරපාසල් ආවරණය වන පරිදි උදෑසන ආහාර වේල වැඩසටහන පුළුල් කිරීම | NSECD | MoF, MoE, MWSEID-PHDT, Provincial Secretaries, INGOs, Pvt Sector, CSOs | X | X | X | X | X | 2,500 Mn | දිවා ආහාර වැඩසටහන් ක්‍රියාත්මක වන අවශ්‍යතා ඇති පෙර පාසල් % | MoE<br>පෙර පාසල් සංගණනය |
| | ගර්භණී සහ කිරි දෙන මව්වරුන් සඳහා පෝෂණ ආධාර දීමනා ලබා දීම අඛණ්ඩව සිදු කිරීම | NSECD | PDHS, RDHS, MOH, DS, INGOs, Pvt Sector, CSOs | X | X | X | | | 7,500 Mn | පෝෂණ දීමනාව ලබා ගන්නා ගර්භණී සහ කිරි දෙන මව්වරුන්ගේ % | NSECD |
| | අවශ්‍යතා ඇති සියලූම දරුවන්ට සහ මව්වරුන්ට නිරන්තර ත්‍රිපෝෂ සැපයීම සහතික කිරීම සඳහා සැපයුම් දාමය ශක්තිමත් කිරීම | MoF | MoH, PDHS, RDHS, MWSEID-PHDT, | X | X | X | X | X | 15,000 Mn | ත්‍රිපෝෂ ලබා ගන්නා වයස අවුරුදු 5 ට අඩු අඩු බර දරුවන්ගේ % | සමීක්ෂණ වාර්තාව(MRI) |

## උපායමාර්ගය 02

ජාතික හා පළාත් සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ආයතන මගින් සපයනු ලබන පෝෂණය සහ සෞඛ්‍ය සේවා වල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා පහසුකම් සැපයීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **2.1** ප්‍රාදේශීය, දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් සෞඛ්‍ය හා පෝෂණ සේවා සපයන ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම | සෞඛ්‍ය සහ පෝෂණ සේවා සපයන ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල අධීක්ෂණය පිළිබඳ අධීක්ෂකවරුන් පුහුණු කිරීම | MoH / NSECD | MoH-Quality Secretariat/ FHB/ EUH-MoH RDHSs, NSECD, MWSEID-PHDT | | X | X | X | X | 18.5 Mn | පුහුණු කරන ලද අධීක්ෂකවරුන් සංඛ්‍යාව | FHB-වාර්ෂික වාර්තාව |
| | මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවා ඇගයීම සඳහා අධීක්ෂණ මෙවලම් නැවත සලකා බැලීම/සංවර්ධනය කිරීම | MoH / MWCA-NSECD | FHB, MWCA-NSECD | | X | | | | 0.75 Mn | යාවත්කාලීන කරන ලද අධීක්ෂණ මෙවලම් සංඛ්‍යාව | FHB-වෙබ් ගබඩාව |
| **2.2** සෞඛ්‍ය සහ පෝෂණ සේවා සපයන ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල අධීක්ෂණය පිළිබඳ අධීක්ෂකවරුන් පුහුණු කිරීම | මාතෘ සහ ළමා සෞඛ්‍ය සත්කාර සපයන ආයතනවල භාවිතා කළ යුතු තත්ත්ව ප්‍රමිතීන් සහ තත්ත්ව ඇගයීම් මෙවලම් සංවර්ධනය/ යාවත්කාලීන කිරීම (උදා: ශ්‍රී ලංකා ජාතික මාතෘ හා ළමා සෞඛ්‍ය තත්ත්ව ඇගයීම් මෙවලම්) | MoH - ගුණාත්මක හා ආරක්ෂිත සෞඛ්‍ය සේවා පිළිබඳ අධ්‍යක්ෂ කාර්යාලය | MoH-FHB, PDHSs, College of Paediatricians, College of Obstetrics and Gynaecologists | | | X | | | 1.5 Mn | තත්ත්ව ඇගයීමේ මෙවලම් පැවතීම | RHMIS |
| | මාතෘ හා ළමා සෞඛ්‍ය සත්කාර සපයන ආයතනවල ගුණාත්මකභාවය ඇගයීම සඳහා විධිමත් සමාලෝචන හා සායනික විගණන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | MoH - ගුණාත්මක හා ආරක්ෂිත සෞඛ්‍ය සේවා පිළිබඳ අධ්‍යක්ෂ කාර්යාලය | MoH-FHB, PDHSs, | | X | X | | | 6 Mn | තත්ත්ව ඇගයීමේ මෙවලම් භාවිත කරන රෝහල් ගණන | දිස්ත්‍රික් සංගණන |
| | ගුණාත්මක මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවා ඇගයීම සඳහා කාර්ය සාධනය දිරිගැන්වීමේ යාන්ත්‍රණයක් දියත් කිරීම | MoH - ගුණාත්මක හා ආරක්ෂිත සෞඛ්‍ය සේවා පිළිබඳ අධ්‍යක්ෂ කාර්යාලය | MoH-FHB, MoF | | | | X | X | 5 Mn | කාර්ය සාධන යාන්ත්‍රණ පැවතීම | - |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2.3** බහුවිධ අංශ හරහා ඒක්‍ය සේවා සැපයීම පිළිබඳ නිරන්තර සමාලෝචනයක් පැවැත්වීම | සියලුම දිස්ත්‍රික්කවල 'මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන පැකේජ' ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඒකාබද්ධ සමාලෝචනය | FHB/ MWCA | HPB, PDHS, RDHS, MOHs, DPCCS, Provincial ECE units | X | X | X | X | X | 15 Mn | පවත්වන ලද සමාලෝචන සංඛ්‍යාව | FHB වාර්ෂික වාර්තාව |
| | පවතින පෝෂණ මැදිහත්වීම්වල සඵලතාවය ඇගයීම (උදා: ත්‍රිපෝෂ,බහු ක්ෂුද්‍ර පෝෂක, දිවා ආහාර වැඩසටහන) | පෝෂණ අංශය - MoH | MRI, FHB, NSECD | | X | X | | | 10 Mn | ඇගයීම් වාර්තාව පැවතීම | ඇගයීම් වාර්තාව |
| **2.4** සියලුම මට්ටම්වල සේවාදායක තෘප්තිය සහ සේවක තෘප්තිය විශ්ලේෂණය කිරීම | සේවාලාභී සහ සේවක තෘප්තිය තක්සේරු කිරීමේ මෙවලම් සංවර්ධනය කිරීම සහ වලංගු කිරීම | MoH | MoH - ගුණාත්මක හා ආරක්ෂිත සෞඛ්‍ය සේවා පිළිබඳ අධ්‍යක්ෂ කාර්යාලය | | | X | X | | 0.6 Mn | සංවර්ධනය කළ මෙවලම් | තත්ත්ව ලේකම් කාර්යාලය - වෙබ් අඩවිය |
| | මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සපයන සායන, රෝහල් (උදා: පශ්චාත් ප්‍රසව වාට්ටු) වලදී නිරන්තර සේවාදායක/සේවක තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම | MoH | MoH - ගුණාත්මක හා ආරක්ෂිත සෞඛ්‍ය සේවා පිළිබඳ අධ්‍යක්ෂ කාර්යාලය | | | | X | X | 4 Mn | තෘප්තිමත් කළ සේවාදායකයන් % | තත්ත්ව ලේකම් කාර්යාලය - වෙබ් අඩවිය |

## උපායමාර්ගය 03

අතිශයින් අවදානමට ලක් වූ සහ අවාසිදායක තත්ත්වයේ සිටින ළමයින්, සෞඛ්‍යය සහ පෝෂණ සේවාවල ප්‍රධාන ධාරාව තුළට ගෙන ඒම සඳහා උද්දේශනය (advocacy) හා දැනුවත් බව ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **3.1** අවදානමට ලක්විය හැකි සහ ප්‍රතිලාභ අහිමි දරුවන් අතර සෞඛ්‍ය හා පෝෂණ ගැටලු හඳුනාගැනීම සහ ඔවුන්ට ප්‍රවේශවිය හැකි සේවාවන් සිතියම්ගත කිරීම | විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ඇතුළු අවදානමට ලක්විය හැකි සහ ප්‍රතිලාභ අහිමි දරුවන්ගේ ගැටලු හඳුනාගැනීම සඳහා ජාතික සමීක්ෂණයක් සංවිධානය කිරීම සහ පැවැත්වීම | FHB & NSECD | DPCCS, NCPA, MoH, DCS, INGOs, CBOs | | X | X | | | 8 Mn | වයස අවුරුදු 5 ට අඩු සියලුම දරුවන් අතරින් අවදානමට ලක්විය හැකි/ අවාසිදායක තත්වයේ වෙසෙන දරුවන් % | සමීක්ෂණ වාර්තාව |
| | අවදානමට ලක්විය හැකි සහ සහ අවාසිදායක තත්වයේ වෙසෙන දරුවන්ගේ රැකවරණය සඳහා සම්බන්ධ සියලුම පාර්ශවකරුවන් හඳුනා ගැනීම සඳහා සිතියම්ගත කිරීමේ ක්‍රියාවලියක් සිදු කිරීම | NSECD | MoH, DPCCS, NCPA, MoH, DCS, INGOs, CBOs, Academia | | X | | | | 0.15 Mn | පාර්ශ්වකරුවන්ගේ සිතියම | - |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **3.2**<br>අවදානමට ලක් විය හැකි සහ අවාසිදායක තත්වයේ වෙසෙන දරුවන් සඳහා සෞඛ්‍ය සහ පෝෂණ සේවා සැපයීමේදී අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම | අවදානමට ලක් විය හැකි සහ අවාසිදායක තත්ත්වයේ වෙසෙන දරුවන්ට ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය හා පෝෂණ සේවා සැපයීම සඳහා පාර්ශවකරුවන් ප්‍රවර්ධනය කිරීමට උපදේශන මෙවලම් සංවර්ධනය කිරීම | HPB | FHB, NSECD, NCPA, DPCCS | X | X | | | | 1.5 Mn | උපදේශන මෙවලම් ගැනීමට පැවතීම | - |
| | අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්වයේ වෙසෙන දරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව සියලුම පාර්ශ්වකරුවන්ට උපදේශන වැඩසටහන් පැවැත්වීම | FHB | HPB, PDHS, RDHS, NSECD, NCPA, DPCCS, MWSEID-PHDT | | X | X | | | 3.5 Mn | පවත්වන ලද උපදේශන වැඩසටහන් සංඛ්‍යාව | - |
| | ප්‍රධාන ප්‍රවාහයේ සේවාවන් සැපයීම සඳහා වතුවල සේවා බෙදාහැරීමේ ස්ථාන පුළුල් කිරීම සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම්, වතු ප්‍රජා නායකයින් සහ දේශපාලනඥයින් සඳහා උපදේශන පැවැත්වීම | MWSEID-PHDT | EUH-MoH, PDHS, MoPI | | X | | | | 1 Mn | පවත්වන ලද උපදේශන වැඩසටහන් සංඛ්‍යාව | PHDT දත්ත සමුදාය |
| **3.3**<br>ප්‍රධාන ධාරාවේ සෞඛ්‍ය සහ පෝෂණ සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්වයේ වෙසෙන දරුවන් සිටින පවුල්/ප්‍රජාවන් සඳහා සෞඛ්‍ය දැනුම්වත් කිරීම පිළිබඳ බාහිර වැඩසටහන් පැවැත්වීම | අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්වයේ වෙසෙන දරුවන් සිටින පවුල්වල සෞඛ්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා දේශීය භාෂාවලින් තොරතුරු සන්නිවේදන මෙවලම් සකස් කිරීම | HPB | FHB, NSECD, DPCCS, INGOs | X | X | | | | 3 Mn | තොරතුරු සන්නිවේදන මෙවලම් පැවතීම | HPB දත්ත සමුදාය |
| | ප්‍රධාන සෞඛ්‍ය සහ පෝෂණ සේවාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්වයේ පසුවන දරුවන් සිටින පවුල් හෝ ප්‍රජාවන් සඳහා සෞඛ්‍ය දැනුවත් කිරීම පිළිබඳ වැඩසටහන් පැවැත්වීම | PDHS | FHB, NSECD, DPCCS, INGOs | | X | | | | 2.5 Mn | පවත්වන ලද උපදේශන වැඩසටහන් සංඛ්‍යාව | සැලසුම් ඒකක දත්ත/PDHS |
| | අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්වයේ වෙසෙන දරුවන් සහ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා සේවා සැපයීම පිණිස සෞඛ්‍ය සේවකයින්ගේ ධාරිතාව සංවර්ධනය කිරීම | FHB | NSECD, PDHS, DPCCS, NCPA, INGOs, CBOs, CSOs | | X | X | X | | 3.25 Mn | පුහුණු කරන ලද සෞඛ්‍ය සේවකයින් සංඛ්‍යාව | FHB-වාර්ෂික වාර්තාව |

## උපායමාර්ගය 04

පවත්නා ළමා රැකවරණය, පෝෂණය සහ උපදෙස් සඳහා යොමු කළ යුතු සේවාවන් පිළිබඳ ව දෙමව්පියන්, පවුල, තරුණ තරුණියන්, නව යෞවනයන් සහ ප්‍රජාව තුළ දැනුවත් බව සහතික කිරීම පිණිස අදාළ ආයතන ශක්තිමත් කිරීම හා පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **4.1** සෞඛ්‍ය සහ පෝෂණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පැහැදිලි මගපෙන්වීම සමග සෞඛ්‍ය හා සෞඛ්‍ය නොවන බලධාරීන්ට පහසුකම් සැලසීම. | මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන ආශ්‍රිත සෞඛ්‍ය සහ පෝෂණ සන්නිවේදනය සඳහා පැහැදිලි කාර්යභාරයන් සහිත සැලැස්මක් සකස් කිරීම | HPB | MoH-Nutrition division, EUH-MoH, FHB, NSECD | | | X | X | X | 5 Mn | සන්නිවේදන සැලැස්මක් පැවතීම | HPB වෙබ් අඩවිය |
| | ලබාගත හැකි මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සහ ප්‍රවේශ විය හැකි සේවා ස්ථාන පිළිබඳ තොරතුරු අධ්‍යාපන සහ සන්නිවේදන මෙවලම (IEC) සංවර්ධනය කිරීම | HPB | MoH-Nutrition division, MWCA-NSECD | X | X | | | | 2 Mn | සකස් කරන ලද සන්නිවේදන මෙවලම් සංඛ්‍යාව | HPB වෙබ් අඩවිය |
| | ලබාගත හැකි මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා, පෝෂණ වැඩසටහන් සහ යොමුකිරීම් පිළිබඳ දැනුවත් කිරීම පිණිස සෞඛ්‍ය නොවන පාර්ශවයන් සඳහා සහයෝගීතා වැඩමුළු | PDHS | HPB, FHB, NSECD, MoE, Provincial ECE units, CBOs, CSOs, INGOs, NGOs | | X | | | | 0.9 Mn | පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව | සැලසුම් ඒකක දත්ත/PDHS |
| **4.2** පළාත් සෞඛ්‍ය කාර්ය මණ්ඩලය හරහා, ලබා ගත හැකි මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා, පෝෂණ වැඩසටහන් සහ යොමු කිරීම් පද්ධති පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම | සෞඛ්‍ය සහ පෝෂණ වැඩසටහන් පිළිබඳ පණිවිඩ බෙදා හැරීමට පවතින ජාල සවිබල ගැන්වීම (උදා: පෙර පාසල් පරිසරය, මාතෘ උපකාරක, නව විවාපත් තරුණ කණ්ඩායම් වල සමාජ මාධ්‍ය කණ්ඩායම්) ආදිය. | PDHS | HPB, FHB, RDHS, MOH, ECCD officers (NSECD), CBOs CSOs | X | X | | | | 0 Mn | පවත්වන ලද ප්‍රජා මූලික වැඩසටහන් සංඛ්‍යාව | සැලසුම් ඒකක දත්ත/PDHS |
| | ලබා ගත හැකි සේවා පිළිබඳ සමාජ මාධ්‍ය පණිවුඩය පවතින ප්‍රජා කණ්ඩායම් හරහා සංවර්ධනය කිරීම සහ බෙදා දීම | HPB | PDHS, NSECD, FHB | | X | X | X | X | 7 Mn | බෙදා හරින ලද සමාජ මාධ්‍ය පණිවිඩ සංඛ්‍යාව | සමාජ මාධ්‍ය පිටුව-HPB |

**උපායමාර්ගය 05**

අතිශයින් අවදානමට ලක් විය හැකි හා අවාසිදායක තත්ත්වයේ වෙසෙන ළමයින් වෙත විශේෂ අවධානය යොමු කරමින් ඌන සේවා සැපයුමක් ඇති ප්‍රදේශ සහ ප්‍රජාව කරා ළමා රැකවරණ සේවා ව්‍යාප්ත කිරීමට ජාතික හා පළාත් බලධාරීන් මෙන් ම රාජ්‍ය නොවන ආයතනවලට ද පහසුකම් සැපයීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **5.1**<br>සෞඛ්‍ය හා පෝෂණ ඌන සේවා සැපයෙන ප්‍රදේශ පිළිබඳ තොරතුරු හඳුනාගෙන ඒවා, අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්වයේ වෙසෙන දරුවන් වෙත බෙදාදීම | දරුවන් සඳහා වන සෞඛ්‍ය සේවා සහ අවදානම් සහිත දරුවන් පිළිබඳ ජාතික සමීක්ෂණ දත්ත ඒකාබද්ධ කොට සිතියම්ගත කිරීම | FHB & NSECD | MoH, DPCCS, NCPA, INGOs, NGOs, CBOs, MWSEID-PHDT | | | X | | | 0.5 Mn | පවත්වන ලද විශේෂ ප්‍රවේශ වැඩසටහන් සංඛ්‍යාව | - |
| | අවශ්‍යවන අයට ළමා රැකවරණ සේවා පුළුල් කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ හා රාජ්‍ය නොවන සංවිධාන මට්ටමේ සේවා සපයන්නන්හට තොරතුරු බෙදා හැරීම | NSECD | PDHS, RDHS,MOH, DS office, INGOs, NGOs, CBOs, MWSEID-PHDT | | X | X | X | X | 0 Mn | දිස්ත්‍රික්කයකට ස්ථාපිත විකල්ප සේවා ස්ථාන සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |
| **5.2**<br>අවදානමට ලක්විය හැකි පරිසරයක සිටින ළමුන් සඳහා විකල්ප සෞඛ්‍ය සහ පෝෂණ සේවා සැපයීමට රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන හරහා පහසුකම් සැලසීම | ඌන සේවා සැපයෙන ප්‍රදේශවල / අවදානමට ලක්විය හැකි පරිසරයක (උදා: වතුකර ප්‍රදේශ, අනාථ දරුවන් සිටින නිවාස) වෙසෙන දරුවන් සඳහා විශේෂ බාහිර වැඩසටහන් පැවැත්වීම පිණිස සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය යෙදවීම | PDHS | MOH, Provincial secretary, SS Dept, MWCA, MWSEID-PHDT, | | X | X | X | X | 15.5 Mn | අසතුටුදායක මට්ටමේ ජල හා සනීපාරක්ෂක ප්‍රමිතීන් සහිත ගෘහස්ථ % | PCC කාර්ය සටහන් |
| | ඌන සේවා සැපයෙන ප්‍රදේශවල / අවදානමට ලක්විය හැකි පරිසරයේ (උදා: නාගරික ප්‍රදේශවල පිහිටා ඇති සුව සේවා මධ්‍යස්ථාන, අඩු වයස් මව්වරුන් සඳහා රැකවරණ නිවාස) සෞඛ්‍ය හා පෝෂණ සේවාව සැපයීම සඳහා විකල්ප සේවා මධ්‍යස්ථානයන් ස්ථාපිත කිරීම | MoH | Mo State affairs, MoH-EUH, MC/ UC, INGOs, NGOs, CSOs | | X | X | | | 125 mn | ජල මිදිත වැසිකිළි සහිත නිවාස % | සැලසුම් ඒකක දත්ත/PDHS |

## උපායමාර්ගය 06

උඌන සේවා සැපයුමක්ඇති ප්‍රදේශ සඳහා පිරිසිදු පානීය ජලය සහ ස්ත්‍රී පුරුෂ භාවයට හා වයසට උචිත සනීපාරක්ෂක සේවා සැපයීම හා ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **6.1** ජල හා සනීපාරක්ෂක -WASH- පහසුකම් ලබා ගැනීමේ හැකියාව අනුව සේවා නොලබන සහ උඌන සේවා ප්‍රදේශ හඳුනාගැනීම | ම. සෞ. ප. සමීක්ෂණ දත්ත මත පදනම්ව නිවාසවල ජල හා සනීපාරක්ෂක පහසුකම් (පානීය ජල මූලාශ්‍ර, වැසිකිළි වර්ගය, අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම) සිතියම්ගත කිරීම | MoH-E &OH අංශය | PDHS/ RDHS | X | | | | | 0.5 Mn | අසතුටුදායක මට්ටමේ ජල හා සනීපාරක්ෂක ප්‍රමිතීන් සහිත ගෘහස්ථ % | මහජන සෞඛ්‍ය පරීක්ෂක මාසික වාර්තාව |
| | අඩු ආදායම්ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම පිණිස මූල්‍ය ආධාර සැපයීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | PDHS/ RDHS/ MOH/ PC | X | X | X | X | | 1,950 Mn | ජල මුද්‍රිත වැසිකිළි සහිත නිවාස % | මහජන සෞඛ්‍ය පරීක්ෂක මාසික වාර්තාව |
| **6.2** ජල හා සනීපාරක්ෂක -WASH- ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා පෙර පාසල් ප්‍රවර්ධනය කිරීම | ම. සෞ. ප. විසින් සිදු කරන පාසල් සෞඛ්‍ය හා සනීපාරක්ෂක සමීක්ෂණය පෙර පාසල් දක්වා ව්‍යාප්ත කිරීම | MoH-E &OH අංශය | MoH-PDHS/ RDHS, MoE, MWCA-NSECD | | | X | | | 10 Mn | සනීපාරක්ෂක සමීක්ෂණය මඟින් ආවරණය වන පෙර පාසල් % | මහජන සෞඛ්‍ය පරීක්ෂක මාසික වාර්තාව |
| | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජාතික ජල හා සනීපාරක්ෂක ප්‍රමිතීන් මත පදනම්ව, අවම ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම | MWCA-NSECD | ප්‍රාදේශීය මුල් ළමාවිය අධ්‍යාපන අධිකාරීන්, PDHS, RDHS, MOHs, NWSDB | | | X | X | X | 52.5 Mn | පවත්වන ලද වාර්ෂික සමාලෝචන සංඛ්‍යාව | රැස්වීම් කාර්ය සටහන් |
| **6.3** ජල හිඟය පවතින ප්‍රදේශවල ප්‍රජා ජල ව්‍යාපෘති ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කිරීම | ජල හිඟය පවතින හඳුනාගත් ප්‍රදේශවල ප්‍රජා ජල ව්‍යාපෘති ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කිරීම | NWSDB | NGOs, CBOs | | X | X | X | X | 1,500 Mn | අලුතින් ස්ථාපිත කර ඇති ප්‍රජා ජල ව්‍යාපෘති සංඛ්‍යාව | මහජන සෞඛ්‍ය පරීක්ෂක මාසික වාර්තාව |

## උපායමාර්ගය 07

හදිසි අවස්ථාවන් හි දී පෝෂණය ඇතුළු ළමා රැකවරණ සේවා ප්‍රමාණවත් ලෙස සැපයීම තහවුරු කිරීම හා එම කටයුතු ප්‍රවර්ධනය සඳහා අදාළ ජාතික සහ පළාත් ආයතන වෙත පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **7.1** හදිසි අවස්ථාවලදී සෞඛ්‍ය සහ පෝෂණ සේවා පවත්වාගෙන යාම සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශ්‍රම බලකාය පුහුණු කිරීම සහ සූදානම් කිරීම | හදිසි අවස්ථාවලදී හදිසි හා අත්‍යවශ්‍ය ළමා රැකවරණ පවත්වා ගැනීම පිළිබඳ ජාතික මාර්ගෝපදේශයක් සකස් කිරීම. | MoH-DPRD | MoD-DMC, Provincial secretary, PDHS | | X | X | | | 0.5 Mn | ජාතික මාර්ගෙ ්පදේශ තිබීම | DMHIS |
| | හදිසි ආපද තත්වයන්හි දී සූදානම්ව සිටීම සහ ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සහ ආයතනවල ධාරිතා සංවර්ධනය කිරීම | MoH-DPRD | MoD-DMC, Provincial secretary, PDHS | | X | X | | | 5 mn | පුහුණු කළ කාර්ය මණ්ඩල සංඛ්‍යාව | DMHIS |
| | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මට්ටමින් ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීමට පහසුකම් සැලසීම | MoH-DPRD | PDHS, RDHS, MOH | | | X | | | 1 Mn | ආපදා පෙර සූදානම් සැලැස්මක් සහිත සෞ.වෛ. නි. කාර්යාල/ ප්‍රාථමික ප්‍රතිකාර මධ්‍යස්ථාන සංඛ්‍යාව | DMHIS |
| | ආපදාවකදී හදිසි ළමා රැකවරණය සඳහා යොමු කිරීමේ මාර්ග ස්ථාපිත කර ඇති බවට සහතික කිරීම | MoH-DPRD | MoH, MoD-DMC, NSECD | | X | X | | | 0.025 Mn | යොමු කිරීමේ මාර්ග සමඟ ආපදා අනතුරු අවම කිරීමේ අත්පොත තිබීම | DMHIS |
| | ආපදා ක්‍රියා කළමනාකරණ සැලැස්ම පිළිබඳ අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම | දිස්ත්‍රික් DMC | SL Police, Mo Local gov., DS offices, PDHS/ RDHS, DSS | | X | X | | | 3.5 Mn | පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව | DMCC කාර්ය සටහන් |
| **7.2** ආපදාවෙන් පසු දරුවන්ගේ මනෝ සමාජීය සෞඛ්‍ය සහතික කිරීම සඳහා යාන්ත්‍රණ සකස් කිරීම | ආපදාවෙන් පසු දරුවන්ගේ මනෝ සමාජීය සෞඛ්‍ය සහතික කිරීම සඳහා සැලැස්මක් සකස් කිරීම | MoH-DPRD | MoH-Mental health directorate/ FHB, College of child psychiatrists | | X | X | | | 1.5 Mn | සැලැස්මක් තිබීම | DM-HIS |

## උපායමාර්ගය 08

සෞඛ්‍ය සහ පෝෂණ ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩලයන්හි ධාරිතා සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීම මගින් සියලු ම මුල් ළමාවියේ පසුවන දරුවන්ට ළමයින්ට ගුණාත්මක සෞඛ්‍ය සහ පෝෂණ සේවා සැපයීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මි රු. | | |
| **8.1** වඩා හොඳ ගුණාත්මක සේවාවන් සැපයීම සඳහා සෞඛ්‍ය සහ පෝෂණ සේවා සපයන්නන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් (TOT) සහ ක්ෂේත්‍රගත මාතෘ හා ළමා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා'මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන පැකේජය' පිළිබඳ අඛණ්ඩව සේවාස්ථ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම (උදා: IYCF/ මව්කිරි දීම ආදිය) | FHB / RDHS | HPB, PDHS, RDHS, MOHs, MWCA | X | X | X | X | X | 27.5 Mn | පවත්වන ලද දිස්ත්‍රික් මට්ටමේ ToT වැඩසටහන් සංඛ්‍යාව | FHB-වාර්ෂික වාර්තාව |
| | පෞ. සෞ. සේ., සෞ. වෛ. නි. හා මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ පෙර සේවා පුහුණු විෂය මාලාවට මුල් ළමාවිය සංවර්ධන පැකේජ ඒකාබද්ධ කිරීම | MoH-ET & R අංශය | NIHS, University Academia, NSE CD | | X | X | | | 0.4 Mn | වෙනස් වූ විෂයමාලාව | - |
| | මුල් ළමාවිය සංවර්ධන වෘත්තිකයන්ට තාක්ෂණික තීරණ සන්නිවේදනය කිරීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණ (උදා: m-health) ගොඩනැගීම | HPB | FHB, Nutrition division, Academia, researchers, NSECD | | X | X | X | X | 6 Mn | සකස් කළ ක්‍රියාකාරී වේදිකා සංඛ්‍යාව | HPB වෙබ්අඩවිය |
| | වතු අංශ සේවකයින් (පෞ. සෞ. සේ., ළදරු නිවාස සහායකයින්, මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් ආදී) අතර සෞඛ්‍ය සහ පෝෂණය පිළිබඳ වත්මන් දැනුම සහ කුසලතා මට්ටම සමාලෝචනය කර යාවත්කාලීන කිරීම | MWSEID-PHDT | FHB, PDHS, RDHS, MWCA | | X | X | | | 3.5 Mn | පවත්වන ලද ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සංඛ්‍යාව | PHDT වාර්තා |
| **8.2** බහුආංශික දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ දැනුම බෙදාගැනීමේ වේදිකාවලට පහසුකම් සැලසීම | පෝෂණය ඇතුළු මුල් ළමාවිය සංවර්ධන සේවාවන් ප්‍රවර්ධනය කරන සියලූම සෞඛ්‍ය නොවන හවුල්කරුවන්ට මුල් ළමාවිය සංවර්ධන මැදිහත්වීම්වල විද්‍යාත්මක අංශ පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමේ සහයෝගිතා වැඩමුළු පැවැත්වීම. | පෝෂණ අංශය-MoH | NSECD, HPB, MWSEID-PHDT, NGOs, CSOs | | X | X | X | | 2.5 Mn | පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව | පෝෂණ අංශය - වාර්ෂික වාර්තාව |
| | දැනුම හුවමාරු කර ගැනීම සහ වෘත්තීය සංවර්ධනය සඳහා මුල් ළමාවිය සංවර්ධන ජාලයක් පිහිටුවීම | NSECD | MoH, MWSEID-PHDT | | X | | | | 1 Mn | ජාලයක් තිබීම | NCC කාර්ය සටහන් |
| | මුල් ළමාවිය සංවර්ධන සේවා සපයන්නන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන හරහා ජාත්‍යන්තර අත්දැකීම් සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා අරමුදල් සහතික කිරීම. | NSECD | MWCA. MoH-DDG-PHS, International health unit, INGOs | | X | X | | | 15 Mn | පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |

## උපායමාර්ගය 09

මුල් ළමාවියේ පසුවන ළමයින්ට ගුණාත්මක සෞඛ්‍ය සහ පෝෂණ සේවා සපයනු පිණිස රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය සහභාගී කරවීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **9.1** ජාතික සහ පළාත් මට්ටමේ මුල් ළමාවිය සංවර්ධන සේවා සැලසුම් සංසදවල සංවර්ධන හවුල්කරුවන්ගේ (රාජ්‍ය නොවන සංවිධාන සහ පුද්ගලික අංශය) සහභාගීත්වයට පහසුකම් සැලසීම | ජාතික මට්ටමේ බහුආංශික සැලසුම් සංසද සඳහා සංවර්ධන හවුල්කරුවන් සම්බන්ධ කර ගැනීම (උදා: ජාතික පෝෂණ මෙහෙයුම් කමිටුව, මාතෘ හා ළමා පෝෂණ අනුකමිටුව, මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව) | NSECD | NCC-ECCD, MoH-DDG-PHS11/ Nutrition division/ FHB, MWCA, MoF, Dep. of National Planning | X | X | X | X | X | 0 Mn | සහාය දීමට එකඟ වූ ව්‍යාපෘති සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |
| | මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ සේවා පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් සැලසුම් කිරීමේදී සංවර්ධන හවුල්කරුවන් සම්බන්ධ කර ගැනීම (උදා: මුල් ළමාවිය සංවර්ධන පිළිබඳ පළාත් සම්බන්ධීකරණ කමිටුව) | PDHS | Provincial secretary, PDHS | X | X | X | X | X | 0 Mn | පළාත් මට්ටමින් සහය දක්වන ව්‍යාපෘති සංඛ්‍යාව | PCC කාර්ය සටහන් |
| **9.2** මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ සේවා තත්ත්ව ප්‍රමිතීන් සමාලෝචනය කිරීම පිණිස සංවර්ධන හවුල්කරුවන්ට සහායවීම | මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ සේවා තත්ත්ව ප්‍රමිතීන් සංවර්ධනය / යාවත්කාලීන කිරීමේ දී සංවර්ධන හවුල්කරුවන්ගෙන් තාක්ෂණික සහ මූල්‍ය සහාය දිරිමත් කිරීම | NSECD | MoH-DDG-PHS11/ Nutrition division/ FHB, MWCA, MoF, | X | X | X | X | X | 0 Mn | සහාය දීමට එකඟ වූ ව්‍යාපෘති සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |
| **9.3** ඌන සේවා සැපයෙන /සේවා නොලබන ප්‍රදේශවල සෞඛ්‍ය සහ පෝෂණ සේවා සැපයීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව සංවර්ධන හවුල්කරුවන්ට පහසුකම් සැලසීම. | ඌන සේවා සැපයෙන /සේවා නොලබන ප්‍රදේශ සහ අවදානමට ලක්විය හැකි දරුවන් පිළිබඳ තොරතුරු, සංවර්ධන හවුල්කරුවන් සමඟ බෙදා ගැනීම | NSECD | MoH-DDG-PHS11/ Nutrition division/ FHB, MWCA, MoF, MWSEID-PHDT | X | X | X | X | X | 0 Mn | සහාය දීමට එකඟ වූ ව්‍යාපෘති සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |
| | අවදානමට ලක්විය හැකි ළමුන් සඳහා සෞඛ්‍ය සහ පෝෂණ සේවා පුළුල් කිරීම පිණිස සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝගීතා ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම | MoH | NSECD, MoF, MWSEID-PHDT, INGOs, NGOs | X | X | X | X | X | 10.5 Mn | සහාය දීමට එකඟ වූ ව්‍යාපෘති සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **9.4** මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවාවන්වල ධාරිතා සංවර්ධනය සඳහා සහායවීම පිණිස සංවර්ධන පාර්ශව කරුවන්ට පහසුකම් සැලසීම | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවාවන්වල ධාරිතා සංවර්ධන අවශ්‍යතාවන් පිළිබඳ තක්සේරු කර ඒවා සංවර්ධන පාර්ශවයන්ට සන්නිවේදනය කිරීම | MoH/ NSECD | MWCA, MWSEID-PHDT, INGOs, NGOs | | X | X | | | 2.25 Mn | පුහුණු කළකාර්ය මණ්ඩලය සංඛ්‍යාව | MoH-වාර්ෂික වාර්තාව |

**උපායමාර්ගය 10** ආබාධිත හා වෙනත් විශේෂ අවශ්‍යතා මුල් කාලීනව හඳුනා ගැනීමට ද එසේ හඳුනාගත් ළමයින් වැඩිදුර උපදෙස් සඳහා යොමු කිරීමට ද සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරවීම පිණිස පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මු. රු. | | |
| **10.1** දිස්ත්‍රික්ක 25 තුළම ආබාධ සහිත දරුවන් කල්තියා හඳුනාගැනීම සඳහා රැකවරණ පිළිබඳ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම | ආබාධ සහිත දරුවන් හා වෙනත් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් කල්තියා හඳුනාගැනීම පිළිබඳ ප්‍රාථමික සෞඛ්‍ය සේවකයින් පුහුණු කිරීම | FHB | PDHS,RDHS, MOH, College of paediatricians, College of child & adolescent psychiatrists | | X | X | | | 10 Mn | පුහුණු කළ ප්‍රාථමික සෞඛ්‍ය සේවකයින් සංඛ්‍යාව | FHB-වාර්ෂික වාර්තාව |
| | ක්ෂේත්‍ර සෞඛ්‍ය කාර්ය මණ්ඩලය (සෞ. සෞ. සේ.) විසින් නියමිත කාල පරාසයන් තුළ සියලුම දරුවන්ගේ සංවර්ධනය පිළිබඳ ඇගයීම අඛණ්ඩව සිදු කිරීම | FHB | PDHS, RDHS, MOH | X | X | X | X | X | 0 Mn | යොමු කළ ළමුන් සංඛ්‍යාව | MCH වර්තාව |
| | සාමාන්‍ය වෛද්‍යවරුන් සහ පවුලේ වෛද්‍යවරුන් විසින් සාමාන්‍ය සෞඛ්‍ය පරීක්ෂණවලදී දරුවන්ගේ සංවර්ධනය ඇගයීම පිළිබඳ පුහුණු කිරීම | FHB | PDHS, RDHS, MOH, College of paediatricians, College of GPs | | | X | X | | 3 Mn | පුහුණු කළ වෛද්‍යවරුන් සංඛ්‍යාව | FHB-වාර්ෂික වාර්තාව |
| | සියලුම දිස්ත්‍රික්කවල යොමු කිරීම් සඳහා ප්‍රජා ළමා රෝග විශේෂඥයින් ඇතුළත් ද්විතීයික මට්ටමේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන (CDCs) පිහිටුවීම | MoH-DDG-PHS 11 | FHB, PDHS, RDHS, MOH | | X | X | X | | 50 Mn | ක්‍රියාකාරී CDC සංඛ්‍යාව | MoH-වාර්ෂික වාර්තාව |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **10.2** ආබාධ සහිත දරුවන් සහ අනෙකුත් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් කල්තියා හඳුනා ගැනීම සහ යොමු කිරීම සඳහා පෙර පාසල් ගුරුවරුන්/මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය කිරීම | ආබාධ සහිත දරුවන් සහ අනෙකුත් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් කල්තියා හඳුනා ගැනීම පිළිබඳ පෙර පාසල් ගුරුවරුන්/මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම | FHB | PDHS, RDHS, NSECD, DSS, DS office | | X | X | | | 5 Mn | පුහුණුව ලැබූ පෙර පාසල් ගුරුවරුන්/ ECCD නිලධාරීන් සංඛ්‍යාව | FHB-වාර්ෂික වාර්තාව |
| **10.3** ආබාධ සහිත දරුවන් සහ අනෙකුත් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් කල්තියා හඳුනා ගැනීම පිළිබඳ දෙමාපියන්ගේ / රැකවරණ සපයන්නන්ගේ කුසලතා සංවර්ධන කිරීම | දෙමව්පියන් දරුවන්ගේ ආබාධිත තත්ත්වය කල්තියා හඳුනාගැනීම සඳහා සෞඛ්‍ය වර්ධන සටහන භාවිතය ප්‍රවර්ධනය කිරීම | PDHS | FHB, PDHS, RDHS, MOH | X | X | X | X | X | 0 Mn | දෙමාපියන් විසින් හඳුනාගෙන යොමු කරන ලද ආබාධිත සංඛ්‍යාව | MCH වර්තාව |
| | සංවර්ධන ප්‍රමාදයන් සහිත දරුවන්ගේ පවුල් මට්ටමේ රැකවරණය පිළිබඳව රැකවරණ සපයන්නන් පුහුණු කිරීම සඳහා පහසුකම් සපයන්නන් බල ගැන්වීම | FHB | FHB, NSECD | | X | X | | | 5 Mn | පුහුණු කරන ලද පහසුකම් සපයන්නන් සංඛ්‍යාව | FHB-වාර්ෂික වාර්තාව |
| | ආබාධ සහිත දරුවන් සඳහා නිවාස රැකවරණය සැපයීම පිණිස රැකවරණ සපයන්නන් පුහුණු කිරීම | PDHS | PDHS, RDHS, MOH | | X | X | X | X | 8.1 Mn | පුහුණු කරන ලද රැකවරණය දෙන්නන් සංඛ්‍යාව | MCH වර්තාව |

උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 02:

# මුල් ළමාවිය අධ්‍යාපනය

**සුවිශේෂී අරමුණ:**
**අතිශයින් අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්වයේ පසුවන ළමයින් ඇතුළු ව මුල් ළමාවියේ සියලුම ළමයින්ට, ගුණාත්මක මුල් ළමාවිය අධ්‍යාපනයකට සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම.**

## මූලික විශ්ලේෂණය

අවම වශයෙන් වසරකවත් පෙර පාසල් අධ්‍යාපනය ලැබූ දරුවන්, පසු කාලීනව පාසලේ සාර්ථක වීමට අවශ්‍ය තීරණාත්මක වැදගත් කුසලතා සංවර්ධනය කර ගැනීමට වැඩි අවස්ථාවක් ඇති බවත් එකම ශ්‍රේණියක නැවත ඉගෙනීම හෝ පාසලෙන් ඉවත් වීමට ඇති ඉඩකඩ අඩු සහ ඔවුන් වැඩිහිටිභාවයට පත්වූ විට සාමකාමී, සමෘද්ධිමත් සමාජ සහ ආර්ථිකයන් කෙරෙහි දායක වන බවත් පර්යේෂණ සාක්ෂි සනාථ කරයි[20]. කෙසේ වෙතත්, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සමග ශ්‍රී ලංකාවේ ළමයින්ට එක් අවුරුදු පෙර පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීමට ශ්‍රී ලංකා රජය තම එකඟතාව පළ කර ඇත.

වත්මන් පාලන ව්‍යුහය අනුව, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ව්‍යවස්ථාපිත නියෝජිතායතනයක් ලෙස මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකාවේ සමස්ත මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සැකසීම, සම්බන්ධීකරණය සහ ඇගයීම සඳහා වගකීම දරයි[21]. එබැවින්, 2018 වර්ෂයේ එම අමාත්‍යාංශය විසින් සංවර්ධනය කර යාවත්කාලීන කරන ලද මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ, විශේෂයෙන් ම අවදානමට ලක්විය හැකි හා අවාසිදායක තත්ත්ව යටතේ සිටින සියලූ ම ළමයින්ට ගුණාත්මක මුල් ළමාවිය අධ්‍යාපනයට සමානාත්මක ප්‍රවේශයක් තහවුරු කිරීමට උපායමාර්ගික ක්‍රියාකාරකම් 18 ක් ඇතුළත් කර ඇත. මෙම බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ දී විවිධ අමාත්‍යාංශ වලට වගකීම් පැවරීම ඉහත කී උපායමාර්ග මත පදනම්ව සකස් කර ඇත.

20 Lancet ප්‍රකාශනමාලාව (ඔක්. 2016). මුල් ළමාවිය සංවර්ධනය උසස් කිරීම: විද්‍යාවේ සිට පරිමාණය දක්වා https://www.thelancet.com/series/ECD2016
21 කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය (2018) මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2018

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 1987 වර්ෂයේ සිදු කරන ලද 13 වැනි සංශෝධනය යටතේ පෙර පාසල් ලියාපදිංචිය, අධීක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ අධිකාරි බලය පළාත් ආණ්ඩු වෙත පවරා ඇත. මෙම අධිකාරි බලය ක්‍රියාත්මක කිරීම සඳහා, පළාත් සභා විසින් පළාත් ප්‍රඥප්ති මගින් මෙහෙයවනු ලබන මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථානය හෝ පෙර පාසල් සඳහා පළාත් ආයතන, කාර්යාංශය හෝ ඒකක ('පළාත් නියාමන අධිකාරි') පිහිටුවා ඇත. පෙර පාසල් නිසි ප්‍රමිතීන්ට අනුව ක්‍රියාත්මක වේද යන්න තහවුරු කර ගැනීමේ අරමුණින් පෙර පාසල් පරීක්ෂා කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ වගකීම රේඛීය අමාත්‍යාංශ වෙත පවරා ඇත.

ශ්‍රී ලංකාවේ පෙර පාසල් වාණිජ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වේ, නැතහොත් ලාභ නොලබන සංවිධාන ලෙස පවත්වාගෙන යයි. ශ්‍රී ලංකාවේ 2016 වර්ෂයේ පවත්වන ලද මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන පිළිබඳ ජාතික සංගණනය අනුව, රට පුරා පෙර පාසල් 19,668 ක් තිබුණි[23]. මෙයින් 71% ක් පුද්ගලික ආයතන හෝ පුද්ගලයන් විසින් කළමනාකරණය කරන ලද අතර, 19.8% ක් මහනගර සහ නගර සභා වැනි රාජ්‍ය ආයතන සහ පළාත් පාලන ආයතන විසින් ද, 6.8% ආගමික සංවිධාන විසින් සහ 3% රාජ්‍ය නොවන සංවිධාන (NGOs) විසින් ද කළමනාකරණය කරන ලදී. සමස්තයක් වශයෙන්, මෙම පෙර පාසල්වලින් 88.2% ක ගාස්තු අයකරන ලදී.

2016 සංගණනයට අනුව වයස අවුරුදු දෙකේ සිට පහ දක්වා ළමුන් 578,160 ක් පෙර පාසල්වලට ඇතුළත් කර ගෙන ඇති අතර වයස අවුරුදු තුනේ සිට පහ දක්වා ළමුන් සඳහා ඇතුළත් වීමේ අනුපාතය 55.6% කි[23]. නාගරික (67.6%), ග්‍රාමීය (47.5%) සහ වතු (43.9%) යන අංශ අතර කැපී පෙනෙන විෂමතාවයක් පවතින බව අංශය අනුව බඳවා ගැනීමේ අනුපාත මඟින් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, වත්මන් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ දත්ත (2022) අනුව, ක්‍රියාත්මක වන පෙර පාසල් සංඛ්‍යාව 19,216 දක්වා ද, පෙර පාසල් ළමුන් සංඛ්‍යාව 474,406[22] දක්වා ද අඩු වී ඇත.

රජය පෙර පාසල් අංශයේ ප්‍රමිතීන් සකස් කර නියාමනය කරයි. ගුරු ජනගහනය සලකා බැලීමේදී පෙර පාසල්වල සේවය කරන ගුරුවරුන් 28,449 න් 59.9% ක් අ.පො.ස (උසස් පෙළ) විභාගය සමත් වී ඇති බව 2016 සංගණනයෙන් අනාවරණය විය[23].

ගුරුවරුන්ගෙන් 83% ප්‍රතිශතයක් වසරක් හෝ ඊට වැඩි කාලයක් සඳහා වෘත්තීය පුහුණුවක් සම්පූර්ණ කර ඇතත්, වත්මන් ගුරුවරුන්ගෙන් 9.5% කට එවැනි කිසිදු සුදුසුකමක් නොතිබුණි. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි වී ඇත්තේ ඩිප්ලෝමා ප්‍රදානය කරන ආයතන 63ක් පමණි. දැනට පෙර පාසල් සඳහා නිසි ගාස්තු නියාමන ව්‍යුහයක් මෙන්ම ගුරුවරුන් සඳහා වැටුප් ව්‍යුහයක් ද නොමැත. දැනට ගුරුවරුන් 15,500ක් රජයෙන් ගුරු දීමනාව ලබා ගනී[24].

මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන සඳහා ජාතික ප්‍රමිතීන් 2019[25] දී ජාතික ලේකම් කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කර ඇති අතර පෙර පාසල් ගුරු මාර්ගෝපදේශයක් ද මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය සහ ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2022[26] වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇත. අවුරුදු 4 සහ අවුරුදු 5 වයසැති ළමුන් සඳහා සංවර්ධන ඇගයීම් ප්‍රමිතීන් ද ප්‍රකාශයට පත් කර ඇත[27,28,29].

---

22 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, ශ්‍රී ලංකාව (2019). පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

23 කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය (2016). මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය (2016). පෙර පාසල් සංඛ්‍යාලේඛන.

24 කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය (2016). මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය (2016). පෙර පාසල් සංඛ්‍යාලේඛන.

25 මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය (2019). මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජාතික ප්‍රමිතීන්

26 මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය සහ ජාතික අධ්‍යාපන ආයතනය (2022). පෙර පාසල් ගුරුවරුන්ගේ මාර්ගෝපදේශ. පළමු සංස්කරණය.

27 මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය (2015-2022). මුල් ළමාවිය ඇගයීම - තක්සේරුකරුවන් සඳහා මාර්ගෝපදේශ-වයස අවුරුදු 4.

28 මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය (2015-2022). මුල් ළමාවිය ඇගයීම - තක්සේරුකරුවන් සඳහා මාර්ගෝපදේශ-වයස අවුරුදු 5.

29 මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය (2015-2022). ළමා ඇගයීම - අතිරේක ද්‍රව්‍ය - වයස අවුරුදු 4-5.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නිර්මාණය වෙමින් පවතින බැවින් ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමය මේ වනවිට සංක්‍රාන්ති අවධියක පැවතීම සැලකිය යුතු කරුණකි. නියෝජිතායතන අතර සම්බන්ධීකරණයක් නොමැතිකම, තත්ත්ව ඇගයීමේ අනුකූලතාවක් නොමැතිකම, නෛතික බලය නොමැතිකම සහ ප්‍රවේශයේ අසමානතාවය යනාදිය ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන මුල් ළමාවිය අධ්‍යාපන අංශයේ හඳුනාගත් ප්‍රධාන අභියෝග වලට ඇතුළත් වේ. එබැවින් අනාගතයේදී ජාතික සහ පළාත් පාලනයේ මෙන්ම විෂයමාලා ව්‍යුහයේ වෙනස්කම් අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මුල් ළමාවිය අධ්‍යාපන මගින් සංවර්ධනය ප්‍රශස්ත කිරීම සඳහා වන සමස්ත ප්‍රතිපත්ති මඟපෙන්වීම් සහ ක්‍රියාකාරී සැලැස්මෙහි වලංගුභාවය එලෙසම පවතිනු ඇත. නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමෙන් පසුව, අනුකූලතාවය සහතික කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම නැවත සමාලෝචනය කිරීමට යෝජනා කෙරේ.

**2026-2030 වසර සඳහා වන සමස්ත අංශයේ අයවැය | රු. මි 13,071.2**

**උපායමාර්ගය 01** මධ්‍යස්ථාන පාදක වූ, ගුණාත්මක ව මුල් ළමාවිය අධ්‍යාපනයකට. සමාන හා සාධාරණ ප්‍රවේශයක් ලබා දීම සඳහා, අවශ්‍ය සේවාවන් සපයා නොමැති හා ඌන සේවා සැපයීමක් ඇති ප්‍රදේශ තුළ අත්‍යවශ්‍ය පහසුකම් සහිත අවකාශ හා ක්‍රියාපටිපාටි (spaces and procedures) පුළුල් කිරීමට පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මි රු. | | |
| **1.1** භූගෝලීය වශයෙන් පෙර පාසල් ව්‍යාප්ත වී ඇති ආකාරය, අවදානමට ලක්විය හැකි ළමයින් සඳහා අත්‍යවශ්‍ය පහසුකම් හා සහාය පාදක කොට ගෙන පෙර පාසල්වල තත්ත්ව විශ්ලේෂණය කිරීම | භූගෝලීය ව්‍යාප්තිය, පවතින පහසුකම්, අවදානමට ලක්විය හැකි ළමුන් සඳහා උපකාරක සේවා (උදා: පාසල් ආහාර වේල, ආබාධිත අය සඳහා ප්‍රවේශය), කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය සංයුතිය ඇගයීම ඇතුළුව ජාතික පෙර පාසල් සංගණනයක් පැවැත්වීම | MoE | NEC, NSECD, පළාත් ECE අධිකාරීන්, DCS, MWSEID-PHDT, MoPI, INGOs | | X | | | | 20 Mn | එක් එක් පළාතේ අවුරුදු 4-5 ජනගහනයට පෙර පාසල් සංඛ්‍යාව, ඇතුළත් වීමේ අනුපාත | MoE වෙබ් අඩවිය |
| **1.2** සියලුම පළාත්වල සේවා නොලබන හෝ ඌණ සේවා සහිත ප්‍රදේශවල පෙර පාසල්වල අවම ප්‍රමිතීන් ඉහළ නැංවීම. | පළාත් බලධාරීන් සමඟ නිරන්තර සංවාදයක් හරහා අවශ්‍යතා තක්සේරු කිරීම | MoE | NSECD, පළාත් ECE අධිකාරීන් MWSEID-PHDT, MoPI | X | X | X | X | X | 4 Mn | ගුණාත්මක භාවය සඳහා අවම ප්‍රමිතීන් සපුරාලන පෙර පාසල් % | ප්‍රාදේශීය ECE දත්ත සමුදාය |
| | අවශ්‍යතා තක්සේරුව මත පදනම්ව පෙර පාසල්වල අත්‍යවශ්‍ය පහසුකම් නංවාලීමට සහාය වීම සඳහා සංවර්ධන හවුල්කරුවන්/ ප්‍රජා සංවිධාන/පෞද්ගලික අංශය සමඟ කටයුතු කිරීම | MoE | NSECD, ප්‍රාදේශීය ECE අධිකාරීන් MWSEID-PHDT, MoPI | | X | X | X | X | 2,250.5 Mn | බාහිර ආයතන මගින් සහාය දක්වන පෙර පාසල් සංඛ්‍යාව | ප්‍රාදේශීය ECE දත්ත සමුදාය |
| | ආදර්ශ පෙරපාසල් ලෙස පහසුකම් නංවාලීම සඳහා අවම වශයෙන් එක් දිස්ත්‍රික්කයකට අවශ්‍යතා ඇති පෙර පාසල් 10කට සහයෝගය ලබා දීම. | MoE, පළාත් ECE අධිකාරීන් | NSECD | | | X | X | X | 37.5 Mn | උසස් කරන ලද පෙර පාසල් සංඛ්‍යාව/වර්ෂය | ප්‍රාදේශීය ECE දත්ත සමුදාය |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1.3** සාධාරණ ප්‍රවේශය සහතික කිරීම සඳහා දැරිය හැකි මිලට මුල් ළමාවිය අධ්‍යාපනය ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම | සේවා නොලබන ප්‍රදේශවල ගාස්තු අය නොකරන පෙර පාසල් ව්‍යාප්ත කිරීම සඳහා පාසල් ඇතුළු දැනට පවතින ඌන උපයෝජිත ගොඩනැගිලි යෙදවීමට පළාත් පාලන ආයතනවලට උපදෙස් දීම | MoE | NSECD, පළාත් ECE අධිකාරීන්පළාත් පාලන අමාත්‍යාංශය-MCs/UCs/ ප්‍රාදේශීය සභාව, CSOs | | X | X | | | 200 Mn | ECE මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම සඳහා උපයෝගී කරගත් ඌන උපයෝජිත ගොඩනැගිලි සංඛ්‍යාව | PCC කාර්ය සටහන් |
| | පෙරපාසල් වල ගාස්තු ව්‍යුහය ප්‍රමිතිකිරීම සඳහා විධිවිධාන හඳුන්වා දීම | MoE | MoF, මුදල් කොමිෂන් සභාව, පළාත් පාලන අමාත්‍යාංශය, NEC, පළාත් සභා, NSECD | | X | | | | 0.5 Mn | රෙගුලාසි තිබීම | NCC කාර්ය සටහන්/පළාත් ප්‍රඥප්ති |
| **1.4** ඌන සේවා සැපයෙන ප්‍රදේශවල මානව සම්පත් ආකර්ෂණය කර ගැනීමට සහ පවත්වා ගැනීමට ගුරුවරුන් සඳහා ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම | ආර්ථික ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි පෙර පාසල් ගුරුවරුන්ගේ දීමනා සංශෝධනය කිරීමට උපදෙස් ලබා දීම | NSECD & MoE | MoF, මුදල් කොමිෂන් සභාව, පළාත් පාලන අමාත්‍යාංශය, NEC, පළාත් සභා, NSECD | | X | | | | 0 Mn | එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ පෙර පාසල්වල ගුරු/ශිෂ්‍ය අනුපාතය | පෙර පාසල් සංසංඛ්‍යාවය |
| | සියලුම පළාත්වල පෙර පාසල් ගුරුවරුන් සඳහා අවම දීමනා ප්‍රමිතීන් ස්ථාපිත කිරීම | NSECD & MoE | මුදල් කොමිෂන් සභාව, පළාත් පාලන අමාත්‍යාංශය, MoE, පළාත් සභා | X | X | X | X | X | 10,000 Mn | පෙර පාසල් ගුරුවරුන් සඳහා අවම ගෙවීම් ප්‍රමිතීන් තිබීම | අයවැය වාර්තාව/පළාත් ප්‍රඥප්ති |

**උපායමාර්ගය 02** — යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ ධනාත්මක වූ වෙනස් කොට සැලකීමේ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් අතිශයින් අවදානම් සහිත සහ අවාසිදායක තත්ත්වයේ සිටින ළමයින් සඳහා මුල් ළමාවිය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **2.1** මුල් ළමාවිය අධ්‍යාපන සඳහා අත්‍යවශ්‍ය සහාය අවශ්‍ය, අවදානමට ලක් විය හැකි සහ අවාසිදායක තත්වයේ වෙසෙන කණ්ඩායම් හඳුනා ගැනීම | පෙර පාසල් වයසේ පසුවන අවදානමට ලක්විය හැකි දරුවන් පිළිබඳ ඇගයීමක් ප්‍රාදේශීය මට්ටමින් පවත්වාගෙන යාම. | NSECD | MoH, MWCA, DS, DPCCS, CSOs MWSEID-PHDT, MoPI, NCPA, DSS | | X | | | | 30 Mn | කොට්ඨාස මට්ටමින් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් හඳුනා ගෙන තිබීම | කොට්ඨාස CC කාර්ය සටහන් |
| **2.2** විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා අත්‍යවශ්‍ය පහසුකම් සහිතව පෙර පාසල් අවකාශය පුළුල් කිරීම | සාමාන්‍ය පෙර පාසල්වලට අවශ්‍ය අත්‍යවශ්‍ය පහසුකම් හා විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට අවශ්‍ය පහසුකම් පිළිබඳ ජාතික සම්මතයන් හඳුන්වා දීම | MoE | NECD, MoH, පළාත් පාලන අමාත්‍යාංශය, පුද්ගලික අංශය, INGOs පළාත් ECE අධිකාරීන් | | | X | X | X | 1.7 Mn | ජාතික සම්මතයන් ලැයිස්තුවක් තිබීම | - |
| | අන්තර්කරණ ක්‍රමවේද සහිත ආදර්ශ පෙර පාසල් පිහිටුවීම | MoE | NECD, MoH, පළාත් පාලන අමාත්‍යාංශය, පුද්ගලික අංශය, INGOs පළාත් ECE අධිකාරීන් | | X | X | X | | 125 Mn | අවම වශයෙන් එක් අන්තර්කරණ ක්‍රමවේද සහිත පෙර පාසලක් සහිත කොට්ඨාශ සංඛ්‍යාව | පළාත් ECE දත්ත සමුදාය |
| | ප්‍රධාන ධාරාවේ මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථානවලට ඇතුළත් කළ නොහැකි අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්වයේ වෙසෙන මුල් ළමාවිය දරුවන්ට අධ්‍යාපන සේවා සැපයීම (පරිවාස භාරයේ සිටින දරුවන්, මව්වරුන් සමඟ සිරගතව සිටින දරුවන්, දිගුකාලීන රෝගාබාධ සඳහා රෝහල් ගත කළ දරුවන් ආදිය) | පළාත් ECE අධිකාරීන් | PDPCCS/DSS/ MoH, PDHS, MoE, | | X | X | X | X | 81 Mn | එක් පළාතක් සඳහා ECE සේවා පුළුල් කිරීම් සංඛ්‍යාව | DPCCS දත්ත |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2.3** අවදානමට ලක්විය හැකි සහ අවාසි සහගත දරුවන් හසුරු කිරීම සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | අවාසිදායක තත්වයේ වෙසෙන දරුවන්ට වෙනස් කොට සැලකීමකින් තොරව හසුරු කිරීම පිළිබඳ ගුරුවරුන් පුහුණු කිරීම | MoE, NSECD | FHB, ළමා රෝග විශේෂඥයින්ගේ විද්‍යාලය, ළමා මනෝචිකිත්සක විද්‍යාලය, පළාත් ECE බලධාරීන්, විශ්ව විද්‍යාල | | X | X | X | | 3 Mn | පවත්වන ලද ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | NIE වාර්ෂික වාර්තාව |

## උපායමාර්ගය 03

**ළමයින්ගේ ප්‍රශස්ත සංවර්ධනය සඳහා මුල් ළමාවිය අධ්‍යාපනයේ ඇති වැදගත්කම සහ රටක සංවර්ධනයට අවශ්‍ය මානව ප්‍රාග්ධන සංවර්ධනය කෙරෙහි බලපාන අන්දම පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්, නිලධාරීන් හා මහජනතාව අතර දැනුවත් බව ප්‍රවර්ධනය කිරීම.**

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මු. රු. | | |
| **3.1** මුල් ළමාවිය අධ්‍යාපනයේහි වැදගත්කම පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ නිලධාරීන්ගේ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම | ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ අනෙකුත් නිලධාරීන්ට මුල් ළමාවිය අධ්‍යාපනයේ හි වැදගත්කම පිළිබඳ උපදේශන සැසි පැවැත්වීම | MoE | NSECD, FHB, පර්යේෂකයන් සහ ශාස්ත්‍රඥයන්, MWSEID-PHDT, MoPI | X | X | X | | | 1.5 Mn | පවත්වන ලද උපදේශන රැස්වීම්/සැසි සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |
| | මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ නව පර්යේෂණ සාක්ෂි සහ සංවර්ධනය කෙරෙහි එහි බලපෑම හඳුන්වා දීම සඳහා බහුආංශික වැඩමුළු/ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම | MoE | NSECD, FHB, පර්යේෂකයන්, සහ ශාස්ත්‍රඥයන්, INGOs | | X | | | | 3 Mn | යාවත්කාලීන කරන ලද සහභාගිවන්නන් සංඛ්‍යාව | MoE-වාර්ෂික වාර්තාව |
| **3.2** ECE මධ්‍යස්ථානවල වැදගත්කම පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම | ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය ප්‍රචාරණ හරහා මුල් ළමාවිය අධ්‍යාපනයහි වැදගත්කම පිළිබඳව මහජනතාවගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම | MoE, NSECD | FHB, HPB, DSS, පළාත් ECE අධිකාරීන් | X | X | | | X | 4.5 Mn | පවත්වන ලද මාධ්‍ය ව්‍යාපාර සංඛ්‍යාව | MoE-වාර්ෂික වාර්තාව |
| | පූර්ව ප්‍රසව මව්වරුන් සහ කුඩා දරුවන් සිටින මව්වරුන් සඳහා සායන මධ්‍යස්ථානවල, ළමා සංවර්ධන මධ්‍යස්ථානවල දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | MoH | පළාත් ECE අධිකාරීන්, PDHS, RDHS, MOH, MWSEID-PHDT | X | X | X | X | X | 22.5 Mn | සායන මධ්‍යස්ථානවල පවත්වනු ලැබූ දැනුම්වත් කිරීම් සංඛ්‍යාව | MCH වාර්තා |

## උපායමාර්ගය 04

මධ්‍යස්ථාන පාදක කරගත් මුල් ළමාවිය අධ්‍යාපනය පුළුල් කිරීම සඳහා රජය , රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **4.1** මධ්‍යස්ථාන පදනම් කරගත් මුල් ළමාවිය අධ්‍යාපනය පුළුල් කිරීම සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය අතර සහයෝගීතාවයට පහසුකම් සැලසීම | මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා උනන්දුවක් දක්වන බහුවිධ නියෝජිතායතන අතර සහයෝගීතාවය සඳහා මධ්‍යම මට්ටමේ පාර්ශ්වකරුවන්ගේ ජාලයක් ස්ථාපිත කිරීම | NSECD & MoE | MoH, INGOs, CBOs, පෞද්ගලික අංශය, CSOs, MWSEID-PHDT | | X | | | | 0.5 Mn | මුල් ළමාවිය අධ්‍යාපනය සංසදයක් තිබීම | NCC කාර්ය සටහන් |
| | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව හරහා අවශ්‍යතා ඇති ප්‍රදේශවලට බහු ආංශික සහාය යොමු කිරීමට මධ්‍යම යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | NSECD & MoE | පළාත් ECE අධිකාරීන්, MoF | | X | X | X | X | 0 Mn | අරමුදල් ප්‍රමුඛතා සැලැස්මක් තිබීම | NCC කාර්ය සටහන් |
| | හවුල්කරුවන් අතර සහයෝගීතාවයට පහසුකම් සැලසීම සඳහා පළාත් මට්ටමේ මුල් ළමාවිය අධ්‍යාපන වැඩමුළු සංවිධානය කිරීම | පළාත් ECE අධිකාරීන් | MoE, NSECD, NIE, INGOs, CBOs, පෞද්ගලික අංශය, CSOs, MWSEID-PHDT | | | X | X | | 0.9 Mn | පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව | PCC කාර්ය සටහන් |

## උපායමාර්ගය 05

සංවර්ධනයට යෝග්‍ය (වයසට හා එක් එක් ළමයාට යෝග්‍ය) ව්‍යවහාර මගින් ළමයින්ගේ ශාරීරික, සමාජයීය චිත්තවේගීය සහ ප්‍රජානන සංවර්ධනය කිරීම හා ප්‍රාථමික පාසලට සුමට සංක්‍රාන්ත්‍රිය සඳහා මධ්‍යස්ථාන පාදක කරගත් මුල් ළමාවිය අධ්‍යාපනයේ ගුණාත්මක බව සහතික කිරීමට අදාළ ජාතික සහ පළාත් ආයතන ශක්තිමත් කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **5.1** මුල් ළමාවිය අධ්‍යාපනය මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම | පෙර පාසල්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා පළාත් ප්‍රඥප්ති හරහා අනිවාර්ය ලියාපදිංචි කිරීම, ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සහ අනුකූල නොවන විට සේවා අවසන් කිරීම සඳහා නීති හඳුන්වා දීම | පළාත් සභා | පළාත් පාලන අමාත්‍යාංශය, MoE, පළාත් ECE බලධාරීන්, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, MoJ, | | X | | | | 0.75 Mn | පළාත් ඇසෑ අධිකාරියේ ලියාපදිංචි පෙර පාසල් % | පෙර පාසල් සංසංඛ්‍යාවය |
| **5.2** පෙර පාසල්වල තත්ත්ව ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සඳහා ජාතික සහ පළාත් මට්ටමින් මානව සම්පත් ධාරිතාව වැඩි කිරීම | පෙර පාසල්වල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය සහ සමාලෝචනය කිරීම සඳහා ජාතික සහ පළාත් මට්ටමින් මානව සම්පත් ධාරිතාව වැඩි කිරීම | MoE, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් ECE අධිකාරීන් අධ්‍යාපන අධිකාරීන් | NSECD, MoF | | X | X | | | 25 Mn | ජාතික සහ පළාත් මට්ටමේ අධීක්ෂණ කාර්ය මණ්ඩල සංඛ්‍යාව | IMS |
| | මුල් ළමාවිය අධ්‍යාපන අධිකාරිය, මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් සහ සෞඛ්‍ය නිලධාරීන් ඒකාබද්ධව කටයුතු එකතු කිරීම මගින් පළාත් මට්ටමින් සහයෝගීතා අධීක්ෂණය ප්‍රවර්ධනය කිරීම | පළාත් ECE අධිකාරීන් | MoE, MoH, PDHS, PDPCCS | | X | X | | | 5 Mn | වර්ෂයකට සමාලෝචනය කරන ලද පෙර පාසල් % | පෙර පාසල් සංසංඛ්‍යාවය |
| **5.3** පළාත් මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ සමාලෝචන ක්‍රමය හඳුන්වා දීම | වාර්ෂිකව පළාත් මට්ටමේ මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ සමාලෝචන ක්‍රමය හඳුන්වා දීම | MoE | NEC, MWCA-NSECD, MoH, | | X | X | | | 1.35 Mn | වර්ෂයකට සිදු කරන ලද සමාලෝචන සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |

## උපායමාර්ගය 06

මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා ජාතික හර විෂය මාලාවක්/ ජාතික විෂය මාලා මාර්ගෝපදේශයක් සංවර්ධනය කිරීමට අදාළ පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **6.1** නව ප්‍රතිසංස්කරණ සමඟ ගැලපීම තක්සේරු කිරීමට වත්මන් මූලික විෂය මාලාව නැවත සලකා බැලීම | වත්මන් ගුරු මාර්ගෝපදේශය සමාලෝචනය කර යාවත්කාලීන කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පිහිටුවීම | MoE | NIE, NEC, NSECD, MoH, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, සංවර්ධන ළමා රෝග විශේෂඥයින් | | | X | | | 0.05 Mn | යාවත්කාලීන කළ මාර්ගෝපදේශ තිබීම | - |
| **6.2** ජාතික පෙරපාසල් විෂයමාලා පිළිබඳ මාර්ගෝපදේශය සියලුම පළාත්වලට හඳුන්වාදීම | ජාතික පෙර පාසල් ගුරු විෂයමාලා මාර්ගෝපදේශයක් හඳුන්වා දීම සඳහා පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් සෑම පළාතකම පැවැත්වීම | NIE/ පළාත් ECE අධිකාරීන් | MoE, NSECD, NEC | X | X | | | | 0.72 Mn | පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | PCC කාර්ය සටහන් |
| | දේශීය තත්ත්වයන්ට ගැලපෙන පරිදි, ජාතික ගුරු මාර්ගෝපදේශයට අනුකූලව, ක්‍රියාකාරකම් පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීමට පළාත් මුල් ළමාවිය අධ්‍යාපන බලධාරීන්ට පහසුකම් සැලසීම | MoE/ පළාත් ECE අධිකාරීන් | MoE, NSECD, INGOs | | X | X | | | 2.7 Mn | ක්‍රියාකාරකම් මාර්ගෝපදේශ තිබීම | - |
| **6.3** 6.3 පවතින ගුරු මාර්ගෝපදේශ සෑම වසර තුනකට ම වරක් සමාලෝචනය කිරීම | ගුරු මාර්ගෝපදේශ වසර තුනකට වරක් සමාලෝචනය කර යාවත්කාලීන කිරීම සඳහා නිර්දේශ ලබා දීමට කමිටුවක් පිහිටුවීම | MoE | NIE, NEC, NSECD, MoH, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, සංවර්ධන ළමා රෝග විශේෂඥයින් | | | X | | | 0.05 Mn | සමාලෝචන වාර්තාව | - |
| **6.4** ජාතික මාර්ගෝපදේශ සමඟ අනෙකුත් අතිරේක විෂයමාලාව ගැලපීම පිළිබඳ ඇගයීම් කිරීම | පෙර පාසල්වල උගන්වන අනෙකුත් අතිරේක විෂයමාලා සමාලෝචනය කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම: උදා: AMI | NIE | MoE, NEC, NSECD | | | X | | | 0.075 Mn | ඇගයීම පිළිබඳ වාර්තාව | - |

## උපායමාර්ගය 07

මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථානවලට අදාළ ව්‍යුහාත්මක හා ක්‍රියාවලි ප්‍රමිතිවලට මෙන් ම මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතිවලට අනුකූලතාව දැක්වීම සඳහා සියලු ජාතික සහ පළාත් ආයතන වලට පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **7.1** මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ නව ජාතික ප්‍රමිතීන් සියලුම ජාතික සහ පළාත් බලධාරීන්ට හඳුන්වා දීම | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රමිතීන් ජාතික මට්ටමේ සියලුම පාර්ශ්වකරුවන්ට හඳුන්වා දීම | NSECD/ MoE | NIE, NEC, MoH, MWSEID-PHDT | X | X | | | | 1 Mn | සහභාගී වූ පාර්ශ්වකරුවන් සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |
| | පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් හරහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජාතික ප්‍රමිතීන් සියලුම පළාත්වලට හඳුන්වා දීම. | NSECD/ MoE | NIE, NEC, MoE, පළාත් ECE අධිකාරීන්, PDHS, MWSEID-PHDT | X | X | | | | 2.7 Mn | පවත්වන ලද පුහුණුවීම් සංඛ්‍යාව | PCC කාර්ය සටහන් |
| | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජාතික ප්‍රමිතීන් පිළිබඳව සියලුම පෙර පාසල් ගුරුවරුන් සහ කළමනාකරුවන් පුහුණු කිරීම | පළාත් ECE අධිකාරීන් | INGOs MWSEID-PHDT | X | X | | | | 9 Mn | පවත්වන ලද පුහුණුවීම් සංඛ්‍යාව | පළාත් ECE දත්ත සමුදාය |
| | සියලුම පෙරපාසල් ගුරු පුහුණු වැඩසටහන්වල විෂයමාලාවට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජාතික ප්‍රමිතීන් ඇතුළත් කිරීම | MoE / NIE | TVC, NSECD, MoE, | X | X | | | | 4 Mn | යාවත්කාලීන කරන ලදී විෂයමාලා සංඛ්‍යාව | TVC දත්ත |
| **7.2** අවම ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන ප්‍රවර්ධනය කිරීම සහ ඊට පහසුකම් සැලසීම | අදාළ ක්ෂේත්‍රයේ අවම ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ මෙවලම් සංවර්ධනය කිරීම | MoE / NSECD/ පළාත් ECE අධිකාරීන් | PDHS, RDHS, MOH, MWSEID-PHDT, MoPI | | X | X | X | X | 0.2 Mn | අවම ප්‍රමිතීන්ට අනුකූල පෙර පාසල් සංඛ්‍යාව | පෙර පාසල් සංසංඛ්‍යාව වාර්තාව |
| | පෙර පාසල්වල ජලය සහ සනීපාරක්ෂාව ඇතුළු අවම ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම | පළාත් ECE අධිකාරීන් | MoE, NSECD, PDHS, RDHS, MOH, MWSEID-PHDT, MoPI | | X | X | X | X | 1.8 Mn | අවම ප්‍රමිතීන්ට අනුකූල පෙර පාසල් සංඛ්‍යාව | පෙර පාසල් සංසංඛ්‍යාව වාර්තාව |
| | ප්‍රමිතීන්ට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම පිණිස පෙර පාසල් සඳහා ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක හඳුන්වා දීම | MoE | පළාත් ECE අධිකාරීන්, PDHS, MWSEID-PHDT | | | X | | | 0.675 Mn | ශ්‍රේණිගත කිරීමේ පද්ධතියක් තිබීම | - |

**උපායමාර්ගය 08** — මුල් ළමාවිය අධ්‍යාපන හා සම්බන්ධ සියලු නිළධාරීන්ගේ (මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්/සහකාරවරුන්, අනෙකුත් අදාළ නිලධාරීන් සහ පෙරපාසල් ගුරුවරුන්) හැකියා හා වෘත්තීමය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **8.1** පෙර පාසල් ගුරුවරුන්ගේ වෘත්තීමය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම | මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන ගුරුවරුන් සඳහා අවම සුදුසුකම් නිර්වචනය කිරීම (උ/පෙළ, ඩිප්ලෝමා, NVQ මට්ටම) | MoE | TVEC, NIE, NSECD | | X | X | X | X | 0 Mn | නිශ්චිත අවම සුදුසුකම් තිබීම | NCC කාර්ය සටහන් |
| | ලකුණු දීමේ ක්‍රමය සංවර්ධනය කිරීම හරහා පෙර පාසල් ගුරුවරුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය CPD සිදු කිරීම | පළාත් ECE අධිකාරීන් | NIE, MoE, NSECD, | | X | X | X | X | 2.75 Mn | එක් එක් පළාතේ පවත්වනු ලැබූCPD වැඩසටහන් සංඛ්‍යාව | පළාත් ECE දත්ත සමුදාය |
| | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යයාපන සුදුසුකම් ලබා ගැනීමට පෙර පාසල් ගුරුවරුන් දිරිමත් කිරීම | MoE | NSECD, INGOs, විශ්වවිද්‍යාල | X | X | X | X | | 14 Mn | ECCD උපාධි/ පශ්චාත් උපාධි සුදුසුකම් සහිත ගුරුවරුන් සංඛ්‍යාව | පළාත් ECE දත්ත සමුදාය |
| **8.2** මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ට / සහකාර ළමා සංවර්ධන නිලධාරීන්ට මුල් ළමාවිය අධ්‍යාපන / සංවර්ධන සම්බන්ධ අඛණ්ඩ පුහුණු අවස්ථා ලැබෙන බව සහතික කිරීම | අඛණ්ඩ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම සහ ECE පිළිබඳ පුහුණු වැඩසටහන් නවීකරණය කිරීම | පළාත් ECE අධිකාරීන් | MoE, NSECD, PHDT | | X | X | X | X | 29.8 Mn | ගුරුවරුන් සඳහා පවත්වනු ලබන නව පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | අවශ්‍යතා ඇගයීම් වාර්තාව |
| | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යයාපන සුදුසුකම් ලබා ගැනීමට මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් දිරිමත් කිරීම සහ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා සුදුසුකම් ලබා ගැනීමට ළමා සංවර්ධන නිලධාරීන් දිරිමත් කිරීම | NSECD | විශ්වවිද්‍යාල, INGOs, PHDT | X | X | X | X | | 40 Mn | ECCD උපාධි/පශ්චාත් උපාධි සුදුසුකම් සහිතECCD නිලධාරීන් සංඛ්‍යාව | NSECD දත්ත සමුදාය |

**උපායමාර්ගය 09** මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන තුළ අන්තර්කරණ ක්‍රමවේද භාවිතා කිරීම සඳහා ඊට සම්බන්ධ කණ්ඩායම් වල ධාරිතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම හා අදාළ පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | ඔ රු. | | |
| **9.1** විශේෂ අවශ්‍යතා සහිත සහ අන්තර්කරණ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් හඳුනාගැනීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම | විශේෂ අවශ්‍යතා සහිත සහ අන්තර්කරණ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් හඳුනාගැනීම, ප්‍රතිකාර සඳහා යොමු කිරීම සහ ඔවුන්ගේ සංවර්ධනය තක්සේරුකිරීම පිළිබඳ ආධාරක මාර්ගෝපදේශ සකස් කිරීම | MoE-NIE | NSECD, MoH-FHB, DSS, AYATI centre | | | X | | | 0.275 Mn | මාර්ගෝපදේශ තිබීම | MoE-වාර්ෂික වාර්තාව |
| **9.2** අන්තර්කරණ අධ්‍යාපන ක්‍රියාවලීන් පිළිබඳ පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | අන්තර්කරණ ක්‍රියාවලීන් පිළිබඳ පළාත් පෙර පාසල් අධ්‍යාපන අධිකාරීන් සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | MoE-NIE | NSECD, MoH-FHB, DSS, AYATI centre | X | X | | | | 0.6 Mn | අන්තර්කරණ භාවිතයන් පිළිබඳ පවත්වනු ලැබූToT වැඩසටහන් සංඛ්‍යාව | පළාත් ECE දත්ත සමුදාය |
| | අන්තර්කරණ අධ්‍යාපන ක්‍රියාවලීන් පිළිබඳ පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම | පළාත් ECE අධිකාරීන් | NSECD, MoH-FHB, PDHS, DSS | | X | X | | | 1.8 Mn | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | පළාත් ECE දත්ත සමුදාය |

## උපායමාර්ගය 10

ළමයින්ගේ ඉගෙනුම, සංවර්ධනය හා පාසලට සූදානම (readiness for schooling) මැන බැලීම සඳහා පිළිගත් තක්සේරු ශිල්ප ක්‍රම (assessment techniques) භාවිතය, ප්‍රවර්ධනය සහ අදාළ පහසුකම් සැලසීම .

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **10.1** වයස අවුරුදු 4 සහ 5 ළමුන් තක්සේරු කිරීම සඳහා මුල් ළමාවිය පිළිබඳ තක්සේරු කිරීමේ ප්‍රමිතීන් භාවිතය ප්‍රවර්ධනය කිරීම | සංවර්ධිත තක්සේරුකරණය පිළිබඳ තක්සේරුකරුවන් සඳහා වන මුල් ළමාවිය තක්සේරුකරණ මාර්ගෝපදේශය භාවිතය සඳහා පෙර පාසල් ගුරුවරුන් ප්‍රවර්ධනය කිරීම | NIE | MoE, NSECD, පළාත් ECE අධිකාරීන් | | X | | | | 0.1 Mn | සංවර්ධන තක්සේරුව සඳහා වලංගු මෙවලම් පිළිබඳ දැනුම්වත්භාවය | පෙර පාසල් සංසංඛ්‍යාවය |
| | ළමා තක්සේරුකරණ මෙවලම් සහ අතිරේක තක්සේරුකරණ උපක්‍රම භාවිතය පිළිබඳව ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම | NIE | MoE, NSECD, පළාත් ECE අධිකාරීන්, INGOs | | X | X | X | | 2.1 Mn | පුහුණුව ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |
| **10.2** පාසලට සූදානම් වීමේ තක්සේරුකරණ මෙවලම් සංවර්ධනය කර වලංගු කිරීම | ශ්‍රී ලංකාව තුළ පාසලට සූදානම් වීමේ තක්සේරුකරණ මෙවලම් සංවර්ධනය කර වලංගු කිරීම | NIE | MoE, NSECD, විශ්වවිද්‍යාල, INGOs | | X | | | | 1.1 Mn | වලංගු පාසල් සූදානම ඇගයීමේ මෙවලම් තිබීම | මුද්‍රිත ද්‍රව්‍ය |

**උපායමාර්ගය 11** පෙර පාසල් ගුරුවරුන්ගේ සහ වෙනත් රැකවරණය සපයන්නන්ගේ වෘත්තීමය සංවර්ධන වැඩසටහන් වල ගුණාත්මකභාවය රැක ගැනීමේ ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **11.1** පෙර පාසල් ගුරුවරුන් සඳහා දැරිය හැකි උසස් තත්ත්වයේ පුහුණු පහසුකම් සංවර්ධනය කිරීම | පෙර පාසල් ගුරුවරුන් සඳහා රජයේ සහ පෞද්ගලික අංශයේ ආයතන හරහා පුහුණු පහසුකම් ලබාදීම ඉහළ නැංවීම | NIE, TVEC | MoE, පරිසර අමාත්‍යාංශය - VTA, විශ්වවිද්‍යාල, INGOs | | X | X | X | | 60 Mn | එක් එක් පළාතේ පෙර පාසල් ගුරු පුහුණු පාසල් සංඛ්‍යාව | පළාත් ECE දත්ත සමුදාය |
| | පුහුණුව ලබා ගැනීම සඳහා දිරිගැන්වීමේ පද්ධති ස්ථාපිත කිරීම | පළාත් ECE අධිකාරීන් | MoE, MoF, INGOs | | | X | X | | 30 Mn | දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් තිබීම | PCC කාර්ය සටහන් |
| | අඛණ්ඩ යාවත්කාලීන කිරීම තුළින් පුහුණු ගුරුවරුන් සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම | MoE, NEC, NSECD | NIE Dpt. Examination, TVEC | | | | X | | 1.125 Mn | බලපත්‍ර යෝජනා ක්‍රමයක් තිබීම | - |
| **11.2** පුහුණු වැඩසටහන්වල තත්ත්ව පාලනය/ ප්‍රතීතනය සහතික කිරීම | පුහුණු වැඩසටහන්වල තත්ත්ව පාලනය / ප්‍රතීතනය සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | MoE, NEC, NSECD | NIE, TVEC, MOE | | X | X | X | | 1 Mn | පුහුණු වැඩසටහන් සඳහා ප්‍රතීතන යාන්ත්‍රණයක් තිබීම | TVEC වෙබ් පිටුව |

## උපායමාර්ගය 12

ඉගෙනුමට බාධා වන ආකාරයේ සංවර්ධනය පමාවීමේ අවදානමක් පවතින සහ ආබාධ සහිත ළමයින් නො පමාව හඳුනා ගැනීම සඳහා වේලාසනින් මැදිහත්වීම සහතික කිරීම පිණිස අදාළ පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **12.1** ළමුන්ගේ සංවර්ධනය තක්සේරු කිරීම සඳහා ගුරුවරුන් විසින් භාවිතා කරන දැනට පවතින මෙවලම් යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය සමාලෝචනය කිරීම | වයස අවුරුදු 4 සහ 5 ළමුන්ගේ සංවර්ධනය, ගුරුවරුන් විසින් තක්සේරු කිරීම සඳහා දැනට භාවිතා කරන මෙවලම් නැවත සලකා බලා යාවත්කාලීන කිරීම | MoE | NSECD, NIE FHB, ශාස්ත්‍රඥයන් | | X | | | | 0.5 Mn | සංවර්ධන ඇගයීම පිළිබඳ යාවත්කාලීන මෙවලම් තිබීම | ප්‍රකාශයට පත් කළ ලේඛන |
| **12.2** දරුවන්ගේ සංවර්ධන ප්‍රමාදයන් සහ අනෙකුත් විශේෂ අවශ්‍යතා හඳුනාගැනීම සඳහා ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | පෙර පාසල් ගුරුවරුන් සඳහා ධාරිතාවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පළාත් ECE අධිකාරීන් | MoE, FHB, NSECD, NIE, සංවර්ධන විශේෂඥයින් | | X | X | | | 1.8 Mn | පුහුණු කළ ගුරුවරුන් සංඛ්‍යාව | වාර්ෂික වාර්තාව-MWCA |
| **12.3** දරුවන්ගේ සංවර්ධන ප්‍රමාදයන් සහ අනෙකුත් විශේෂ අවශ්‍යතා නො පමාව හඳුනා ගෙන අවශ්‍ය මැදිහත්වීම හරහා එය තහවුරු කිරීම | දිස්ත්‍රික් මට්ටමින් සෞඛ්‍ය අංශය සමඟ සහයෝගිත්වයෙන් යොමු කිරීමට ඇති මාර්ග ස්ථාපිත කිරීම (දිස්ත්‍රික් රෝහල්වල ළමා සංවර්ධන මධ්‍යස්ථාන) | FHB | NSECD, MoE, පළාත් ECE අධිකාරීන්, PDHS, RDHS, MOH, DSS | | X | | | | 1.8 Mn | ලේඛනගත කර සන්නිවේදනය කරන යොමු ලද කිරීමේ මාර්ග | ප්‍රකාශයට පත් කළ ලේඛන |

| **උපායමාර්ගය 13** | ළමයින්ගේ ඉගෙනුම හා සංවර්ධනය පෝෂණය කෙරෙන බව සහ ඔවුන්ගේ සංවර්ධනයට යෝග්‍ය බව සහතික කරනු සඳහා අධ්‍යාපනික ද්‍රව්‍ය හා සෙල්ලම් භාණ්ඩ වල ගුණාත්මකභාවය තහවුරු කරන යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම. | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **13.1** දැනට පවතින ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ මාර්ගෝපදේශනය සහ ප්‍රමිතීන්, ඉගෙනුම් මෙවලම්, උපකරණ සහ ගෘහ භාණ්ඩ පිළිබඳ ගෝලීය ප්‍රමිතීන්ට අනුගත වීම තහවුරු කිරීම | ඉගෙනුම් මෙවලම්, උපකරණ සහ ගෘහ භාණ්ඩ පිළිබඳ ගෝලීය ප්‍රමිතීන්ට අදාළ මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් අනුගත වීම නැවත සලකා බැලීම | MoE | NSECD, NIE, NEC | | X | X | | | 0.7 Mn | මුල් ළමාවිය අධ්‍යාපන ප්‍රමිතීන් සමග අනුගත මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් තිබීම | ප්‍රකාශයට පත් කළ ලේඛන |
| **13.2** පෙර පාසල්වල සංවර්ධනාත්මකව සුදුසු ඉගෙනුම් මෙවලම් භාවිතය අධීක්ෂණය කිරීම | පෙර පාසල් ප්‍රමිතීන් තක්සේරු කිරීමේ දී භාවිත කරනු ලබන අධීක්ෂණ මෙවලම් වලට තත්ත්ව ප්‍රමිතීන් සහිත ඉගෙනුම් මෙවලම් ඇතුළත් කිරීම | MoE | NSECD, NIE, NEC | | X | X | | | 2.5 Mn | නිසි ඉගෙනුම් ද්‍රව්‍ය භාවිතා කරන පෙර පාසල් % | පෙර පාසල් සමීක්ෂණය |
| **13.3** වෙළෙඳ පොළ මට්ටමේ නියාමනය සහ අධ්‍යාපන මෙවලම් අනුමත කිරීම සඳහා කේන්ද්‍රගත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට සහාය වීම | වෙළෙඳ පොළ මට්ටමේ නියාමනය සහ අධ්‍යාපන මෙවලම්, සෙල්ලම් භාණ්ඩ ආදිය සංවර්ධනාත්මක ලෙස සුදුසු යැයි තහවුරු කිරීම පිණිස අනුමත කිරීම සඳහා කේන්ද්‍රගත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට සහාය වීම | පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය | MoE, NSECD, NIE, NEC | | | X | | | 2 Mn | රෙගුලාසි තිබීම | ගැසට් නිවේදනය |

**උපායමාර්ගය 14** මධ්‍යස්ථාන පාදක ඉගෙනුම් පරිසරවල අන්තර්ක්‍රියා කිරීම සඳහා මව් බස භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **14.1** ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ භාෂා ප්‍රතිපත්තියක් සකස් කිරීම | භාෂා ප්‍රමිතීන් මත පදනම්ව පෙර පාසල් සිතියම්ගත කිරීම හා අධීක්ෂණය | MoE | NIE, NSECD, පළාත් ECE අධිකාරීන්, NEC | | X | | | | 0.125 Mn | භාෂාව මත පදනම් වූ පෙර පාසල් අනුරූපණය කිරීමේ හැකියාවක් පැවතීම | ප්‍රකාශයට පත් කළ ලේඛන |
| | පෙර පාසල්වල භාෂා භාවිතය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම | MoE | NIE, NSECD, Provincial ECE authorities, NEC | | X | | | | 0.125 Mn | පෙර පාසල්වල භාෂා භාවිතය පිළිබඳ මාර්ගෝපදේශ තිබීම | ප්‍රකාශයට පත් කළ ලේඛන |
| **14.2** දරුවාගේ මව් භාෂාවෙන් ගුණාත්මක ඉගෙනුම් මෙවලම් තිබීම සහතික කිරීම | සිංහල සහ දෙමළ භාෂාවලින් වයසට ගැළපෙන ඉගෙනුම් මෙවලම් සංවර්ධනය කිරීම | MoE | NIE, NSECD, පළාත් ECE අධිකාරීන්, NEC | | X | X | | | 2.4 Mn | ඉගෙනුම් ද්‍රව්‍ය මව් භාෂාවෙන් තිබීම | PECE දත්ත සමුදාය |
| **14.3** මව් භාෂාව නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ පෙර පාසල් ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | මව් භාෂාව නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ පෙර පාසල් ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | MoE | NIE, NSECD, පළාත් ECE අධිකාරීන්, NEC | | X | X | | | 0.95 Mn | පවත්වනු ලැබූ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සංඛ්‍යාව | PECE දත්ත සමුදාය |

## උපායමාර්ගය 15

මධ්‍යස්ථානගත මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | ඉ රු. | | |
| **15.1** පෙර පාසල් පිළිබඳ ප්‍රජා පාලනය දිරිමත් කිරීම | පෙර පාසල් කළමනාකරණ කමිටුව සඳහා පවතින ජාතික මාර්ගෝපදේශ නැවත සලකා බැලීම | MoE | NSECD, Provincial ECE authorities, | | X | X | | | 0.375 Mn | පෙර පාසල් කළමනාකරණ කමිටුව සඳහා සංශෝධිත මාර්ගෝපදේශ | ප්‍රකාශයට පත් කළ ලේඛන |
| | දැනට පවතින පෙරපාසල් කළමනාකරණ කමිටු ශක්තිමත් කිරීම | පළාත් ECE අධිකාරීන් | MoE, CBOs, NSECD, | | X | X | | | 0.9 Mn | ක්‍රියාකාරී පෙරපාසල් කළමනාකරණ කමිටු සංඛ්‍යාව | PECE දත්ත සමුදාය |
| **15.2** පෙර පාසල් පවත්වාගෙන යාමේදී ප්‍රජා ආධාරක පද්ධති දිරිමත් කිරීම | මව් හවුල් පෙර පාසල් සමඟ සම්බන්ධ කිරීම | පළාත් ECE අධිකාරීන් | CBOs, MOHs | | X | X | X | | 0 Mn | සෞ.වෛ.නි. ප්‍රදේශයක මව් හවුල් සමඟ සම්බන්ධ වූ පෙර පාසල් සංඛ්‍යාව | PECE දත්ත/ PHM දත්ත |
| | විභව ආධාරක පද්ධති හඳුනා ගැනීම සඳහා පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංසදයට සහභාගී වීම සඳහා සියලුම පෙර පාසල් දිරිමත් කිරීම | පළාත් ECE අධිකාරීන් | CBOs, INGO, NGO, Pvt Sector, well wishers | | | X | X | X | 1.35 Mn | ආධාරක පද්ධතියකට සම්බන්ධ පෙර පාසල් සංඛ්‍යාව | පෙර පාසල් සංසංඛ්‍යාවය |

**උපායමාර්ගය 16** නිවස පදනම් කරගත් ඉගෙනුම් පරිසර සංවර්ධනය කිරීම සඳහා දෙමව්පියන්ගේ සහ පවුල්වල ශක්‍යතා වර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම සහ අදාළ පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **16.1** නිවස පදනම් කරගත් ඉගෙනුම් පරිසරයන් වැඩිදියුණු කිරීම සඳහා දෙමාපියන් සහ පවුල් සවිබල ගැන්වීම සඳහා අදාළ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | දෙමව්පියන් දිරිගැන්වීම හරහා අන්තර්කරණ ළමා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අදාළ නිලධාරීන්ගේ (මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්, පෞ.සෞ.සේ. නිලධාරීන්, පෙර පාසල් ගුරුවරුන්) ධාරිතා සංවර්ධනය කිරීම | NSECD | MoH, පළාත් ECE, MWSEID-PHDT, | | X | | | | 1.8 Mn | පුහුණු කළ නිලධාරීන් සංඛ්‍යාව (ECCD නිලධාරීන්, PHMs) | NSECD දත්ත සමුදාය |
| | නිවස පදනම් කරගත් ඉගෙනීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට "සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රවේශ ක්‍රමය" හඳුන්වාදීම පිණිස පෞ.සෞ.සේ. නිලධාරීන් සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | HPB | MoE, NSECD, FHB, පර්යේෂකයන්, ශාස්ත්‍රඥයන් | | X | X | X | | 10 Mn | පුහුණු කරන ලද පහසුකම් සපයන්නන් සංඛ්‍යාව | HPB දත්ත සමුදාය |
| **16.2** පුහුණු නිලධාරීන් හරහා නිවස පදනම් කරගත් මුල් ළමාවිය අධ්‍යාපන පිළිබඳ පවුල් සහ ප්‍රජා සාමාජිකයින් අතර කුසලතා, අවබෝධය සහ උද්යෝගය වැඩි දියුණු කිරීම | නිවස පදනම් කරගත් මුල් ළමාවිය අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා පුරුෂ සහභාගීත්වය දිරිමත් කිරීම | NSECD | පළාත් ECE ඒකක, DPBCCS, MOH-PHMs/PHIs | | X | | | | 0.45 Mn | පුරුෂ සහභාගීත්වය දිරිගැන්වීම සඳහා පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව | NSECD දත්ත |
| | මත්පැන් සහ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අධෛර්යමත් කිරීම තුළින් නිවෙස් පරිසරය ප්‍රශස්ත කිරීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | PDHS | NSECD-ECCD නිලධාරීන්, NATA, ADIC, MOH-PHMs/ PHIs, MWSEID-PHDT | | X | | | | 0.45 Mn | පවත්වන ලද දැනුම්වත් කිරීමේ ව්‍යාපාර සංඛ්‍යාව | PDHS දත්තපද්ධති |
| | නිවස පදනම් කරගත් ඉගෙනීම වැඩිදියුණු කිරීම සඳහා ආධාරක පරිසරයක් නිර්මාණය කිරීමට නව/පවතින ප්‍රජා කණ්ඩායම් හරහා "ක්‍රියාකාරී ප්‍රජා රැකවරණ කණ්ඩායම්" පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම | NSECD | ECCD නිලධාරීන්, MOH-PHMs/ PHIs, CBOs | | X | X | X | X | 0 Mn | වසරකට නිර්මාණය කරන ලද ක්‍රියාකාරී "ප්‍රජා රැකවරණ කණ්ඩායම්" සංඛ්‍යාව | NSECD දත්ත |

**උපායමාර්ගය 17** මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා හිතකර පවුල් පරිසරයක් ඇති කරනු පිණිස බහුවිධ හේතු (සමාජ - ආර්ථික තත්ත්වය, නුගත්කම, සංක්‍රමණ, දෙමව්පියන් වෙන්වීම, ආබාධිත තත්ත්වයකට පත්වීම) මත අවදානමට ලක්වූ ළමයින්ගේ පවුල් ඉලක්ක කරගත් වැඩසටහන් සහ සේවා ප්‍රවර්ධනය කිරීම සහ අදාළ පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **17.1** විවිධ හේතු නිසා අවදානමට ලක්ව ඇති බවට හඳුනාගෙන ඇති ළමුන් බහුවිධ පාර්ශ්වවල සහභාගීත්වයෙන් සිතියම්ගත කිරීම | පෞ.සෞ.සේ. නිලධාරීන් මගින් ළමා සෞඛ්‍ය සංවර්ධන සටහන් හරහා නිවසේ අවදානම් සාධක සඳහා ඉහළ අවදානම් ලකුණු ඇති දරුවන් හඳුනා ගැනීම. | MOH | - | | X | | | | 0 Mn | MOH ප්‍රදේශයක අවදානම් සහිත ළමුන් සංඛ්‍යාව | MCH වාර්තා |
| | මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්, පරිවාස නිලධාරීන්, සමාජ සේවා නිලධාරීන් ඇතුළු අනෙකුත් අංශ නිලධාරීන් හරහා, අවදානමට ලක්ව ඇති දරුවන් හඳුනා ගැනීම | PDPCCS | DSS, NSECD, NCPA, Police | | X | | | | 0 Mn | දිස්ත්‍රික් ලේකම් ප්‍රදේශයක අවදානම් සහිත ළමුන් සංඛ්‍යාව | DS කාර්යාල දත්ත |
| **17.2.** වයස අවුරුදු 0-5 අතර අවදානම් සහිත දරුවන් සඳහා හිතකර ගෘහ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් | සංක්‍රමණයට අවසර දීමට පෙර සංක්‍රමණික දෙමාපියන්ගේ දරුවන් හට හිතකර ගෘහ පරිසරයක් පිළියෙළ කිරීම් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | NSECD | Foreign employment bureau, DSS, MOH, PDPCCS, INGO | X | X | | | | 1.8 Mn | පූර්ව පිළියෙළ කිරීම්වල අවශ්‍යතාවය පිළිබඳව දැනුම්වත් කරන ලද පවුල් සංඛ්‍යාව | වාර්ෂික වාර්තාව |
| | ළමුන් සඳහා හිතකර ගෘහ පරිසරයක් සහතික කිරීමේ වැදගත්කම පිළිබඳව ළමා සුභසාධන සායනවලදී දැනුම්වත් කිරීමේ සැසි පැවැත්වීම | MOH | NSECD, PDPCCS, NCPA | X | X | X | | | 5.25 Mn | පවත්වන ලද දැනුම්වත් කිරීමේ සැසි සංඛ්‍යාව | MCH සමාලෝචනය |
| **17.3.** අවදානම් සහිත දරුවන් ඔවුන්ගේ නිවෙස් පරිසරය තුළ අධීක්ෂණය කිරීම සහ ඔවුන්ට අත්‍යාවශ්‍ය සේවා සැපයීම | අවදානම් සහිත දරුවන් නිවෙස් ආශ්‍රිතව නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් බහු පාර්ශවීය කණ්ඩායමක් පිහිටුවීම | PDPCCS | NCPA, NSECD, PDHS, Police | X | X | | | | 6.5 Mn | මට්ටමින් බහු විෂය කණ්ඩායමක් තිබීම | MCH සමාලෝචනය |

**උපායමාර්ගය 18** හදිසි සහ ආපදා අවස්ථාවල දී මුල් ළමාවිය අධ්‍යාපනය අඛණ්ඩව පවත්වා ගෙන යාම සහතික කරනු පිණිස අදාළ ජාතික සහ පළාත් ආයතන වෙත පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **18.1** හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීමේදී මුල් ළමාවිය අධ්‍යාපනය අඛණ්ඩව කරගෙන යාමට සැලසුම් ඇතුළත් කිරීම | සියලූම පළාත් මුල් ළමාවිය අධ්‍යාපන බලධාරීන් විසින් මුල් ළමාවිය අධ්‍යාපනය අඛණ්ඩව කරගෙන යාමට අත්‍යාවශ්‍ය සම්පත් සැපයීම ඇතුළු සියළුම ආපදා යෙදවීමේ සැලසුම් සකස් කිරීම | පළාත් ECE අධිකාරීන් | MoD-DMC, MoE, MWCA. DPCCS | X | X | | | | 0.45 Mn | සියලූම පෙරපාසල් සඳහා ආපදා පෙරසූදානම් සැලසුම් තිබීම | PCC කාර්ය සටහන් |
| | හදිසි සහ ආපදා අවස්ථාවන්හිදී මුල් ළමාවිය අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳව ගුරුවරුන් සහ දෙමාපියන් දැනුම්වත් කිරීම | පළාත් ECE අධිකාරීන් | MoD-DMC, DPCCS | | X | | | | 0.9 Mn | පුහුණුව ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව | PCC කාර්ය සටහන් |
| **18.2** ආපදා අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගැනීමට හදිසි මුල් ළමාවිය අධ්‍යාපනය අරමුදලක් පළාත් මට්ටමින් පිහිටුවීම | හදිසි මුල් ළමාවිය අධ්‍යාපන අරමුදලක් පිහිටුවීම සඳහා පළාත් පාලන ආයතනවලට සහාය දැක්වීම | පළාත් ECE අධිකාරීන් | පළාත් සභාව, MoE | | X | X | | | 0.4 Mn | හදිසි අරමුදලක් තිබීම | PCC කාර්ය සටහන් |

## උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 03:

# රැකවරණය සහ ආරක්ෂාව

**සුවිශේෂී අරමුණ:**
**ප්‍රචණ්ඩත්වය, අපයෝජනය සහ නොසලකා හරිනු ලැබීම නිසා රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය වන ළමයින් ට විශේෂ අවධානය යොමු කරමින් මුල් ළමාවියේ පසුවන සියලූම ළමයින්ට, රැකවරණය සහ ආරක්ෂාව සලසන ගුණාත්මක සේවාවන් සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම.**

## මූලික විශ්ලේෂණය

ශ්‍රී ලංකා රජය 1990 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට (UN-CRC) අත්සන් කිරීමෙන් සහ 1991 ජූලි 12 දින එය අපරානුමත කිරීමෙන් දරුවන්ගේ රැකවරණය සහ ආරක්ෂාව සඳහා සිය කැපවීම පෙන්නුම් කළේය[30]. මෙම සම්මුතියට සමගාමීව ශ්‍රී ලංකා රජය විසින් 1992 වර්ෂයේදී 'ළමා ප්‍රඥප්තිය' කෙටුම්පත් කරන ලදී. තවද 'සන්නද්ධ ගැටුමට ළමුන් සම්බන්ධ කිරීම පිළිබඳ විකල්ප ක්‍රියාපටිපාටිය' 2000 වර්ෂයේදී අත්සන් කර අනුමත කරන ලද අතර 'ළමා ජාවාරම, ළමා ගණිකා වෘත්තිය සහ ළමා කාමුක දර්ශන පිළිබඳ විකල්ප ක්‍රියාපටිපාටිය' 2002 වර්ෂයේදී අත්සන් කර දී අනුමත කරන ලදී[31]. ඉහත සියලූ සම්මුතීන් ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමියා වන්නේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයයි. මෙම අමාත්‍යාංශය යටතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (DPCCS) එහි පළාත් පාර්ශ්වයන් සහ බිම් මට්ටමේ ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරීන් (CRPO) හරහා අයිතිවාසිකම් බලගැන්වීමේ වගකීම දරයි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA), ළමා අයිතිවාසිකම් සම්මුතිය පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුව සහ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, ළමා අයිතිවාසිකම් සහ ආරක්ෂාව බලාත්මක කිරීම සඳහා වගකිව යුතු කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට අයත් අනෙකුත් අංශ වේ. 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතෙන් පැවරී ඇති බලතල අනුව, ළමා ආරක්ෂක අධිකාරිය විසින් 'ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්' සකස් කර ඇත[32].

---

30 ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය, 1989 නොවැම්බර් 20 දින මහා සභා යෝජනා සම්මතය 44/25

31 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය. http://www.probation.gov.lk/

32 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (2019). ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

සියලූම පාර්ශ්වකරුවන් විසින් එකඟ වූ පරිදි, මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සදහා වූ මෙම ක්‍රියාකාරී සැලැස්ම හරහා ළමා ආරක්ෂාව සඳහා යෝජනා කරන ලද ක්‍රියාමාර්ග මෙම ප්‍රතිපත්ති රාමුවේ අන්තර්ගතය වඩාත් තහවුරු කිරීමට දායක වී ඇති අතර ඒවා උල්ලංඝනය කිරීමක් සිදු නොවේ. එම අමාත්‍යාංශය විසින්ම සකස් කරන ලද ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය[33] සහ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන ජාතික ප්‍රතිපත්තිය[34] මෙම ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීමේදී සලකා බලන ලදී.

දරුවන් ජීවත් වන පරිසරය කුමක් වුවද එම දරුවන්ගේ රැකවරණය සහ ආරක්ෂාව සහතික කිරීම ශ්‍රී ලංකාවට අතිශය අභියෝගයක් වී ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ ළමා අපචාර සහ අනෙකුත් අදාළ පැමිණිලි පිළිබඳ දත්ත සමුදායක් පවත්වාගෙන යනු ලබයි. 2023-10-31 වනවිට, ප්‍රවර්තන වර්ෂය සඳහා සියලූම දිස්ත්‍රික්කවලින් ළමා අපචාර පිළිබඳ පැමිණිලි 7973ක් ලැබී ඇත[35]. 2015 සිට 2020 දක්වා සෑම වසරකම වැඩිම සිදුවීම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. 2018 වසරේ නිකුත් කරන ලද එක්සත් ජාතීන්ගේ වාර්තාවකට අනුව, වසර පහකට පෙර, ලිංගික ජාවාරම් සහ බලහත්කාර ශ්‍රමය සඳහා ළමා, කාන්තා සහ පිරිමි ජාවාරම්කරුවන්ගේ ප්‍රධාන ගමනාන්තය ශ්‍රී ලංකාව විය[36].

බොහෝ ශ්‍රී ලාංකිකයන් තම නිවෙස්වල හුරුපුරුදු වටපිටාවේ දරුවන් ඇති දැඩි කිරීමේ වැදගත්කම අගය කළත්, දරුවන් තම නිවෙස්වලින් ඉවත් කරනු ලැබීමට හේතු වන කරුණු කිහිපයක් තිබේ. නේවාසික රැකවරණයේ සිටින ළමුන්ගෙන් 31% කට දෙමාපියන් දෙදෙනාම සිටින බවත්, 50% කට එක් දෙමාපියෙකු සිටින බවත්, 18% ක් පමණක් අනාථ දරුවන් බවත් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා පරිවාස දෙපාර්තමේන්තුව විසින් ළමාරක්ෂක ආයතනවල 2019 වර්ෂයේදී පවත්වන ලද ළමා සංගණනයෙන් හෙළි වී ඇත. ආර්ථික දුෂ්කරතා, අධ්‍යාපනය ලබා දීමට නොහැකි වීම, ආබාධිතභාවය, ගෘහස්ථ හිංසනය, කායික හෝ මානසික රෝග, දෙවන විවාහ සහ ශ්‍රම සංක්‍රමණය හේතුවෙන් බොහෝ දෙනා නේවාසික රැකවරණ ස්ථාන වෙත ළමුන් ඇතුළත් කිරීමට යොමු වී ඇත[37].

දත්තවලට අනුව, ශ්‍රී ලංකාව තුළ ළමාරක්ෂක ආයතන 379ක් ඇත. ඉන් 331ක් (87.3%) ස්වේච්ඡා ළමා නිවාස වේ. ළමා රැකවරණ ආයතන බහුතරයකට රජයෙන් හැර වෙනත් මූලාශ්‍රවලින් අරමුදල් සපයනු ලැබේ. ළමා රැකවරණ ආයතන 229ක් ඔවුන්ගේ ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය ලෙස රාජ්‍ය නොවන දේශීය අරමුදල් බවට වාර්තා කර ඇත. මෙම ආයතනවල ළමුන් 10,632 ක් සිටි අතර, ඉන් 5.5% ක් අවුරුදු 5 ට අඩු ළමුන් වේ. මෙම අවදානමට ලක්විය හැකි ළමුන් සඳහා රැකවරණය සහ ආරක්ෂණ සැලසුම්වල විශේෂයෙන් අවධානයක් යොමු කිරීමට සිදු විය[38].

ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දී සිටින තවත් සැලකිල්ලක් දැක්විය යුතු කාරණයක් වන්නේ, පොදු ජනතාවට ළමා දිවා සුරැකුම් සේවා ලබා ගැනීමේ හැකියාව සහ ඒවායේ ගුණාත්මක භාවයයි. 2017 ලෝක බැංකු වාර්තාවකට අනුව, නිවසේ වයස අවුරුදු පහට අඩු දරුවෙකු සිටීම, කුඩා දරුවන් නොමැති කාන්තාවන්ට වඩා කාන්තාවන් ශ්‍රම බලකායට බැඳීමේ සම්භාවිතාව 7.4% කින් අඩු කරයි[39]. දැනට, ළමුන් 24,000ක් දක්වා සේවා සපයන රට තුළ ක්‍රියාත්මක වන දිවා සුරැකුම් මධ්‍යස්ථාන 1,200ක් නියාමනය කිරීමට රාමුවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් 2017 වසරේ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශ හඳුන්වා දෙන ලදී.

විකල්ප රැකවරණ සේවා ලබාගැනීම, එහි ගුණාත්මකභාවය, සහ ඊට ප්‍රවේශවීම සහතික කිරීම දිරිමත් කරමින් පවුල්වල සහ ප්‍රජාවන් තුළ ළමා රැකවරණය සහ ආරක්ෂාව පිළිබඳ ගැටලූ විසඳීමට මෙම NMSAP-ECCD 2026-2030 සැලැස්ම උත්සාහ කර ඇත.

---

33 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (n.d.). ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය
34 කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය (2019). ජාතික දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රතිපත්තිය-අවසන් කෙටුම්පත
35 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (2023). සංඛ්‍යාලේඛන. https://childprotection.gov.lk/images/lem-statistics/Statistical-data-as-at-20231031.pdf
36 මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (2018) දකුණු ආසියාවේ නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ මත්ද්‍රව්‍ය හා අපරාධවලට එරෙහිව කටයුතු කිරීම. https://www.unodc.org/documents/southasia/Promoting_the_Rule_of_Law_Final_Rev.pdf
37 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (2019) ළමාරැකවරණ ආයතනවල ළමුන්ගේ සංසංඛ්‍යාවය
38 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (2019). ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශ
39 ලෝක බැංකු සමූහය (2017). රැකියාවට යාම: ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ කාන්තා විභවය අගුළු හැරීම. https://openknowledge.worldbank.org/bitstreams/ddd89d0f-ff97-50b4-87df-e4efebecad5a/download

**2026-2030 වසර සඳහා වන සමස්ත අංශයේ අයවැය | රු. මි 1,493.5**

**උපායමාර්ගය 01** සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම සඳහා ජාතික සහ පළාත් ආයතනවල පවතින රැකවරණ හා ආරක්ෂණ සේවා සහ මැදිහත්වීම් මුල් ළමාවියේ පසුවන ළමයින්ට සුවිශේෂීව සැපයීම ප්‍රවර්ධනය කිරීම හා අදාළ පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **1.1**<br>සාධාරණ ප්‍රවේශය සහතික කිරීම සඳහා ජාතික සහ පළාත් මට්ටමින් රැකවරණ සහ ආරක්ෂණ සේවා විධිමත් කිරීම. | ජාතික සහ පළාත් මට්ටමින් රැකවරණ සහ ආරක්ෂණ සේවා සපයන්නන්ගේ අඛණ්ඩ මෙහෙයුම්/ සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | MWCA | DPCCS, NCPA, NSECD පළාත් ECE අධිකාරීන්, Police, PDHS | X | X | X | X | X | 6 Mn | හොඳින් සම්බන්ධීකරණ කළ සේවා ව්‍යුහයක් තිබීම | NSC සහ PCC කාර්ය සටහන් |
| | සියලුම ග්‍රාම නිලධාරී කොට්ඨාශවල ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු (VCDC) පිහිටුවා සක්‍රීය කිරීම | DPCCS | PDPCCS, NCPA, PDHS, DS, MOH | X | X | X | X | X | 8.1 Mn | සක්‍රීය VCDC සහිත ග්‍රා.නි. කොට්ඨාශ % | DPCCS දත්ත |
| | සියලුම දිවා සුරැකුම් මධ්‍යස්ථාන පළාත් පරිවාස දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලියාපදිංචි කිරීම සහතික කිරීම (ව්‍යාපාර ලියාපදිංචිය) | PDPCCS | NCPA, DS | X | X | | | | 6 Mn | ලියාපදිංචි දිවා සුරැකුම් මධ්‍යස්ථාන % | DPCCS දත්ත සමුදාය |
| | සියලුම ළමා සංවර්ධන මධ්‍යස්ථාන (CDCs) පළාත් පරිවාස දෙපාර්තමේන්තුවේ හි ලියාපදිංචි කිරීම සහතික කිරීම | PDPCCS | NCPA, DS, MWSEID-PHDT | X | X | | | | 5 Mn | ලියාපදිංචි වී ඇති ළමා සංවර්ධන මධ්‍යස්ථාන% | DPCCS දත්ත සමුදාය |
| **1.2**<br>පවතින රැකවරණ සහ ආරක්ෂණ සේවාවන්හි විනිවිදභාවය වැඩි කිරීම | ලියාපදිංචි රැකවරණ සහ ආරක්ෂණ සේවාවන්හි වෙබ්අඩවිය ආශ්‍රිත දත්ත සමුදායක් සංවර්ධනය කිරීම | DPCCS | NCPA, NSECD, INGOs, පෞද්ගලික අංශය | | X | X | | | 7.5 Mn | දත්ත සමුදායක් තිබීම | DPCCS වෙබ් අඩවිය |
| | විශේෂයෙන්ම මුල් ළමාවිය ඉලක්ක කර ගනිමින් ළමා අයිතිවාසිකම් සහ පවතින රැකවරණ සහ ආරක්ෂණ සේවාවන් පිළිබඳ මාධ්‍ය ප්‍රචාරක වැඩසටහන්/දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම | NCPA | NSECD, ජනමාධ්‍ය අමාත්‍යාංශය, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය | | X | | | | 4 Mn | පවත්වන ලද මාධ්‍ය වැඩසටහන් සංඛ්‍යාව | ජනමාධ්‍යය |

**උපායමාර්ගය 02** මුල් ළමාවියේ පසුවන ළමයින් සහ ඔවුන්ගේ පවුල් සුවිශේෂ කර ගනිමින් සකසන ලද රැකවරණ හා ආරක්ෂණ සේවා සහ මැදිහත්වීම් සඳහා යොමු කෙරෙන මාර්ග ප්‍රවර්ධනය කිරීම හා අදාළ පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | ම රු. | | |
| **2.1** යොමු කිරීම් මාර්ග පිළිබඳ දැනුවත් කිරීම මහජනතාව අතර ප්‍රවර්ධනය කිරීම | සෘජු යොමු කිරීම පිණිස රැකවරණය සහ ආරක්ෂණ සේවා යොමු කිරීම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | NCPA | NSECD, DPCCS, MOH සායන, ජනමාධ්‍යය, MoPI, පොලිස් දෙපා. | | X | X | | | 4.6 Mn | පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | NCPA දත්ත සමුදාය |
| | ළමුන්/රජයේ හෝ වෙනත් බලධාරීන් විසින් සිදු කරනු ලබන ඕනෑම අපයෝජනයක්/සූරාකෑමක් පිළිබඳව දැනුම් දීම සඳහා ක්ෂණික දුරකථන සේවා ප්‍රවර්ධනය කිරීම | NCPA | ජනමාධ්‍යය, MOH සායන | | X | | | | 1 Mn | මසකට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | NCPA දත්ත සමුදාය |
| | වැඩිදුර කළමනාකරණය සඳහා සම්මත පෝරම භාවිතයෙන් සිද්ධි යොමු කිරීමට ග්‍රා.ළ.සං. කමිටු උනන්දු කරවීම | DPCCS | PDPCCS | X | | | | | 2.7 Mn | ග්‍රා.ළ.සං. කමිටු විසින් වසරකට කරන ලද යොමු කිරීම් සංඛ්‍යාව | PDPCCS දත්ත |
| **2.2** සිදුවීමට හැකි අනතුරුදායක තත්ත්වයන් සහ යොමු කිරීම් මාර්ග හඳුනාගැනීම පිළිබඳ දැනුවත් කිරීම පෙර පාසල් ගුරුවරුන් සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් අතර ප්‍රවර්ධනය කිරීම | දුර්වල රැකවරණය තත්ත්වයන් හා ආරක්ෂාව අඩු අවස්ථා කල්තියා හඳුනා ගැනීම පිළිබඳ ගුරුවරුන් පුහුණු කිරීම | DPCCS | MoE, NSECD, NCPA, DPCCS, පළාත් ECE අධිකාරීන්, MoH, පොලිස් දෙපා., MoPI | X | X | X | | | 5.4 Mn | පුහුණු කරන ලද ගුරුවරුන් සංඛ්‍යාව | DoP වාර්ෂික වාර්තාව |
| | මුල් ළමාවියේ පසුවන සියලුම දරුවන් සහ සුදුසු යොමුකිරීම් පිළිබඳ ළමා සංවර්ධන සටහනෙහි නිවාස අවදානම් සාධක පරීක්ෂා කිරීමේ මෙවලම භාවිතා කිරීමට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් උනන්දු කරවීම | FHB | PDHS/ RDHS/ MOH | X | X | | | | 0 Mn | ඉහළ අවදානම් ලකුණු සහිත ළමුන්ගේ % | MCH වාර්තා |

**උපායමාර්ගය 03** විරුද්ධව හඬක් නැගිය නො හැකි ළමයින් (මුල් ළමාවියේ වෙසෙන ළමයින් විරුද්ධව හඬක් නැගීමට තරම් කුඩා වැඩි ය) සහ ගර්භනී මවුවරුන් වෙනුවෙන්, ජාතික හා පළාත් ආයතන විසින් ආරම්භ කර දැනට පවත්වා ගෙන යනු ලබන රැකවරණ සහ ආරක්ෂණ සේවා පුළුල් කිරීමට අනුබල දීම සහ අදාළ පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | ම රු. | | |
| **3.1** අවශ්‍යතා ඇති දරුවන් සහ ගැබිනි මව්වරුන් සඳහා බහුආංශික මැදිහත්වීම හරහා සේවාවන් පුළුල් කිරීම | විශේෂ රැකවරණයක් අවශ්‍ය ගැබිණි මව්වරුන් (යොවුන් වියේ මව්වරුන්, ස්ත්‍රී දූෂණයට ලක් වූවන්, අසරණ භාවයට පත් වූ මව්වරුන්) සඳහා ආරක්ෂිත රැකවරණ මධ්‍යස්ථාන සහ රැකවරණ සේවා බහුආංශික මැදිහත්වීමෙන් ස්ථාපිත කිරීම | DSS | MOHs, DPCCS, INGOs, CSOs, පෞද්ගලික අංශය, පොලිස් දෙපා., MWSEI-PHDT | | X | X | X | | 50 Mn | පිහිටුවා ඇති නව නවාතැන් සංඛ්‍යාව | NCC කාර්ය සටහන් |
| | ප්‍රචණ්ඩත්වය/ නොසලකා හැරීම් හෝ වෙනත් ආකාරයේ අපයෝජන අවදානම් තත්ත්වයට මුහුණ දීම පිණිස ආබාධිත දරුවන් සඳහා නිවස පදනම් කරගත් රැකවරණ සහ ආරක්ෂණ සේවා සැපයීම | PDPCCS | NSECD, MOHs, DSS, INGOs, CSOs, පෞද්ගලික අංශය, ආබාධිතයන් පිළිබඳ ලේ.කා. | | X | X | X | X | 10.8 Mn | රැකවරණය යටතේ සිටින ළමුන් සංඛ්‍යාව | PDPCCS දත්ත |
| | වීථි ළමුන් සඳහා ආරක්ෂණ අවදානම් අවම කිරීම සහ රැකවරණය සැපයීම සඳහා වැඩසටහන් පැවැත්වීම | DSS | DPCCS, INGOs, CSOs, පෞද්ගලික අංශය, පොලිස් දෙපා. | | X | X | | | 10 Mn | සිදු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | - |
| **3.2** 'මිතුරු පියස' උපකාරක සේවාව, හඬක් නැගිය නො හැකි ළමුන් සහ ගැබිනි මව්වරුන් වෙත ළඟා වීමට හැකිවන පරිදි පුළුල් කිරීම | සියලුම ප්‍රාථමික සහ ද්විතියික රැකවරණ රෝහල් ආවරණය වන පරිදි මිතුරු පියසී මධ්‍යස්ථාන පුළුල් කිරීම | FHB | PDHS, Hosp. පරිපාලකයන්, DPCCS | X | X | | | | 50 Mn | මිතුරු පියසට පැමිණෙන සිද්ධි/ සේවාදායකයින් සංඛ්‍යාව | FHB සඳහා මිතුරු පියස වාර්තාව |
| **3.3** රැකවරණ සහ ආරක්ෂණ සේවා ආරම්භ කිරීමට රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා පාදක සංවිධාන වලට පහසුකම් සැලසීම | රැකවරණ සහ ආරක්ෂණ සේවා ආරම්භ කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා පාදක සංවිධාන වලට පහසුකම් සැපයීමට ඇති නිලධාරිවාදී සහ නීතිමය බාධක ඉවත් කිරීම | DPCCS | DPCCS, NCPA | | X | X | | | 0 Mn | ස්ථාපිත නව සේවා ස්ථාන සංඛ්‍යාව | PDPCCS දත්ත |

**උපායමාර්ගය 04** අතිශයින් අවදානමට ලක් වූ සහ අවාසිදායක තත්ත්වයේ වෙසෙන ළමයින් වෙත විශේෂ අවධානය යොමු කරමින්, බාල වියේ සියලු ම ළමයින් ආරක්ෂිත පරිසරයක රඳවා තැබීමට දෙමව්පියන්ට හැකිවන පරිදි පවුල් පාදක කරගත් ළමා සුරැකුම් මධ්‍යස්ථාන සහ අසල්වැසි සෙල්ලම් කණ්ඩායම් වැනි විකල්ප ළමා ආරක්ෂක මධ්‍යස්ථාන පිහිටු වීමට අනුබල දී ඒවාට පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මු. රු. | | |
| **4.1** දෙමාපියන්ට තම දරුවන් රඳවා තැබීම සඳහා පුහුණු කරන ලද රැකවරණ සපයන්නන් ඇතුළත් ප්‍රජා මධ්‍යස්ථාන පිහිටුවීම | ළමුන් පිළිබඳ විකල්ප යාන්ත්‍රණ සැලසුම් කර ග්‍රාමීය මට්ටමේ ක්‍රියාත්මක කිරීම සඳහා, ග්‍රාමීය මට්ටමේ පවතින කණ්ඩායම් (මවු හවුල් කණ්ඩායම් / වැඩිහිටි සමිති) ප්‍රවර්ධනය කිරීම | DS | FHB, HPB, MoPI, MWSEI-PHDT, DSS | X | X | X | X | X | 0 Mn | විකල්ප ළමා ආරක්ෂණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කරන ගම් මට්ටමේ ආයතන සංඛ්‍යාව | DS කාර්යාල දත්ත |
| **4.2** දැරිය හැකි මිලකට නිවෙස් පදනම් කරගත් ළමා දිවා සුරැකුම් සේවා ප්‍රවර්ධනය කිරීම | නිවස පදනම් කරගත් දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීමට කැමති කාන්තාවන් සිටින ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ එම මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම | PDPCCS | DS/ MCs/ UCs/ ප්‍රාදේශීය සභා, DSS, PDHS, NSECD NCPA, INGOs, CBOs, | | X | X | X | X | 11.2 Mn | ලියාපදිංචි ගෘහස්ථ දිවා සුරැකුම් සේවා සංඛ්‍යාව | DS කාර්යාල දත්ත |
| | ස්වයං රැකියා ව්‍යාපෘති ලෙස ගෘහස්ථ දිවා සුරැකුම් සේවා ආරම්භ කිරීම සඳහා අරමුදල් සැපයීමට පවතින ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රමය දිරිමත් කිරීම | DSS | පළාත් පාලන අමාත්‍යාංශය/ MCs/ UCs/ ප්‍රාදේශීය සභා, DSS, INGOs, CBOs | | X | X | X | X | 225 Mn | ක්ෂුද්‍රමූල්‍ය ණය හරහා ස්ථාපිත ගෘහස්ථ දිවා සුරැකුම් සේවා සංඛ්‍යාව | DS කාර්යාල දත්ත |
| **4.3** තම සේවකයන්ගේ දරුවන් සඳහා දිවා සුරැකුම් සේවා සැපයීමට සේවායෝජකයන් දිරිමත් කිරීම | තම සේවාදායකයන්ට ළමා රැකවරණ ආධාර සපයන සේවා යෝජකයන් (සහනාධාර, බදු සහන ආදිය) සඳහා මූල්‍ය ආධාර සහතික කිරීම. | MoL | වෙළඳ අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපා., කම්කරු දෙපා. | | X | X | | | 0 Mn | ලියාපදිංචි දිවා සුරැකුම් සේවා ඇති සේවා යෝජකයින් සංඛ්‍යාව | දේශීය ආදායම් දෙපා. දත්ත |
| **4.4** දිවා සුරැකුම් සේවා මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා පාසල් හා පෙර පාසල් ප්‍රවර්ධනය කිරීම | පාසලෙන් පසු රැකවරණය සහ ක්‍රියාකාරකම් මධ්‍යස්ථානවල රැකවරණය සැපයීම පිණිස පුහුණුව ලබා ගැනීම සඳහා පාසල් බලධාරීන් සහ ගුරුවරුන් දිරිමත් කිරීමට දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | MoE | NSECD, MoH, පෞද්ගලික අංශය | | | X | X | X | 450 Mn | දිවා සුරැකුම් පහසුකම් සහිත පාසල්/පෙර පාසල් සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාලේඛන |

**උපායමාර්ගය 05** අතිශයින් අවදානමට ලක් විය හැකි හා අවාසිදායක පවුල් වල ළමයින් ඇතුළු සියලු ළමයින්ගේ රැකවරණය සහ ආරක්ෂාව සඳහා සැපැයෙන සේවාවන්ගේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා අදාළ ජාතික සහ පළාත් ආයතන ශක්තිමත් කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | ම රු. | | |
| **5.1**<br>දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට අදාල අවම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම | රැකවරණය හා ආරක්ෂණ සේවා අධීක්ෂණය කරනු ලබන ජාතික සහ පළාත් පාලන නිලධාරීන් අතර දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට අදාල අවම ප්‍රමිතීන් සඳහා වන ජාතික මාර්ගෝපදේශ පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම. | NCPA | NSECD, DPCCS | X | X | | | | 3.6 Mn | පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | NCPA දත්ත |
| | ලියාපදිංචි ක්‍රියාවලියේ දී දිවා සුරැකුම් මධ්‍යස්ථාන/ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට අදාළ අවම ප්‍රමිතීන් තහවුරු කිරීම | PDPCCS | DPCCS, NSECD, NCPA, MWSEI-PHDT | | X | X | | | 0 Mn | ලියාපදිංචි කිරීමේදී ප්‍රමිතීන් සපුරාලන දිවා සුරැකුම් මධ්‍යස්ථාන % | DPCCS දත්ත |
| **5.2**<br>අවම ප්‍රමිතීන් පවත්වා ගැනීම සහතික කිරීම පිණිස දිවා සුරැකුම් මධ්‍යස්ථාන/ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඒකාබද්ධව අධීක්ෂණය කිරීම | අවම ප්‍රමිතීන් පවත්වා ගැනීම සහතික කිරීම සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන/ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල නිරන්තර කණ්ඩායම් පරීක්ෂණ පැවැත්වීම | NCPA | MOH staff, NSECD, PDPCCS, MWSEI-PHDT | X | X | X | X | X | 54 Mn | වසරකට සිදු කරන ලද පරීක්ෂා කිරීම් සංඛ්‍යාව | DPCCS දත්ත |
| | පළාත් මට්ටමින් අවම ප්‍රමිතීන් පදනම් කරගත් අධීක්ෂණ මෙවලම් සංවර්ධනය කිරීම/ යාවත්කාලීන කිරීම (උදා.: ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ පරීක්ෂණ පිරික්සුම් ලැයිස්තුව, වාර්ෂික / කාර්තුමය ඇගයීම් පෝරමය) | DPCSS/ NCPA | NSECD, PDHS | | X | | | | 1.5 Mn | සංවර්ධනය කරන ලද අධීක්ෂණ මෙවලම් සංඛ්‍යාව/ | PCC කාර්ය සටහන් |
| | දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම | NCPA | DPCSS, NSECD, MoH, MoE | | | X | | | 0.2 Mn | ශ්‍රේණිගත කිරීමේ පද්ධතියක් තිබීම | ප්‍රකාශිත ලේඛන |
| **5.3**<br>සියලුම දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම | සියලුම දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා පළාත් මට්ටමින් තොරතුරු කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම | PDPCCS | DPCCS, NCPA, NSECD, INGOs, MWSEI-PHDT | | | X | X | | 15 Mn | IMS තිබීම | Web දත්ත |
| | තොරතුරු කලමනාකරණ පද්ධතිය පදනම් කරගත් රැකවරණය සහ ආරක්ෂණ සේවාවල අඩු පාඩුකම් පිළිබඳ විශ්ලේෂණයක් සිදු කිරීම | DPCCS | NCPA, PDHS, NSECD, DSS | | | X | | | 0.5 Mn | රැකවරණ සහ ආරක්ෂණ සේවා මත ක්‍රියා කිරීම සඳහා හඳුනාගත් පරතරයන් ලැයිස්තුව | ප්‍රකාශිත ලේඛන |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **5.4** දිවා සුරැකුම් සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කරන්නන් විසින් පළාත් බලධාරීන් සඳහා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් දරුවන්, දෙමාපියන් සහ වෙනත් අදාළ පාර්ශ්වයන්ගෙන් ලැබෙන පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | DPCCS | NSECD, NCPA, MOH | X | | | | | 1.5 Mn | මසකට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | DPCCS දත්ත |

## උපායමාර්ගය 06

ප්‍රචණ්ඩත්වයෙන්, අපයෝජනයෙන් සහ සූරා කෑමෙන් මුල් ළමාවියේ ළමයින් ආරක්ෂා කර ගැනීම සඳහා 'වලක්වා ලීමේ ජාලයක්' (Prevention networks) ප්‍රවර්ධනය කිරීම සහ අදාළ පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **6.1** ළමුන් සඳහා වැළැක්වීමේ ජාලයක් ලෙස ප්‍රජාවන් බලමුළු ගැන්වීම | ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු සමඟ සහයෝගිත්වයෙන් 'ජනපවුර' ප්‍රජා මූලික ළමා ආරක්ෂණ වැඩසටහන නැවත සක්‍රිය කිරීම | NCPA | NSECD, පළාත් ECE ඒකක, DPCCS, DS, PDHS | | | X | X | | 9 Mn | ලියාපදිංචි වූ GN කොට්ඨාශ සංඛ්‍යාව | NCPA වාර්ෂික වාර්තාව |
| | ප්‍රජා මූලික ළමා ආරක්ෂණ වැඩසටහන වතු අංශයේ නැවත සක්‍රීය කිරීම | NCPA/ MWSEI-PHDT | DPCCS, DS, PDHS | | | X | X | | 6 Mn | ආවරණය කරන ලද වතු සංඛ්‍යාව | NCPA වාර්ෂික වාර්තාව |
| **6.2** සමාජයේ දරුවන්ට සිදුවන වෙනස්කොට සැලකීම හෙළාදැකීමේ සංස්කෘතියක් ප්‍රජාවන් තුළ ප්‍රවර්ධනය කිරීම | ශාරීරික දඬුවම්, ස්ත්‍රී පුරුෂ අසමානතාවය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සබඳතා පෝෂණය කිරීමෙහි ලා චර්යාත්මක වෙනස්කම් සහ සමාජ හා සංස්කෘතික සම්මතයන් වෙනස් කිරීමේ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම | NCPA | NSECD, DPCCS, ජනමාධ්‍යය | | | X | X | X | 6 Mn | පවත්වන ලද BCC ව්‍යාපාර සංඛ්‍යාව | NCPA වාර්ෂික වාර්තාව |
| **6.3** මුල් ළමාවියේ ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ ශක්තිය ජීවන කුසලතා ප්‍රවර්ධනය කිරීම | පූර්ව ප්‍රසව/පශ්චාත් ප්‍රසව/ළමා සුබසාධන සායන සැසිවලදී මුල් ළමා අවදියේ සිට ම ජීවන කුසලතා පුහුණුව පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම | MoH | FHB, PDHS, RDHS, MoE, NIE | X | X | X | X | X | 0 Mn | මුල් ළමා රැකවරණ පැකේජයට ඇතුළත් කර ඇති ජීවන කුසලතා පුහුණුව | MCH වාර්තා |
| | ගෘහස්ථ හිංසනය, මාර්ග ආරක්ෂාව සහ නිවාස ආරක්ෂාව වැනි මාතෘකා පිළිබඳව පෙරපාසල් දෙමාපිය සැසියේදී දෙමාපියන් සඳහා දැනුම්වත් කිරීම් පැවැත්වීම | පළාත් ECE අධිකාරීන් | NCPA,MOHs, පොලිස් දෙපා., කාන්තා කාර්යාංශය | | X | X | X | X | 10.8 Mn | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | පළාත් ECE වාර්තා |

## උපායමාර්ගය 07

මුල් ළමාවියේ පසුවන ළමයින් සෑම ආකාරයක ම සූරාකෑම් වලින් ආරක්ෂා කර ගැනීම සඳහා නියාමන ක්‍රියා මාර්ග ප්‍රවර්ධනය කිරීම සහ අදාළ පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මු. රු. | | |
| **7.1** ශ්‍රී ලංකාවේ ළමයින් ආරක්ෂා කරගැනීම සඳහා වන නියාමන ක්‍රියාමාර්ග අඛණ්ඩව සමාලෝචනයට සහ සංශෝධනයට ලක් කිරීම | සූරාකෑම, ප්‍රචණ්ඩත්වය, නොසලකා හැරීම වැනි සියලුම ආකාරයන් සම්බන්ධ ජාත්‍යන්තර සහ දේශීය නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම හා ප්‍රචලිත කිරීම | NCPA | MWCA, අධිකරණ අමාත්‍යාංශය, නීති කෙටුම්පත් සම්පාදක, නීතිපති දෙපා. | | X | | | | 0.5 Mn | සම්පාදනය කරන ලද නීති සහ රෙගුලාසි | ප්‍රකාශයට පත් කළ දත්ත සමුදාය |
| | ළමා ආරක්ෂාව පිළිබඳ නියාමන රාමුව කාලානුරූපව සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම | NCPA | DPCCS, අධිකරණ අමාත්‍යාංශය | | | X | | | 1.5 Mn | නියාමන ප්‍රතිසංස්කරණ සංඛ්‍යාව | ප්‍රකාශයට පත් කළ ගැසට් නිවේදන |
| **7.2** රැකවරණ මධ්‍යස්ථානවල අවම ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සඳහා නියාමන ව්‍යුහය ශක්තිමත් කිරීම | ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල අවම ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සඳහා නියාමන ව්‍යුහය ශක්තිමත් කිරීම | DPCCS | NCPA, NSECD, PDHS/RDHS/ MOH, MWSEI-PHDT | | X | | | | 0.8 Mn | සංශෝධිත නියාමන ව්‍යුහය | NCC |
| | දිවා සුරැකුම් මධ්‍යස්ථානවල අවම ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සඳහා නියාමන ව්‍යුහය ශක්තිමත් කිරීම | DPCCS | NCPA, NSECD, PDHS/RDHS/ MOH, MWSEI-PHDT | | X | | | | 0.8 Mn | සංශෝධිත නියාමන ව්‍යුහය | NCC |
| | පෙර පාසල්වල අවම ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සඳහා නියාමන ව්‍යුහය ශක්තිමත් කිරීම | පළාත් ECE අධිකාරීන් | NCPA, NSECD, PDHS/RDHS/ MOH, MWSEI-PHDT | | X | X | | | 0.8 Mn | සංශෝධිත නියාමන ව්‍යුහය | NCC |
| **7.3** ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සිදුවන කිසියම් හෝ බරපතල සිදුවීම් අදාළ පෝරමය හරහා වාර්තා කිරීම සහතික කිරීම | ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සිදුවන කිසියම් හෝ බරපතල සිදුවීම් සුදුසු පෝරමය භාවිතා කර වාර්තා කිරීම සහතික කිරීම | NCPA | DPCCS, MWSEI-PHDT | X | X | X | X | X | 3.6 Mn | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව-NCPA |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **7.4** මාධ්‍ය මගින් වාර්තා කිරීමේ නියාමන ව්‍යුහය ශක්තිමත් කිරීම | ළමා අපයෝජන පිළිබඳ වාර්තා කිරීමේදී මාධ්‍යය සම්බන්ධ නීති සහ අණපනත් පිළිබඳව මාධ්‍යවේදීන් දැනුවත් කිරීම | NCPA | MWCA, MoJ | | X | | | | 1.2 Mn | යාවත්කාලීන කළ අත්පොත | ප්‍රකාශිත ලේඛන |
| **7.5** අවදානමට ලක්විය හැකි ස්ථානවල රැකවරණය සහ ආරක්ෂාව සඳහා නියාමන පියවර ශක්තිමත් කිරීම | සියලුම ආකාරයේ ළමා ශ්‍රමිකයන්, සංචාරක කර්මාන්තය, ආබාධ සහිත දරුවන් සහ වීථි දරුවන් ඇතුළු අවදානමට ලක්විය හැකි පරිසරය තුළ නියාමන ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම | NCPA | MWCA, Ministry of Justice, Legal draftsman, AG department | | X | X | X | | 3.2 Mn | නීති රාමුව නැවත සලකා බැලීම | NCC කාර්ය සටහන් |

## උපායමාර්ගය 08

## හදිසි ආපදා අවස්ථාවල දී මුල් ළමාවියට අයත් ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සැපයීම සඳහා අදාළ ආයතන ශක්තිමත් කිරීම

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | ම රු. | | |
| **8.1** දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ආපදා පෙර සුදානම් සැලසුම්වල ළමා රැකවරණ සහ ආරක්ෂණ යාන්ත්‍රණ ඇතුළත් කිරීම | ආපදා සැලසුම් කිරීමේදී ආරක්ෂිත අවකාශයන්, අත්‍යවශ්‍ය පහසුකම් ආදිය සඳහා සැලසුම් තිබේදැයි සහතික කර ගැනීම පිණිස ළමා ආරක්ෂක නිලධාරීන් ආපදා පෙරසූදානම් කණ්ඩායම් සමඟ සහයෝගිත්වයෙන් කටයුතු කිරීම | DPCCS | දිස්ත්‍රික් DMC, DPRD ඒකක, NCPA | X | X | X | X | X | 4.5 Mn | ආපදා පෙරසුදානම් සැලසුම්වල රැකවරණය සහ ආරක්ෂණ අංගයන් තිබීම | වාර්ෂික වාර්තාව |
| **8.2** ආපදාවලදී ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම්වත් කිරීම | ආපදා අවස්ථාවන්හිදී ළමා ආරක්ෂාව පිළිබඳව දරුවන් සහ දෙමාපියන් දැනුවත් කිරීම සහ හදිසි අවස්ථාවලදී ළමා අපචාර අවම කිරීම | DPCCS | දිස්ත්‍රික් DMC, DPRD ඒකක, NCPA | X | X | X | X | X | 14.4 Mn | පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | වාර්ෂික වාර්තාව |

## උපායමාර්ගය 09

**මුල් ළමාවියේ වෙසෙන ළමයින්ට රැකවරණය සහ ආරක්ෂාව සැපයීමේ කාර්යයන්හි නියුතු පුද්ගලයින්ගේ ධාරිතා වර්ධනය කිරීම මගින් ළමා රැකවරණ හා ආරක්ෂණ සේවාවන් වෘත්තිමය තත්ත්වයකට පත්කිරීම පිණිස ජාතික හා පළාත් ආයතන වලට පහසුකම් සැලැස්වීම**

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | ම රු. | | |
| **9.1** නියැළී සිටින පුද්ගලයන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම හරහා රැකවරණ සහ ආරක්ෂණ සේවා වෘත්තීමයකරණය කිරීම | රැකවරණ සහ ආරක්ෂණ සේවා සහ රැකවරණ නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය පිළිබඳ අවශ්‍යතා ඇගයීම | MWCA | MWCA-NSECD, DPCCS, NCPA, පොලිස් දෙපා. | X | | | | | 1.5 Mn | හඳුනාගත්ධාරිතා ගොඩනැගීමේ අවශ්‍යතා | ප්‍රකාශිත ලේඛන |
| | පුහුණුකරුවන්ගේ සම්පත් සංචිතයක් නිර්මාණය කිරීම | MCWA, MWCA | MWCA-NSECD/ DPCCS/ NCPA, MoE, MoH, ශාස්ත්‍රඥයින්, ECCD විශේෂඥයින් | X | | X | | | 4.5 Mn | පුහුණුකරුවන්ගේ සම්පත් සංචිතයක් තිබීම | NCC කාර්ය සටහන් |
| **9.2** ළමුන් සම්බන්ධව කටයුතු කරන සියලුම නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය, දිවා සුරැකුම් / ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට අදාළ අවම ප්‍රමිතීන්, ළමා අපයෝජන, ජාවාරම්, මනෝවිද්‍යාත්මක ප්‍රථමාධාර යනාදී විෂයන් පිළිබඳ රැකවරණ සහ ආරක්ෂණ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | NCPA | MoH, DPCCS, NSECD, DPCCS, MoH, ළමා මනෝචිකිත්සක විද්‍යාලය, නීතිමය ආයතන, NATA | | X | X | X | | 10.5 Mn | පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | NCPA වාර්ෂික වාර්තාව |
| | පුහුණුව සඳහා පුහුණු අත්පොත් සංවර්ධනය කිරීම | NCPA | DPCCS, NSECD | | X | X | X | | 5.8 Mn | අත්පොත් ලබා ගැනීමේ හැකියාව | ප්‍රකාශිත ලේඛන |
| | දේශීය හා ජාත්‍යන්තර මූලාශ්‍ර හරහා දැනුම වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව සලසා දීම | MWCA | විශ්වවිද්‍යාල, සංවර්ධන හවුල්කරුවන් | | X | X | X | | 17.5 Mn | වසරකට පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | MWCA දත්ත |
| **9.3** රැකවරණ සහ ආරක්ෂක නිලධාරීන් සඳහා කාර්ය සාධන ඇගයීම්/ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කිරීම | රැකවරණ සහ ආරක්ෂක නිලධාරීන් සඳහා කාර්ය සාධන ඇගයීම්/ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කිරීම | MWCA | DPCCS, NCPA | | | | | X | 1.5 Mn | උසස්වීම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | වාර්ෂික වාර්තාව DoP/ NCPA |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **9.4** ළමා රැකවරණ මධ්‍යස්ථානවලට සම්බන්ධ වන රැකවරණ සේවා සපයන්නන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | NVQ මට්ටමේ පාඨමාලා, සුරක්ෂිතතා පාඨමාලාව - මට්ටම 1 සහ පොදු රැකවරණය බහුආංශික සහයෝගිතාවය තුළින් සංවර්ධනය කිරීම | NCPA | MoH, ශාස්ත්‍රඥයන්, සංවර්ධන ළමා රෝග විශේෂඥයින් | | X | X | | | 10 Mn | සංවර්ධනය කරන ලද පාඨමාලා සංඛ්‍යාව | Web දත්ත |
| | සම්පත් දායක සංචිතය හරහා පළාත් මට්ටමින් පුහුණු සැසි පැවැත්වීම | DPCCS | NSECD, NCPA, MoE, MoH, පොලිස් දෙපා., ශාස්ත්‍රඥයන්, ECCD විශේෂඥයින් | | | X | X | X | 22.5 Mn | පුහුණු කළ රැකවරණ මධ්‍යස්ථාන සේවකයන් සංඛ්‍යාව | DPCCS දත්ත |

**උපායමාර්ගය 10** මුල් ළමාවියෙහි වෙසෙන ළමයින්ගේ රැකවරණය හා ආරක්ෂාව සඳහා ක්‍රියාත්මක වන සියලු ම වැඩසටහන් ළමාරක්ෂාව පිළිබඳ ජාතික මාර්ගෝපදේශ වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මු. රු. | | |
| **10.1** ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය මගින් සුසංයෝගය තක්සේරු කිරීම සඳහා මුල් ළමාවියේ පසුවන ළමුන් සඳහා ඉලක්ක කරගත් රැකවරණය සහ ආරක්ෂණ වැඩසටහන් නැවත සමාලෝචනය කිරීම | මුල් ළමාවියේ ළමුන් සඳහා ඉලක්ක කරගත් රැකවරණය සහ ආරක්ෂණ වැඩසටහන් ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වන්නේද යන්න වටමේස සමාලෝචන හරහා සහතික කිරීම | NCPA | NSECD, DPCCS | X | | | | | 0.3 Mn | සමාලෝචනය සහ යාවත්කාලීන කරන ලද වැඩසටහන් සැලසුම් | NCPA දත්ත සමුදාය |
| | රැකවරණ සහ ආරක්ෂණ වැඩසටහන් පිළිබඳ පළාත් මට්ටමින් වාර්ෂිකව සමාලෝචනය කිරීම | DPCCS | PDPCCS, NCPA, PDHS, පළාත් ECE ඒකක | | X | X | X | X | 10.8 Mn | සිදු කරන ලද සමාලෝචන සංඛ්‍යාව | PCC කාර්ය සටහන් |

## උපායමාර්ගය 11

මුල් ළමාවියට අයත් ළමයින්ගේ ආරක්ෂාව හා ඔරොත්තු දීමේ ශක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ ආයතන විසින් ගෙන ඇති උපායමාර්ග ශක්තිමත් කිරීම සහ අදාළ පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **11.1** ළමා වින්දිතයන්ගේ ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ ශක්තිය සහතික කිරීම සඳහා අනුගමනය කරන ලද උපායමාර්ග ශක්තිමත් කිරීම | අවශ්‍යතා ඇති ළමුන්ට පහසුකම් සැලසීම සඳහා ජාතික ළමා - කේන්ද්‍රීය - මනෝ - සමාජ සහයෝගය - 'සිත් සවිය' වැඩසටහන සියලුම දිස්ත්‍රික්ක වෙත ව්‍යාප්ත කිරීම | NCPA | NCPA, DPCCS, PDHS/RDHS/ MOH | X | X | X | X | X | 42 Mn | සිත් සවිය සේවාව ඇති දිස්ත්‍රික්ක සංඛ්‍යාව | NCPA දත්ත සමුදාය |
| | සියලුම ළමා ආරක්ෂණ මධ්‍යස්ථාන සඳහා ඩිජිටල් නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම | NCPA | DPCCS, PDPCCS, DS | X | X | | | | 45 Mn | ආවරණය කළ මධ්‍යස්ථාන සංඛ්‍යාව | මාධ්‍ය සමාලෝචන |
| **11.2** පෙර පාසල් ගුරු මාර්ගෝපදේශන වලට රැකවරණය සහ ආරක්ෂණ පිළිබඳ දැනුම ඇතුළත් කිරීම | ආරක්ෂාව හා රැකවරණය පණිවිඩ පිළිබඳ ගුරුවරුන් පුහුණු කිරීම | NCPA | NIE, MoE, DPCCS, පළාත් ECE ඒකක | | X | X | X | X | 11.5 Mn | යාවත්කාලීන කරන ලද ගුරු මාර්ගෝපදේශ ලබා ගැනීමේ හැකියාව | ප්‍රකාශිත ලේඛන |
| **11.3** දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා විශේෂ වැඩසටහන් පැවැත්වීම | ප්‍රජාව තුළ දැනුම බෙදා හැරීම සඳහා ළමා මාසයේ දී ප්‍රජා මූලික වැඩසටහන් පැවැත්වීම | NCPA | NSECD, DPCCS | X | X | X | X | X | 57.5 Mn | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | NCPA දත්ත සමුදාය |

**උපායමාර්ගය 12** හදිසි අවස්ථාවල දී සහ විශේෂ අවස්ථාවල දී ළමා මිතුරු අවකාශ සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය සහ අදාළ පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | ම රු. | | |
| **12.1** හදිසි සහ විශේෂ අවස්ථාවල දී විකල්ප රැකවරණ සඳහා සීඝ්‍ර හා සුමට සංක්‍රාන්තියට අදාළ සූදානම් වීම තහවුරු කිරීම | හදිසි අවස්ථා වලදී ළමයින් සඳහා විකල්ප රැකවරණයට අදාළ සූදානම් වීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම | DPCCS | MWCA-NSECD/ NCPA | X | | | | | 0.75 Mn | විකල්ප සත්කාර මාර්ගෝපදේශ තිබීම | පරිවාස දෙපාර්තමේන්තුව - ප්‍රකාශන |
| | හදිසි අවස්ථා වලදී ළමා හිතකාමී ප්‍රවාහන පහසුකම් භාවිතා කිරීමට සූදානම් කර තිබීම | PDPCCS | DS, පළාත් අධිකාරීන් | X | | | | | 45 Mn | ප්‍රවාහන සැලැස්මක් තිබීම | DPCCS ලේඛන |
| | ස්ථානගත කිරීමේ කමිටු කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා සැලැස්මක් සකස් කිරීම | PDPCCS | PDHS, DS, NCPA | X | | | | | 0.25 Mn | ඇමතුම් සැලැස්ම | DPCCS ලේඛන |
| **12.2** හදිසි අවස්ථා සහ විශේෂ අවස්ථාවල දී විකල්ප රැකවරණ පහසුකම්/ ළමයින් රඳවා තැබීමේ මධ්‍යස්ථානවලට ආයෝජනය කිරීම සඳහා ජාත්‍යන්තර රාජ්‍ය නොවන ආයතන සහ අනුග්‍රාහක පාර්ශවයන් උනන්දු කරවීම | හදිසි අවස්ථාවලදී භාවිතා කිරීමට ළමා හිතකාමී අවකාශයන් සඳහා ආයෝජන සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම | DPCCS | INGOs, පෞද්ගලික අංශය, පළාත් පාලන ආයතන | | X | X | | | 200 Mn | ආයෝජනය කිරීමට එකඟ වූ සංවිධාන සංඛ්‍යාව | වාර්ෂික වාර්තාව |
| | එවැනි අවකාශයන් තුළ කඩිනම් මනෝවිද්‍යාත්මක සහ කායික සහය ලබා දීම සඳහා රැකවරණය සපයන්නන් පුහුණු කිරීම (යොමුව: ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පළ කර ඇති ළමුන් සඳහා මනෝවිද්‍යාත්මක ප්‍රථමාධාර) | MoH | DPCCS, NCPA, මනෝවිද්‍යාඥයින්, INGOs | | | X | | | 7 Mn | පුහුණු කරන ලද රැකවරණ දෙන්නන් සංඛ්‍යාව | DPCCS ලේඛන |

උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 04:

# දෙමාපියන්, පවුල සහ ප්‍රජාව

**සුවිශේෂී අරමුණ:**
**ළමයින් හදා වඩා ගැනීමේදී සිය කාර්යභාරය හා වගකීම් ඵලදායී අයුරින් ඉටු කිරීමට සහ ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවාවන් සහ වැඩසටහන් වලට තම උපරිම දායකත්වය සහතික කිරීමට දෙමව්පියන්, පවුල සහ ප්‍රජාව ශක්තිමත් කිරීම.**

## පසුබිම් විශ්ලේෂණය

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සඳහා සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් පිළිබඳ Lancet ප්‍රකාශන මාලාවේ නිර්දේශ තුළ, 'පවුලේ සහාය සහ ශක්තිමත් කිරීමේ පැකේජය' වැදගත් ස්ථානයක් ගනී[40]. මෙම පැකේජය තුළ පවුල් ශක්තිමත් කිරීමේ අංග තුනක් ඇතුළත් කර ඇත. ඒවා නම් ගුණාත්මක සේවාවන් සඳහා ප්‍රවේශ වීමේ අවස්ථාව (උදා: පූර්ව ප්‍රසව රැකවරණය, ප්‍රතිශක්තිකරණය, පෝෂණය); කුසලතා සංවර්ධනය කිරීම (උදා: රැකවරණය සැපයීම සහ දැඩි විනය ලිහිල් කිරීම) සහ සහාය සැපයීම (උදා: සමාජ ආරක්ෂණය, ආරක්ෂිත ජාල සහ පවුල් ආධාරක ප්‍රතිපත්ති) වේ. මේ අතරින් කුසලතා සංවර්ධනය හා සහාය සැපයීම යන කාරණා දෙක මෙම උපාය මාර්ගික ක්‍රියාකාරී අංශයෙන් සාකච්ඡා වෙයි. මනෝසමාජීය උත්තේජනය, යහපත් දෙමාපියභාවය, හිංසා වැළැක්වීමේ වගකීම වැනි කරුණු ආමන්ත්‍රණය කරන මාපියත්ව වැඩසටහන් ගෝලීය වශයෙන් යෝජනා කරන ලද ප්‍රධාන මැදිහත් වීම්වලට ඇතුළත් වේ[40].

විවිධ දිස්ත්‍රික්කවල සිදු කරන ලද අධ්‍යයනයන් මඟින් මවු හවුල් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවක් පෙන්නුම් කර නොමැති බැවින් ඒ සඳහා තවත් බොහෝ වැඩිදියුණු කිරීම් අවශ්‍ය වේ[41]. කෙසේ වෙතත්, සංවර්ධනය කිරීමේ හවුල්කරුවන් මෙම ක්ෂේත්‍රයේ ධාරිතා සංවර්ධනය කෙරෙහි සහය ලබා දීමට ඉදිරිපත් වීම දිරිගන්වන සුළුය.

---

40 Lancet ප්‍රකාශන මාලාව (ඔක්. 2016). මුල් ළමාවිය සංවර්ධනය දියුණු කිරීම: විද්‍යාවේ සිට පරිමාණය දක්වා https://www.thelancet.com/series/ECD2016

41 මගෙදර, එන්., මෙන්ඩිස්, ඊ., මෙන්ඩිස්, ඩී.ජී.එන්.ජී., විජේසිංහ, (2020) ශ්‍රී ලංකාවේ මොනරාගල දිස්ත්‍රික්කයේ ළමා පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා 'මාතෘ ආධාරක කණ්ඩායමේ' මැදිහත්වීමේ කාර්යක්ෂමතාව. ශ්‍රී ලංකාවේ ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සඟරාව 26(2):94

ඉහළ යන තනි මාපිය කුටුම්භ සංඛ්‍යාව වත්මන් ක්‍රියාකාරී සැලැස්ම තුළ අවධානරණය කළ යුතු නව අභියෝගයන් වේ. ශ්‍රී ලංකාවේ 2001 දී තනි මාපිය කුටුම්භ 209,839 ක් සිටී. 2012 දී එය දෙගුණ වී 501460 ක් විය[42]. 2012 ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ කුටුම්භ 23% ක ගෘහ මූලිකයන් කාන්තාවන් වන අතර මෙම කාන්තා මූලිකයන්ගෙන් 80% ක් වයස අවුරුදු 40 ට වැඩි කාන්තාවන් විය. එම කාන්තාවන්ගෙන් 64.3% වැන්දඹු හෝ වෙන්ව සිටින බවද, 32% ක් විවාහක ලෙසද ලැයිස්තුගත කර ඇත[43].

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් පවුල් මට්ටමේ ප්‍රතිචාරාත්මක රැකවරණ ලබා දීම ශක්තිමත් කිරීමේදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පවුල් මට්ටමින් ඔබ්බටද, විශේෂයෙන්ම මවු හවුල් හරහා ප්‍රජා ආධාරක ජාල සක්‍රීය කර ගැනීමේ වගකීම පවුල් සෞඛ්‍ය නිලධාරී වෙත පැවරී ඇත. සෑම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ටාශයකටම අවම වශයෙන් එක් සක්‍රීය මවු හවුලක් ඇති කර ගැනීමට ඉලක්කය ලබා දී ඇත. ඒ සඳහා මාර්ගෝපදේශ පවතින අතර සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා අධීක්ෂණය සිදු කෙරේ[44].

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් තම මැදිහත්වීම් ලබා දීම සඳහා සහයෝගයෙන් මවු හවුල් භාවිතා කිරීම අපේක්ෂා කෙරේ.

මෙම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සාම්ප්‍රදායික පුහුණු විෂය මාලාවේ අවම යෙදවුම් තිබෙන නිසා විශේෂයෙන් 'දෙමාපියභාවය' පිළිබඳ ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම ප්‍රධාන අභියෝගයන්ගෙන් එකකි.

ක්‍රීඩාව තුළින් ඉගෙනීම මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයහි අත්‍යවශ්‍ය අංගයකි. පෙර පාසල්වලින් 72.9% කට පමණක් සෙල්ලම් මිදුලක් ඇති බවත්, එනම් පෙර පාසල් හතරෙන් එකකට ප්‍රමාණවත් සෙල්ලම් මිදුලක් නොතිබූ බවත්, නිර්දේශිත එළිමහන් සෙල්ලම් මිදුල් උපකරණ තිබීමේ ප්‍රතිශතය ඊටත් වඩා අඩු වී තිබූ බවත් 2016 පෙර පාසල් සංගණනයෙන් හෙළි විය.

එබැවින්, මෙම NMSAP-ECCD 2026-2030 ඉහත කී අභියෝගයන් ආමන්ත්‍රණය කිරීමටත්, මුල් ළමාවිය සංවර්ධනය කෙරෙහි දෙමව්පියන්, පවුල සහ ප්‍රජාවගේ දායකත්වය තීව්‍ර කිරීමටත් උත්සාහ කර ඇත.

42 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012). http://www.statistics.gov.lk/Resource/en/Population/CPH_2011/CPH_2012_5Per_Rpt.pdf
43 https://nisd.ac.lk/images/Downloads/sljsd/sljsd2022-1/SLJSD2022-1articles.pdf
44 සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය (2018). මාතෘ උපකාරක කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා මාර්ගෝපදේශය. නව සංස්කරණය.

2026-2030 වසර සඳහා වන සමස්ත අංශයේ අයවැය | රු. මි **608.1**

**උපායමාර්ගය 01** නිවෙස් පරිසරය තුළ රැකවරණය, ආරක්ෂාව සහ මනෝ සමාජීය උත්තේජනය ප්‍රවර්ධනය කෙරෙන ආකාරයට අතිශයින් අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්ත්වයේ වෙසෙන ළමයින් ඇතුළු සියලු ම ළමයින් රැක බලා ගැනීම සඳහා අවශ්‍ය යහපුරුදු යොදා ගැනීමට දෙමව්පියන්ට සහ පවුලට ඇති හැකියාව වර්ධනය කිරීම සඳහා අදාළ පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **1.1** ක්ෂේත්‍ර මාතෘ හා ළමා සෞඛ්‍ය රැකවරණ සේවා හරහා දෙමව්පියන්ගේ 'දෙමාපියභාවය' පිළිබඳ ධාරිතා සංවර්ධනය කිරීම. | විවාහයට පෙර සහ අලුත විවාහ වූ යුවල සඳහා පවුල් සෞඛ්‍ය වැඩසටහන යටතේ 'දෙමාපියභාවය' පිළිබඳ උපදේශනය ලබා දීම | FHB | PDHS, RDHS, MOHs, NSECD | X | X | X | X | X | *උපාය මාර්ග 5 යටතේ අංශ 3.2 යටතේ ඇස්තමේන්තු කර ඇත. | පෞ. සෞ. සේ. සමඟ ලියාපදිංචි වූ අලුත විවාහ වූ යුවල % | RHMIS |
| | 'දෙමාපියභාවය හා ළමා රැකවරණය' පූර්ව ප්‍රසව සැසි මාතෘකා තුළ ඇතුළත් කිරීම | FHB, | PDHS, RDHS, MOHs, NSECD, MWSEID-PHDT | X | X | X | X | X | | පවත්වන ලද පූර්ව ප්‍රසව සැසි සංඛ්‍යාව | MCH කාර්තුමය වාර්තා |
| | ළමා සෞඛ්‍ය සංවර්ධන සටහන මනෝ සමාජීය උත්තේජනය මෙවලමක් ලෙස භාවිතා කිරීම සඳහා දෙමාපියන් දැනුම්වත් කිරීම | FHB | PDHS, RDHS, MOHs, NSECD, MWSEID-PHDT | X | X | X | X | X | | මව්වරුන් දැනුම්වත් කිරීම සඳහා ළමා සෞඛ්‍ය සංවර්ධන සටහන භාවිතා කරන පෞ. සෞ. සේ. % | MRI සමීක්ෂණය |
| | ස්වයං රැකවරණය සහ ආරක්ෂාව පිළිබඳ දැනුමෙන් දරුවන් සවිබල ගැන්වීම පිණිස දෙමාපියන් ළමා සෞඛ්‍ය සායනවලදී පුහුණු කිරීම | NCPA | DPCCS, MOH | X | X | X | X | X | | ළමා සෞඛ්‍ය සායනවලදී හි පවත්වන ලද අධ්‍යාපන සැසි සංඛ්‍යාව | MOH මාසික සම්මන්ත්‍රණ |
| | දරුවන් අතර ප්‍රශස්ත පරතරයක් සහතික කිරීම සඳහා නිසි පවුල් සැලසුම් ක්‍රමයක් හඳුන්වා දීම | FHB | PDHS, RDHS, MOHs, NGOs, පෞද්. අංශය | X | X | X | X | X | | සෞ. වෛ. නි. ප්‍රදේශවල පවුල් සැලසුම් ආවරණය | RHMIS |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1.2**<br>'දෙමාපියභාවය' පිළිබඳ දෙමව්පියන්ගේ හා පවුල්වල පෙර පාසල් පාදක කර ගත් ධාරිතා සංවර්ධනය කිරීම | දෙමාපියභාවය පිළිබඳ වැඩසටහන් පෙර පාසල්වල සංවිධානය කිරීම | NSECD | MoE, පළාත් ECE අධිකාරීන්, පෞද්. අංශය, PDHS, RDHS, MOH, MWSEID-PHDT | | X | X | X | X | 25 Mn | සංවිධානය කරන ලද මාපිය දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රාදේශීය CC කාර්ය සටහන් |
| | දරුවන් හදා වඩා ගැනීමට සහ රැකවරණය සහ ආරක්ෂණ පිළිවෙත් පිළිබඳව පෙර පාසල් ගුරුවරුන් දැනුම්වත් කිරීම් සේවාස්ථ සැසිවලදී පැවැත්වීම | NSECD | පළාත් ECE අධිකාරීන්, PDPCCS, ECCD officers, MOHs, MWSEID-PHDT | | X | X | X | X | 36 Mn | පවත්වන ලද පෙර පාසල් ගුරුවරුන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | PCC කාර්ය සටහන් |
| **1.3**<br>වතු අංශයේ දෙමාපියන් සහ පවුල් සඳහා ළමා සංවර්ධන මධ්‍යස්ථානය පාදක කර ගනිමින් 'දෙමාපියභාවය' පිළිබඳ ධාරිතා සංවර්ධනය කිරීම | ළමා සංවර්ධන මධ්‍යස්ථාන පාදක කරගත් දෙමව්පියන් දැනුම්වත් කිරීමේ සැසි පැවැත්වීම | MWSEID-PHDT | PDPCCS, MoH-EUH, NSECD, MOHs, INGOs | | X | X | X | X | 22.5 Mn | පවත්වන ලද මාපිය දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | PHDT |
| | දෙමව්පියන් හා පවුල් දැනුවත් කිරීම පිණිස ළමා සංවර්ධන නිලධාරි, වතු වෛද්‍ය සහායක, වතු පවුල් සුභ සාධන නිලධාරීන් මගින් නිවෙස් වෙත යාම සිදුකිරීම | MWSEID-PHDT | PDPCCS, MWCA-NSECD, MoH-EUH ඒකක, MOH-PHMs | X | X | X | X | X | 10 Mn | එක් එක් වතුයායේ සිදු කරන ලද නිවාස චාරිකා සංඛ්‍යාව | PHDTට ලැබෙන වාර්තා |
| **1.4**<br>'දෙමාපියභාවය' පිළිබඳ, විදේශ රැකියාවල නියුතු පවුල් සඳහා ළමා රැකවරණය පිළිබඳ ධාරිතා සංවර්ධනය කිරීම | දරුවන්ගේ ප්‍රශස්ත සංවර්ධනයට සහාය වීම සඳහා සංක්‍රමණික මව්වරුන් සිටින පවුල් බලගැන්වීම | විදේශ රැකියා කාර්යාංශය | NSECD, FHB, PDHS, RDHS, MOH , NCPA | | X | X | X | X | 18 Mn | දිශානති වැඩසටහන් සඳහා සහභාගී වූ සංක්‍රමණික මව්වරුන්ගේ % | විදේශ සේවා කාර්යාංශය |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1.5** දෙමාපිය භාවය පිළිබඳ ප්‍රජා පාදක ධාරිතා සංවර්ධනය කිරීම | ප්‍රජාව දැනුවත් කිරීම සඳහා, සෞඛ්‍ය ප්‍රවර්ධන සැකසුම් භාවිතය උදා: පෙර පාසල, සතුටු පවුල සහ මව් හවුල, සතුටු ගම්මාන ආදිය | HPB | FHB, EUH, PDHS, RDHS, MOH, NSECD, NCPA, INGOs | | X | X | X | X | 10 Mn | ස්ථාපිත සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රජා සැකසුම් සංඛ්‍යාව | MIS-HPB |
| | ධාරිතා සංවර්ධනය සඳහා සමාජ මාධ්‍ය සහ ජනමාධ්‍ය භාවිතා කිරීම | HPB | FHB, ජනමාධ්‍ය අමාත්‍යාංශය, මාධ්‍ය හවුල්කරුවන්, NSECD, NCPA, INGOs, CBOs | X | X | | | | 11 Mn | සමාජ මාධ්‍ය සහ ජනමාධ්‍ය හරහා පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව | ජනමාධ්‍ය සමීක්ෂණ/HPB |
| **1.6** මාපිය ධාරිතා සංවර්ධනයේ දී භාවිතා කිරීම සඳහා හැසිරීම් වෙනස් කිරීමේ උපාය මාර්ග ඇතුළත් පැකේජයක් සංවර්ධනය කර පිළියෙළ කිරීම | මුල් ළමාවියේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ගයක් සහ සමාජ හා චර්යා වෙනස් කිරීමේ සන්නිවේදන සැලැස්මක් සකස් කිරීම | HPB | ශාස්ත්‍රඥයන්, MoE, NSECD, INGOs, ළමා මනෝ වෛද්‍ය විද්‍යාලය, සංවර්ධන ළමා රෝග විශේෂඥයින් | X | X | | | | 3 Mn | ජාතික උපාය මාර්ගික සහ ක්‍රියාකාරී සැලැස්මක් තිබීම | NCC රැස්වීම්කාර්ය සටහන් |
| | ප්‍රශස්ත ළමා සංවර්ධනය සඳහා දෙමාපියන්, පවුල් සහ ප්‍රජාවන් සවිබල ගැන්වීම, දැනුම්වත් කිරීම සහ බලමුළු ගැන්වීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම | HPB | PDHS, RDHS, MOHs, පළාත් ECE අධිකාරීන්, NSECD, MWSEID-PHDT | | | X | X | X | 11 Mn | ක්‍රියාත්මක කරන ලද BCC වැඩසටහන් සංඛ්‍යාව | HPB |
| | අපේක්ෂිත දරුවන් පාදක ප්‍රතිඵල මත පදනම්ව මාපිය කුසලතා සංවර්ධන පැකේජයක් සකස් කිරීම | NSECD | HPB, FHB, ශාස්ත්‍රඥයන්, MoE, INGOs | | X | | | | 2.5 Mn | ඒකාකාර මාපිය කුසලතා සංවර්ධන පැකේජයක් තිබීම | NCC රැස්වීම්කාර්ය සටහන් |
| **1.7** ධාරිතා සංවර්ධන වැඩසටහන්වල ඵලදායිතාවය පිළිබඳ ස්වයං-අධීක්ෂණයට ලක් කිරීම සඳහා පහසුකම් සැලසීම | දෙමව්පියන් විසින් තම මාපිය හැසිරීම් පිළිබඳව භාවිතා කළ යුතු ස්වයං-ඇගයීමේ මෙවලම් සංවර්ධනය කිරීම | HPB | FHB, ශාස්ත්‍රඥයන්, NSECD | | | X | | | 1 Mn | ස්වයං ඇගයීම් මෙවලම් තිබීම | ප්‍රකාශිත ලේඛන |
| | කාලානුරූප සමීක්ෂණ මඟින් ළමා රැකවරණය පිළිබඳ දෙමාපියන්ගේ සාක්ෂරතාවය මැනීම | NSECD | FHB, HPB, PDHS, RDHS | | X | | | X | 9 Mn | ළමා රැකවරණය පිළිබඳ මාපිය සාක්ෂරතා මට්ටම | සමීක්ෂණ/ පර්යේෂණ |
| **1.8** ආයෝජනය සඳහා පුද්ගලික අංශය සක්‍රීයව සම්බන්ධ කර ගැනීම සහ උපදේශනය හරහා ධාරිතා සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීම | ධාරිතා සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට සහ පහසුකම් සැලසීමට පුද්ගලික අංශය සම්බන්ධ කර ගැනීම සහ දිරිමත් කිරීම | NSECD | PDHS, RDHS, පළාත් ECE අධිකාරීන් | X | X | X | X | X | 100 Mn | ECCD පිළිබඳ පුද්ගලික අංශය විසින් සහාය දක්වන ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සංඛ්‍යාව | PCC රැස්වීම්කාර්ය සටහන් |

**උපායමාර්ගය 02** අතිශයින් අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්ත්වයේ වෙසෙන ළමයින් ඇතුළු මුල් ළමාවියේ සියලු ළමයින් සඳහා පවුල සහ ප්‍රජාව තුළ ප්‍රචණ්ඩත්වයෙන් සහ නොසලකා හැරීමෙන් සුරක්ෂිත පරිසරයක් සහතික කරනු පිණිස උද්දේශනය සහ බලමුලු ගැන්වීම (Mobilization) ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මු. රු. | | |
| **2.1** 'සෞඛ්‍ය ප්‍රවර්ධන සැකසුම' තුළින් ළමයින් සඳහා ආරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම පිණිස ප්‍රජාවන් බලමුළු ගැන්වීම | සෞඛ්‍ය ප්‍රවර්ධන ස්ථානීය ජාලය ව්‍යාප්ත කිරීම: සෞඛ්‍ය ප්‍රවර්ධන පෙරපාසල, සතුටු පවුල, මවු හවුල, සතුටු ගම්මාන ආදිය | HPB | NSECD, INGOs, PDHS, RDHS, පළාත් ECE අධිකාරීන් | | X | X | X | X | 15 Mn | ස්ථාපිත නව සෞඛ්‍ය ප්‍රවර්ධන ස්ථාන සංඛ්‍යාව | HPB දත්ත සමුදාය |
| | පෝෂණය සහතික කිරීම සඳහා පෙර පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රධාන පාර්ශ්වකරුවන් වෙනුවෙන් උපදේශන ලබාදීම | PDHS | පළාත් ECE අධිකාරීන්, HPB, RDHS, MOHs, MWSEID-PHDT INGOs | | X | X | X | X | 3.6 Mn | පවත්වන ලද උපදේශන වැඩසටහන් සංඛ්‍යාව | DCC රැස්වීම්කාර්ය සටහන් |
| **2.2** බලගැන්වීම හරහා දෙමාපියන් සහ දරුවන් සඳහා ප්‍රචණ්ඩත්වය හෙළාදැකීමේ පරිසරයක් නිර්මාණය කිරීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහාය ලබා ගැනීම සඳහා 'මාපිය සහාය තොරතුරු මේසයක්' ස්ථාපිත කිරීම | DS Office | NCPA, පොලිස් දෙපා., NSECD, පළාත් ECE, HPB, FHB, PDHS, RDHS, MOH | | X | X | | | 4 Mn | ස්ථාපිත තොරතුරු මේස සංඛ්‍යාව | DCC රැස්වීම්කාර්ය සටහන් |
| | ඕනෑම අපයෝජනයක්/ප්‍රචණ්ඩත්වයක් ක්ෂණික ඇමතුම් අංකය හරහා වාර්තා කිරීමට ළමා කණ්ඩායම් සවිබල ගැන්වීම | NCPA | NSECD, PDPCCS, MoE, පළාත් ECE, MOH | | X | | | | 0 Mn | දැනුම්වත් කළ ළමා කණ්ඩායම්/සමාජ සංඛ්‍යාව | NCPA-NCC ලැබෙන ප්‍රතිචාර |
| | මුල් ළමාවියේදී වයසට ගැළපෙන ලිංගික අධ්‍යාපනයක් ලබා දීම | NCPA | MoE, HPB, FHB, PDHS, RDHS, MOHs, NIE, පළාත් ECE | | X | X | X | X | 25 Mn | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | NCPA-NCC ලැබෙන ප්‍රතිචාර |
| **2.3** වීථි ළමුන් සඳහා ආරක්ෂිත අවකාශයන් තිබීම සහතික කිරීම | වීථි දරුවන් සඳහා ළමා හිතකාමී අවකාශයන්/ස්ථාන නිර්මාණය කිරීම | DSS | පළාත් සභා, පළාත් පාලන ආයතන, PDPCCS, INGOs, පෞද්. අංශය | | | X | X | | 55 Mn | පවතින ළමා හිතකාමී අවකාශ සංඛ්‍යාව | - |

## උපායමාර්ගය 03

ක්‍රීඩාව, විනෝදය සහ සංස්කෘතික සහභාගීත්වය සඳහා ළමයින්ට ඇති අයිතිය පිළිබඳව දෙමාපියන්, පවුල සහ ප්‍රජාව දැනුවත් කරනු සඳහා වැඩසටහන් සහ සේවා ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මු. රු. | | |
| **3.1** පෙර පාසල් පාදක කරගත් දෙමාපිය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | ක්‍රීඩා සහ සංස්කෘතික උත්සවයන් සමග බද්ධ වූ ළමයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පෙර පාසල්වල ප්‍රවර්ධනය කිරීම | MoE | NSECD, පළාත් ECE, NIE | | X | X | | | 4 Mn | පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | පෙර පාසල් සමීක්ෂණ |
| **3.2** ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම | ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මත පදනම්ව ළමා අයිතිවාසිකම් පිළිබඳ මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම | NCPA | NSECD, DPCCS | X | X | | | | 8 Mn | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | NCPA-වාර්ෂික වාර්තාව |
| | ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබල ගැන්වීම මඟින් දේශීයව නිෂ්පාදිත ක්‍රීඩා උපකරණ සහිත 'ප්‍රජා උද්‍යාන' නිර්මාණය කිරීමට පහසුකම් සැලසීම | NSECD | INGOs, පෞද්. අංශය, MC and UC, ප්‍රාදේශීය සභා, CBOs, ප්‍රජා කණ්ඩායම් | | X | X | | | 18 Mn | ස්ථාපිත ප්‍රජා උද්‍යාන සංඛ්‍යාව | NSECD දත්ත |
| | ළමා අයිතිවාසිකම් පිළිබඳව දෙමාපියන් සහ පවුල් දැනුවත් කිරීම සඳහා දේශීය භාෂාවලින් තොරතුරු සන්නිවේදන මෙවලම් සංවර්ධනය කිරීම | NCPA | NSECD, DPCCS | X | | | | | 2 Mn | සංවර්ධනය කරන ලද IEC ද්‍රව්‍ය සංඛ්‍යාව | NCPA වෙබ් අඩවිය |
| | ක්ෂේත්‍ර සෞඛ්‍ය සායනවලදී ළමා අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු සන්නිවේදන මෙවලම් බෙදා හැරීමට පහසුකම් සැලසීම | MOH | NCPA, DPCCS, NSECD | | X | X | | | 1 Mn | ළමා අයිතිවාසිකම් ගැන දැනුම්වත් මව්වරුන්ගේ % | සමීක්ෂණ දත්ත |

**උපායමාර්ගය 04** ආපදා අවදානම් අවම කිරීමේ ප්‍රජා පාදක සැලසුම් ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලැස්වීම. මෙම උපාය මාර්ගය සඳහා ආපාදා වැළැක්වීම හා ඒ සඳහා සූදානම් වීමේ ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රජාව සහ අදාළ ආයතනවල ධාරිතා සංවර්ධනය.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මු. රු. | | |
| **4.1** ආපදා අවදානම් අවම කිරීම සහ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ ශක්තිය පිළිබඳ ශ්‍රී ලංකා ළමා ප්‍රකාශනය සක්‍රීය කිරීමට උපදේශනය ලබා දීම | 'ආපදා අවදානම අවම කිරීම සහ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීම පිළිබඳ ශ්‍රී ලංකා ළමා ප්‍රකාශනය' පිළිපැදීමට ආපදා සැලසුම්වල සියලුම පාර්ශ්වකරුවන්ට උපදේශන පැවැත්වීම | DPCCS | MoD-DMC, MoH, NSECD | X | X | | | | 0 Mn | mj;ajk ,o WmfoaYk jevigyka ixLHdj | DPCCS දත්ත |
| **4.2** ආපදා වැළැක්වීම සහ පෙර සූදානම් කටයුතු සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවල ධාරිතා සංවර්ධනය | ආපදා අවම කිරීම සැලසුම් කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය කිරීම | DMC | DPCCS, MoH-DPRD, පළාත් / දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම්වරුන් / පළාත් පාලන ආයතන | | X | X | | | 4.5 Mn | පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දත්ත |
| | බහු විපත් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් (RIMES) ග්‍රාමීය මට්ටමින් ස්ථාපිත කිරීම පිළිබඳ ධාරිතා සංවර්ධනය කිරීම. | DMC | MoD, DPCCS, MoH, පළාත්/ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම්වරුන්/ පළාත් පාලන ආයතන | | X | X | | | 18 Mn | RIMES සහිත ගම්මාන සංඛ්‍යාව | දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දත්ත |
| **4.3** ග්‍රාමීය මට්ටමින් ලබා දීමට ආපදා පෙර සූදානම් සැලසුම් ප්‍රවර්ධනය කිරීම | ග්‍රාමීය සම්බන්ධීකරණ කමිටුවේ ධාරිතා සංවර්ධනය කිරීම තුළින් ග්‍රාමීය මට්ටමේ ළමා සංවේදී ආපදා පෙර සූදානම සහ සැලසුම් කිරීම | DMC | MoD-DMC, MoH-DPRD, DPCCS, NSECD | | X | X | | | 18 Mn | ආපදා පෙර සූදානම් සැලසුම් සහිත VCC සංඛ්‍යාව | දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දත්ත |

## උපායමාර්ගය 05

සියළු ම ප්‍රජා පාර්ශ්වකරුවන්ගේ අර්ථාන්විත සහභාගීත්වයෙන් යුතු ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සංස්කෘතික අගයයන් තහවුරු කෙරෙන මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ අදාළ පහසුකම් සැලැස්වීම

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මු. රු. | | |
| **5.1** ජාතික මට්ටමින් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සඳහා ප්‍රජා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ තිරසර කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වේදිකාවක් (උදා: මහජන සංසදය) පිහිටුවීම | වතු අංශය ද ඇතුළත් වන පරිදි මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රජා සංසදය පිහිටුවීම | NSECD | CSOs, INGOs, CBOs, ආගමික නායකයන්, PHDT | | | X | X | | 8 Mn | ECCD සංසදයක් තිබීම | NCC කාර්ය සටහන් |
| **5.2** ප්‍රජා මූලික විනෝදාස්වාදය සහ රැකවරණය සඳහා පහසුකම් සැලසීම පිණිස ග්‍රාමීය ළමා සංවර්ධන කමිටුව (VCDC) ශක්තිමත් කිරීම | ග්‍රාමීය ළමා සංවර්ධන කමිටුව (VCDC) හරහා නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන වැඩසටහන ශක්තිමත් කිරීම - 'සෙනෙහේ තාටාක' වැඩසටහන | NSECD | PDPCCS, PDHS, DS, | | X | X | X | | 27 Mn | ක්‍රියාකාරී ගම්මාන ළමා සංවර්ධන කමිටු සංඛ්‍යාව (VCDC) | DS කාර්යාල දත්ත |
| **5.3** වතු අංශයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල දෙමාපිය කමිටු පිහිටුවීම | ප්‍රජා මට්ටමින් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ වැඩසටහන් සංවිධානය කිරීම සඳහා දෙමාපිය කමිටු පිහිටුවීම සහ බලගැන්වීම | MWSEID-PHDT | පළාත් ECE අධිකාරීන්, PDPCCS, MoPI | | X | X | | | 10 Mn | ස්ථාපිත කර ඇති මාපිය කමිටු සංඛ්‍යාව | PHDT දත්ත |

## උපායමාර්ගය 06

**ළමයින්ගේ කායික සුවතාවය, සමාජ අන්තර්ක්‍රියා මෙන් ම සෙල්ලම් තුලින් ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපකරණ වලින් සමන්විත එළිමහන් අවකාශ ස්ථාපනය කිරීම සඳහා ප්‍රජාවට අදාළ පහසුකම් සැලසීම**

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මි රු. | | |
| **6.1** දෙමාපිය කමිටුවල සහාය ඇතිව පෙර පාසල් සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල එළිමහන් සෙල්ලම් මිදුලක් ප්‍රවර්ධනය කිරීම | සෙල්ලම් මිදුලක් තිබීම සහ භාවිතය අනුව පෙර පාසල් ශ්‍රේණිගත/සන්නාමගත කිරීම | MoE | MoE, පළාත් ECE අධිකාරීන්, NSECD | | X | X | X | X | 1.25 Mn | සියලුම පළාත්වල පෙර පාසල් ශ්‍රේණිගත කිරීම සඳහා සංශෝධිත නිර්ණායක | NCC කාර්ය සටහන් |
| | ළමා සංවර්ධන/ මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන ලියාපදිංචිය සඳහා අවශ්‍ය අවම ප්‍රමිතීන්ට සෙල්ලම් මිදුල ඇතුළත් කිරීම | Provincial ECE authorities/ PDPCCS | MoE, NIE, NSECD | | X | | | | 0 Mn | පෙර පාසල් ලියාපදිංචිය සඳහා සංශෝධිත නිර්ණායක | PCC කාර්ය සටහන් |
| | පෙර පාසල් ගුරු පුහුණු කිරීම් තුළින් සෙල්ලම් පාදක ඉගෙනීම දිරිමත් කිරීම | NIE | පළාත් ECE අධිකාරීන්, MoE, NSECD | | X | X | X | X | 1.5 Mn | සංශෝධිත ගුරු විෂය මාර්ගෝපදේශ | NIE විෂය මාර්ගෝපදේශ |
| | ක්‍රියාකාරකම් පදනම් කරගත් අවිධිමත් ඉගෙනීම සඳහා මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථානවල ඉගෙනුම් මුල්ල / කව පිහිටුවීම | Provincial ECE authorities | CSOs, මාපිය කමිටු, MSGs, INGOs, පෞද්. අංශය | | X | X | X | X | 30 Mn | ඉගෙනුම් කොන්/කව සහිත ECE මධ්‍යස්ථාන % | ECE සමීක්ෂණ |
| **6.2** නාගරික ජනාවාසවල ළමා මිතුරු එළිමහන් අවකාශයන් පිහිටුවීම | විශේෂයෙන් නාගරික ජනාවාසවල හා මහා නගර සභා සහ නගර සභා යටතේ වන නගර සංවර්ධන ව්‍යාපෘතිවල සෙල්ලම් මිදුලක් අනිවාර්යෙන් වෙන් කිරීම | USDA | UDA, පළාත් පාලන අමා., MC & UCs | | X | X | X | X | 0 Mn | නිවාස ව්‍යාපෘති සඳහා ක්‍රීඩා අවකාශ ප්‍රමිතීන් තිබීම | USDA |
| **6.3** ග්‍රාමීය ජනාවාසවල ළමා මිතුරු එළිමහන් අවකාශයන් පිහිටුවීම | ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු (VCDC) හරහා සෙල්ලම් මිදුල් නඩත්තු කිරීම සහතික කිරීම | VCDC | MC & UCs & ප්‍රාදේශීය සභා, දිස්ත්‍රික් ලේකම්, CSOs, පෞද්. අංශය, INGO | | X | X | X | X | 54 Mn | ස්ථාපිත කර ඇති ක්‍රීඩා අවකාශ සංඛ්‍යාව | පළාත් පාලනදත්ත |

උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 05:

# ECCD සඳහා ආයෝජන

**සුවිශේෂී අරමුණ:**
**මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවාවන් සහ වැඩසටහන් සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා මූල්‍ය සම්පත් ඒ අතර සාධාරණව බෙදී යාමත් ඵලදායී ලෙස භාවිතා කිරීමත් සහතික කිරීම.**

## පසුබිම් විශ්ලේෂණය

මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවාවන් පිළිබඳ බහුආංශික ප්‍රවේශය නිසා ඒ සඳහා සිදු කළ ආයෝජනවල පිරිවැය පිළිබඳ පූර්ණ විශ්ලේෂණයක් සිදු කිරීම අපහසු වී ඇත. එබැවින්, මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සඳහා අරමුදල් වෙන් කිරීම ඇතැම් අංශ තුළින් නොසලකා හැරීමට ලක් වී ඇත. ඊට එක් උදාහරණයක් වන්නේ මුල් ළමාවිය අධ්‍යාපනයයි. ශ්‍රී ලංකාව “සැමට අධ්‍යාපනය” අභිමතාර්ථ සඳහා වන ලෝක ප්‍රකාශනයේ (1990)[45] පාර්ශ්වකරුවෙකු බවට පත්ව ඇතුවා සේම එය තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා වන කැපවීම සමඟ යළිත් තහවුරු කර ඇත. නමුත්, පෙර පාසල් අධ්‍යාපනය බොහෝ දුරට පෞද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන අතර ප්‍රාථමික සිට තෘතියික දක්වා සියළු ශ්‍රී ලාංකිකයන්ට නොමිලේ අධ්‍යාපනය හිමිවේ. මුල් ළමාවිය අධ්‍යාපන මැදිහත්වීම්වලට ඉහළ ප්‍රතිලාභ - පිරිවැය අනුපාත මෙන්ම ඕනෑම මානව ප්‍රාග්ධන ආයෝජනයක හොඳම ප්‍රතිලාභ අනුපාතය ඇති බව පර්යේෂණ සාක්ෂි පෙන්නුම් කරයි[46].

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා වන වියදම වසර ගණනාවක් පුරා කලාපීය අනෙකුත් සමාන්තර රටවලට වඩා අඩු වී ඇති අතර බොහෝ දුරට දේශීය අරමුදල් හරහා සිදු කර ඇත[47].

වයස අවුරුදු 5 ට අඩු දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණයෙහි ආයෝජනය කිරීම ළමා සංවර්ධනයේ පූර්ණ හැකියාවන් සාක්ෂාත් කර ගැනමේ තීරණාත්මක එක් සාධකයක් වන බැවින් එය අතිශයින්ම වැදගත් වේ. සෞඛ්‍ය අමාත්‍යාංශය

45 සැමට අධ්‍යාපනය පිළිබඳ ලෝක සමුළුව විසින් සම්මත කරන ලදසැමට අධ්‍යාපනය පිළිබඳ ලෝක ප්‍රකාශනය (1990), 1990 මාර්තු 5-9,ජොම්ටෙයින්, තායිලන්තය,
46 ලෝක බැංකු කණ්ඩායම (2014). කලින් ආයෝජනය කිරීම, සුහුරු ලෙස ආයෝජනය කිරීම සහ සැමට ආයෝජනය කිරීම. ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා අඩිතාලම දැමීම. http://wbgfiles.worldbank.org/documents/hdn/ed/saber/supporting_doc/CountryReports/ECD/ECD_Sri_Lanka_Report.pdf
47 යුනිසෙෆ් (2021). අයවැය සංක්ෂිප්තය: ශ්‍රී ලංකා අධ්‍යාපන අංශය 2021

අවුරුදු 0-5 අතර දරුවන්ගේ සෞඛ්‍යය පිළිබඳ ප්‍රමුඛතම ආයතනය වන අතර මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා මෙන්ම පෝෂණය සඳහා වෙනම වැය ශීර්ෂයක් ද ඇත.

කෙසේවෙතත්, සමහර වැඩසටහන් සංවර්ධන පාර්ශවකරුවන්ගේ ආධාර මත මුළුමනින් ම රඳා පවතී (උදා: ක්ෂුද්‍රපෝෂක පරිපූරක). හඳුනාගත් ව්‍යාපෘති සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයට ද අරමුදල් ලැබේ. පෙර පාසල් සඳහා වන උදෑසන ආහාර වේල ඊට උදාහරණයකි. පෙර පාසල් ආහාර වැඩසටහනේ වත්මන් ආවරණය පෙර පාසල් දරුවන්ගෙන් 17% ක් පමණ වේ[50].

2022 මුල් භාගයේදී ආහාර මිලෙහි දරුණු උද්ධමනය ඇතිවීම සහ ආහාර අනාරක්ෂිතභාවය ඉහළ යාම හේතුවෙන් සංවර්ධන පාර්ශවකරුවන් විසින් විශේෂයෙන් ම කුඩා දරුවන් ඇති මව්වරුන් සඳහා හදිසි සහන පැකේජ සඳහා උපකාර කරන ලදී.

කෙසේවෙතත්, දිගුකාලීනව මවගේ සහ දරුවාගේ නිසි පෝෂණය සහතික කිරීම සඳහා රජයේ නිසි කැපවීම අතිශයින් වැදගත් වේ. 2023 අයවැයෙන් පෙර පාසල් උදෑසන ආහාර වේල වැඩසටහන සඳහා රුපියල් මිලියන 1450ක් වෙන් කිරීමට පොරොන්දු වී තිබීම සඳහන් කළයුතු වැදගත් කරුණකි. මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් සඳහා පෝෂණ අතිරේක ලබාදීමට අමතර රුපියල් මිලියන 500ක් ද මෙම අයවැයෙන් වෙන් කර ඇත[48]. තවද, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හරහා 2021 වර්ෂයේදී මව්වරුන් 188,174 දෙනෙකුට ගර්භණී සමයේදී පෝෂණ දීමනාවක් ලැබී ඇත.

ජලය සහ සනීපාරක්ෂක ප්‍රමිතීන් (WASH) ප්‍රශස්ත කිරීම මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය වන තවත් වැදගත් යටිතල පහසුකම් වේ. 2015 සහ 2019 අතර කාලය තුළ, ජලය සහ සනීපාරක්ෂක (WASH) අංශයේ සැබෑ අයවැය වියදම නාමික වශයෙන් 14.9% ක වාර්ෂික සාමාන්‍ය වර්ධන වේගයකින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත[49].

ජලය සහ සනීපාරක්ෂක (WASH) අංශය විදේශ මූල්‍යකරණය මත ද දැඩි ලෙස රඳා පවතී. ශ්‍රී ලාංකීය ජනගහනය සඳහා සුරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය 2006 දී 76% සිට 2020 දී 93.2% ක් දක්වා ඉහළ ගොස් ඇත38. ඒ හා සමානව, ආරක්ෂිත සනීපාරක්ෂක ආවරණය 2016 දී 91.2% සිට 2019 දී 92.1% දක්වා වැඩි විය[51]. කෙසේවෙතත්, දිස්ත්‍රික්ක අතර පෙර පාසල්වල පානීය ජලය පැවතීම පිළිබඳ පුළුල් විෂමතාවයක් (36.1% සිට 95% දක්වා) 2016 පෙරපාසල් සංගණනයෙන් පෙන්නුම් කරයි. පෙර පාසල්වලින් 9.4% ක් වැසිකිළි පහසුකම් නොමැතිව ක්‍රියාත්මක වන බවද තවදුරටත් අනාවරණය විය[52]. එබැවින් මෙම ක්‍රියාකාරී සැලැස්ම මඟින් මෙම තත්ත්ව ගැටලු සඳහා විසඳුම් ලබා දීමට උත්සාහ දරා ඇත.

48 ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය (2022) අයවැය ඇස්තමේන්තු - 2022 (කෙටුම්පත) (2022 - 2024 මධ්‍යම කාලීන)
49 යුනිසෙෆ් (2021). අයවැය සංක්ෂිප්තය: ශ්‍රී ලංකාවේ ජල සනීපාරක්ෂාව සහ ස්වස්ථතා (WASH) අංශය 2021ඥ
50 මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය (2022). පෙර පාසල් සංඛ්‍යාලේඛන.
51 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආයතනික සැලැස්ම 2020-2025 (2020), පි. 40
52 කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය (2016). ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ජාතික සංගණනය, 2016.

2026-2030 වසර සඳහා වන සමස්ත අංශයේ අයවැය | රු. මි **42,982.4**

**උපායමාර්ගය 01** අතිශයින් අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්ත්වයේ සිටින ළමයින් ඇතුළු සියලු ම ළමයින් සඳහා මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයේ ගුණාත්මක වැඩසටහන් වලට සමාන හා සාධාරණ ප්‍රවිශ්ඨයක් ප්‍රවර්ධනය කිරීමට ජාතික හා පළාත් මට්ටමින් රාජ්‍ය මූල්‍ය ආයෝජන ශක්තිමත් කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **1.1** සියලු ම මූලාශ්‍රවලින් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සඳහා මූල්‍ය ගලායාම සිදුවන ආකාරය සිතියම්ගත කිරීම | බහු පාර්ශ්වකරුවන් හරහා ජාතික සහ පළාත් මට්ටමින් අරමුදල් මූලාශ්‍ර හඳුනාගෙන සිතියම්ගත කිරීම | MWCA-NSECD | රාජ්‍ය මූල්‍ය දෙපා.-MoF, මූල්‍ය කොමිෂන් සභාව, පළාත් සභා, INGOs, පෞද්. අංශය | | X | | | | 0.2 Mn | ජාතික සහ පළාත් මට්ටමින් අනුරූපණයක් තිබීම | වාර්ෂික සමාලෝචන |
| **1.2** මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ජාතික සහ පළාත් මට්ටමින් ප්‍රාග්ධනය සහ පුනරාවර්තන අයවැය හරහා ප්‍රමාණවත් රාජ්‍ය අරමුදල් සැපයීම සහතික කිරීම | මධ්‍යම රජයේ ආයතන සහ පළාත් සභා සඳහා මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන අංශයට විශේෂයෙන් ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීම | MoF<br><br>(ජාතික අයවැය දෙපාර්තමේන්තුව) | මුදල් කොමිෂන් සභාව, පළාත් සභා, MWCA, MoE, MoH, DSS | | | X | X | X | 0 Mn | මධ්‍යම සහ පළාත් මට්ටමින් විශේෂයෙන් වෙන් කළ ප්‍රාග්ධන වැය ශීර්ෂයක් තිබීම | වාර්ෂික වාර්තාව-FC , +MWCA |
| | මධ්‍යම රජයේ ආයතන සහ පළාත් සභා සඳහා මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන අංශයට පුනරාවර්තන අරමුදල් වෙන් කිරීම | MoF<br><br>(ජාතික අයවැය දෙපාර්තමේන්තුව) | මුදල් කොමිෂන් සභාව, පළාත් සභා, MWCA, MoE, MoH, DSS | | X | X | X | X | 0 Mn | මධ්‍යමසහ පළාත් මට්ටම සඳහා පුනරාවර්තන අයවැයක් තිබීම | වාර්ෂික වාර්තාව-FC , +MWCA |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1.3**<br>අඩු වියදමකින් පුළුල් ප්‍රවේශයක් සහිත ගුණාත්මක මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවාවන් සැපයීම සඳහා වන වැඩසටහන් සඳහා ආයෝජන ශක්තිමත් කිරීම | 'ආදර්ශ ගම්මාන' සංකල්පය හරහා ළමා හිතකාමී ගම්මාන මුලපිරීම කෙරෙහි ආයෝජන ශක්තිමත් කිරීම | NSECD | MoH-HPB, MoF, පළාත් සභා, INGOs, CBOs, පෞද්. අංශය | | | X | X | X | 200 Mn | එක් පළාතක වසරකට පිහිටුවන ලද නව ආදර්ශ ගම්මාන සංඛ්‍යාව | PCC-රැස්වීම්කාර්ය සටහන් |
| | ළමා සංවර්ධනයට සහාය වීම පිණිස ළමා උද්‍යානවල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ආයෝජන ශක්තිමත් කිරීම | පළාත් සභා සහ පළාත් පාලන ආයතන | ජාතික සැලසුම් දෙපා.-MoF, UDA, USDA, FOA-මොරටුව විශ්වවිද්‍යාලය, MWSEID-PHDT, MoPI, INGOs, CBOs, පෞද්. අංශය | | | X | X | X | 270 Mn | එක් එක් පළාතේ වසරකට වැඩි දියුණු කරන ලද ළමා උද්‍යාන සංඛ්‍යාව | PCC-රැස්වීම්කාර්ය සටහන් |
| **1.4**<br>පළාත් මට්ටමින් මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන හදිසි ප්‍රතිචාර අරමුදලක් පිහිටුවීම | පළාත් මට්ටමින් මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන හදිසි ප්‍රතිචාර අරමුදලක් පිහිටුවීම සඳහා උපදේශන ලබාදීම | NSECD | MoF, මුදල් කොමිෂන් සභාව, පළාත් සභා | | | X | X | X | 0 Mn | පළාත් මට්ටමින් ECCD හදිසි ප්‍රතිචාර අරමුදලක් තිබීම | PCC-රැස්වීම්කාර්ය සටහන් |
| | ස්ථාපිත මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන හදිසි ප්‍රතිචාර අරමුදල භාවිතා කිරීමට මාර්ගෝපදේශ සකස් කිරීම | MoF | මුදල් කොමිෂන් සභාව, පළාත් සභා, MWCA-NSECD | | | X | | | 0.5 Mn | ECCD හදිසි ප්‍රතිචාර අරමුදල් මාර්ගෝපදේශ තිබීම | PCC-රැස්වීම්කාර්ය සටහන් |

**උපායමාර්ගය 02** මුල් ළමාවියේ පසුවන ළමයින්ගේ ජීවිතවල වෙනසක් ඇති කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන ජලය, සනීපාරක්ෂාව සහ සෞඛ්‍ය හා බැඳුණු ගුණාත්මක මැදිහත්වීම් සහ ගුණාත්මක නිවාස පහසුකම් සැපයීම ඉලක්ක කර ගත් දිළිඳු කම අවම කිරීමේ වැඩසටහන්වලට සිදු කෙරෙන ආයෝජන සඳහා පහසුකම් සැපයීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | ම රු. | | |
| **2.1** අවශ්‍යතා ඇති පෙරපාසල්/ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල ජල හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම | පෙර පාසල්/ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජල හා සනීපාරක්ෂක (WASH) ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම | NSECD | MoE , MoH, ජ්ලෑන් ශ්‍රී ලංකා, MWSEID-PHDT, MoPI, INGO, පෞද්.අංශය | X | X | | | | 2 Mn | WASH ප්‍රමිතීන් ලැබූ පෙර පාසල් සංඛ්‍යාව | - |
| | පෙර පාසල්/ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල ජල හා සනීපාරක්ෂක (WASH) පහසුකම් පිළිබඳ තත්ත්ව විශ්ලේෂණය කිරීම | MWCA-NSECD | MoE, පළාත් ECE, MoH-PDHS/ RDHS/MOH, MWSEID-PHDT | | X | | | | 3 Mn | සතුටුදායක WASH සහිත පෙර පාසල් % | පෙර පාසල් සංසංඛ්‍යාවය |
| | රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය හරහා පෙර පාසල්වල ජල හා සනීපාරක්ෂක (WASH) පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අරමුදල් සැපයීම | පළාත් ECE අධිකාරීන් | MoE, MoH, INGOs, පෞද්.අංශය, MWSEID-PHDT, MoPI | | X | X | X | X | 500 Mn | අරමුදල් ලැබුණු ECE සංඛ්‍යාව | PCC-රැස්වීම්කාර්ය සටහන් |
| **2.2** ගෘහ මට්ටමින් ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන සඳහා පහසුකම් සැලසීම | සමාජ ආධාර වැඩසටහන සඳහා ගෘහ ඒකකයන් තෝරාගැනීමේදී ජල හා සනීපාරක්ෂක (WASH) දර්ශක ඇතුළත් කිරීම | DSS | MoF, NSWB, MoH (MOHs) | X | X | X | | | 0 Mn | සමාජ ආධාර සඳහා සලකා බලන ලද වොෂ් දර්ශක | |
| | දිස්ත්‍රික් ලේකම්කාර්යාලය හරහා ආබාධ සහිත දරුවන් සිටින පවුල් සඳහා වැසිකිළි ආධාර වැඩසටහන අඛණ්ඩව සිදු කිරීම | DSS | MoF, MoH, DS Office, INGOs, පෞද්.අංශය | X | X | X | X | X | 750 Mn | වැසිකිළි ආධාරය ලැබෙනසංඛ්‍යාව | DS කාර්යාලය |
| **2.3** ප්‍රජා මට්ටමින් ජල හා සනීපාරක්ෂක (WASH) පහසුකම් වැඩිදියුණු කිරීමට ආයෝජන සැලැස්වීම | දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම හරහා බදු සහන ලබාදීම සඳහා ජල හා සනීපාරක්ෂක (WASH) පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳ පුද්ගලික අංශයේ හවුල්කරුවන්ගේ ආයතනික සමාජ වගකීම් (CSR) ව්‍යාපෘති පිළිගැනීම | MoF-දේශීය ආදායම් දෙපා. | MoH, MWCA, පෞද්.අංශය, INGO | | | X | | | 0 Mn | සංශෝධිත දේශීය ආදායම් පනත | වාර්ෂික වාර්තාව-FC , +MWCA |
| | ප්‍රජා මට්ටමින් ජල හා සනීපාරක්ෂක (WASH) පහසුකම් වැඩිදියුණු කිරීමට සහාය වීම සඳහා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන යොමු කිරීම | MoH | MoF, MWCA-NSECD, NSWB | | X | X | X | X | 0 Mn | පවත්වන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | සංවර්ධන සහායක සංසදය |

## උපායමාර්ගය 03

ගර්භනී අවධියේ සහ දරු උපතේ සිට වයස අවුරුදු 05 දක්වා කාලය තුළ අඛණ්ඩ රැකවරණයක් ලබා දෙන සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා අදාළ පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **3.1** අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක ළමුන් හට පෝෂණ මැදිහත්වීම් සඳහා විශේෂයෙන් අරමුදල් වෙන් කිරීම | ගැබිණි මව්වරුන් සඳහා ආහාර වවුචර් වැඩසටහන අඛණ්ඩව කරගෙන යාමට ආයෝජන සහතික කිරීම | MWCA | MoF, රාජ්‍ය පරිපාලන අමා.-DS කාර්යාල, PDHS/ RDHS/MOH | X | X | X | X | X | ක්‍රියාකාරී අංශ 01 යටතේ ඇස්තමේන්තු කර ඇත | ආහාර වවුචරය ලැබී ඇති ගැබිණි මව්වරුන්ගේ % | DS කාර්යාල |
| | ක්ෂේත්‍රගත සෞඛ්‍ය සේවා හරහා ළමුන්, ගර්භණී සහ පශ්චාත් ප්‍රසව මව්වරුන් සඳහා පෝෂණ අතිරේක අඛණ්ඩව සැපයීම සඳහා ආයෝජන සහතික කිරීම | MoF | MoH, PDHS/ RDHS/MOH | X | X | X | X | X | 27,000 Mn | ත්‍රිපෝෂ ලබන ගැබිණි මව්වරුන්ගෙන් % | RHMIS, MRI සමීක්ෂණ |
| | ආබාධ සහිත දරුවන් සඳහා මූල්‍ය ආධාර අඛණ්ඩව ලබා දීමට ආයෝජන සහතික කිරීම | MoRDSSCE | MoH, MWCA, DSS, Disability Secretariat | X | X | X | X | X | 4,600 Mn | ආබාධ සහිත දරුවන් සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය | DSS. දත්ත |
| | පෙර පාසල් උදෑසන ආහාර වේල වැඩසටහන අඛණ්ඩව සිදු කිරීමට සහ පුළුල් කිරීමට ආයෝජන සහතික කිරීම | MWCA | MoE, MWCA-NSECD, MoH, INGOs, පෞද්. අංශය | X | X | X | X | X | ක්‍රියාකාරී අංශ 01 යටතේ ඇස්තමේන්තු කර ඇත | ආහාර ලබන පෙර පාසල් % | පෙර පාසල් සංසංඛ්‍යාවය |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **3.2** මාතෘ සහ ළමා සෞඛ්‍ය මැදිහත්වීම් සඳහා විශේෂයෙන් අරමුදල් වෙන් කිරීම | පූර්ව ගර්භණී රැකවරණ, ගර්භණී රැකවරණ, ළමා සෞඛ්‍ය සහ පෝෂණ වැඩසටහන ඇතුළු මාතෘ සහ ළමා සෞඛ්‍ය සේවා සඳහා අඛණ්ඩ අරමුදල් සැපයීම සහතික කිරීම | MoH | MoF, MWCA, INGOs | X | X | X | X | X | 1,550 Mn | MCH රැකවරණ සඳහා වෙනම වැය ශීර්ෂයක් තිබීම | අයවැය වාර්තාව |
| | මාතෘ සහ ළමා සෞඛ්‍ය මැදිහත්වීම් සඳහා ප්‍රතිලාභී වැඩසටහනක් සුරක්ෂිත කිරීම | MoH | MoF, MoH, INGOs | X | X | X | X | X | 0 Mn | MCH රැකවරණ සඳහා ප්‍රතිලාභී වැඩසටහනක් තිබීම | අයවැය වාර්තාව |
| | පුළුල් කරන ලද ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අඛණ්ඩ අරමුදල් සැපයීම සහතික කිරීම | MoH | MoF, MoH, INGOs | X | X | X | X | X | 4,900 Mn | MCH රැකවරණ සඳහා වෙනම වැය ශීර්ෂයක් තිබීම | අයවැය වාර්තාව |
| | විශේෂයෙන් සේවා නොලබන සහ ඌන සේවා ප්‍රදේශවල ක්ෂේත්‍ර සෞඛ්‍ය සේවකයින්ගේ සේවා තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අරමුදල් සැපයීම - නිවාස, දීමනා සහ ප්‍රවාහනය | MoH | MoF, MoH, Mo රාජ්‍ය පරිපාලන, PCs, PDHS, RDHS, MWSEID-PHDT, MoPI | | | X | X | X | 900 Mn | වෙන් කර ඇති විශේෂ අරමුදල් ප්‍රමාණය | අයවැය වාර්තාව |
| **3.3** වගකිවයුතු පුද්ගලික - රාජ්‍ය හවුල්කාරිත්වයට පහසුකම් සැලසීම | මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන වැඩසටහන් සදහා ආයෝජනයෙදී රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම උදා: දුම්කොළ, කිරි ආහාර ආදියෙන් අනුග්‍රහය ලබා ගැනීම. | NSECD | MoF, මුදල් කොමිෂන් සභාව, PCs, MoH | | | X | | | 0.2 Mn | රාජ්‍ය*පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳ මාර්ගෝපදේශ තිබීම ලබා ගැනීමේ හැකියාව | NCC-රැස්වීම්කාර්ය සටහන් |

## උපායමාර්ගය 04

අතිශයින් අවදානමට ලක්විය හැකි මෙන් ම අවාසිදායක තත්ත්වයේ සිටින සෑම ළමයෙකුට ම මුල් ළමාවිය අධ්‍යාපනය ලබා දීම සඳහා ප්‍රජාව මෙන්ම ප්‍රජාව තුළ පවතින සම්පත් ද බලමුලු ගැන්වීම සඳහා පහසුකම් සැලැස්වීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **4.1** පළාත් පාලන මට්ටමින් ප්‍රජා සම්පත් යෙදවීමෙන් නොමිලේ/අඩු වියදම් පෙර පාසල් පිරිනැමීම | මුල් ළමාවිය අධ්‍යාපන සේවා සඳහා භාවිත කළ හැකි සම්පත් පළාත් මට්ටමින් හඳුනාගෙන ලැයිස්තුගත කිරීම. උදා: ඌන උපයෝජිත ගොඩනැගිලි, මානව සම්පත් | පළාත් ECE අධිකාරිය | Provincial Councils, District Secretary, local authorities | X | X | | | | 0 Mn | ලැයිස්තුව ලබා ගැනීමේ හැකියාව | PCC- රැස්වීම්කාර්ය සටහන් |
| | ප්‍රාදේශීය මට්ටමින් පෙර පාසල් සඳහා සහාය වීමට ප්‍රජා සම්පත් (උදා. විශ්‍රාමික ගුරුවරුන්) දිරිමත් කිරීම | පළාත් ECE අධිකාරිය | Provincial Councils, DS, MoE | X | X | X | | | 30 Mn | ප්‍රාදේශීය ප්‍රජාව විසින් සහාය දක්වන ECE සේවාවන්හි ප්‍රතිශතය | ECE සමීක්ෂණ |
| **4.2** නැවත සලක් බැලීම තුළින් පෙර පාසල් ගුරුවරුන් ('ගුරු අභිමානී') සඳහා මුල්‍ය දිරිගැන්වීම් අඛණ්ඩව ලබා දීම. | පෙර පාසල් ගුරුවරුන් ('ගුරු අභිමානී') සඳහා මුල්‍ය දිරිගැන්වීම් අඛණ්ඩව ලබා දීම | NSECD | Provincial Councils, MoE, INGOs | | X | X | X | X | 1,700 Mn | වෙන් කර ඇති අරමුදල් ප්‍රමාණය | අයවැය වාර්තාව |
| **4.3** අධ්‍යාපනික ආධාර සැපයීම හරහා වතුකරයේ මුල් ළමාවිය අධ්‍යාපන සඳහා ළමුන් ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම | මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා දරුවන්ට අධ්‍යාපනික ආධාර ලබාදීම | MWSEID-PHDT | MoPI, MoF, INGOs, CBOs | | X | X | X | X | 120 Mn | වෙන් කර ඇති අරමුදල් ප්‍රමාණය | අයවැය වාර්තාව |

**උපායමාර්ගය 05** මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවාවන් සපයා නොමැති සහ ඌන සේවා සැපයුමක් ඇති ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සියලු පරිපාලන ප්‍රදේශවලට සාධාරණ අයුරින් මානව සහ මූල්‍ය සම්පත් බෙදී යාම ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. | | |
| **5.1** සියලුම පරිපාලන ප්‍රදේශවල මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවාවලට අදාළ සියලුම මානව සම්පත් සිතියම්ගත කිරීම | මධ්‍යම සහ පළාත් මට්ටමින් මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවාවලට අදාළ සියලුම මානව සම්පත් සිතියම්ගත කිරීම | NSECD | PDHS, DPCCS, පළාත් ECE අධිකාරීන්, ශාස්ත්‍රඥයන්/ MoE/ MoH/ MoF | | X | | | | 0.2 Mn | මානව සම්පත් අනුරූපණ තිබීම | NCC- රැස්වීම්කාර්ය සටහන් |
| **5.2** සේවා නොලබන/ ඌන සේවා ප්‍රදේශ සඳහා විශේෂ සේවා යෝජනා ක්‍රම ප්‍රවර්ධනය කිරීම | සේවා නොලබන/ ඌනසේවා ප්‍රදේශ ප්‍රදේශ සඳහා නොමිලේ/ අඩු වියදම් මුල් ළමාවිය අධ්‍යාපන ගුරු පුහුණු වැඩසටහන් ස්ථාපිත කිරීම | MoE | INGOs, පෞද්. අංශය, පළාත් ලේකම්, පළාත් සභා | | | X | X | X | 55 Mn | නොමිලේ පුහුණුව ලබා දුන් ගුරුවරුන් සංඛ්‍යාව | වාර්ෂික වාර්තාව MoE |
| | වතු අංශය ඇතුළුව සේවා නොලබන / ඌන සේවා ප්‍රදේශවල ක්ෂේත්‍රගත සේවකයන් සඳහා විශේෂ දීමනාවක් ලබාදීම | MoF | පළාත් සභා, MWSEID-PHDT, MoPI | | | X | | | 300 Mn | අංශ සේවකයින් සඳහා විශේෂ දීමනාවක් අනුමත කිරීම | වාර්ෂික වාර්තාව- මුදල් කොමිෂන් සභාව |

## උපායමාර්ගය 06

ජාතික සහ පළාත් මට්ටමේ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ පර්යේෂණ කාර්යයන් සඳහා කරනු ලබන ආයෝජන ප්‍රවර්ධනය කිරීම. මෙම කාර්යයේ දී සංවර්ධන පාර්ශ්වකරුවන්ට (දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නො වන සංවිධාන සහ පෞද්ගලික අංශය) තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කළ හැකි වේ.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **6.1** ජාතික බහුආංශික සංසදයක් හරහා මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය හි පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීම | ජාතික බහු ආංශික සංසදයක උපදේශනය හරහා මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනයෙහි පර්යේෂණ අවශ්‍යතා හඳුනාගෙන ඒවා ලැයිස්තුගත කිරීම | NSECD | ශාස්ත්‍රඥයන්, MoE, MoH, තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය | | X | | | | 1.5 Mn | ECCD හි පර්යේෂණ අවශ්‍යතා ලැයිස්තුව | NSECD වෙබ් අඩවිය |
| **6.2** පර්යේෂණ සඳහා අරමුදල් සහතික කිරීම සඳහා අන්තර් ජාතික සංවිධාන හා පෞද්ගලික අංශය ඇතුළු අනුග්‍රාහක ආයතන සම්බන්ධ කිරීම | හඳුනාගත් පර්යේෂණ අංශ සඳහා අරමුදල් ලබා ගැනීම පිණිස අනුග්‍රාහක ආයතන සමඟ සාකච්ඡා කිරීම | NSECD | INGOs, පෞද්. අංශය, ශාස්ත්‍රඥයන්, MoE, MoH, Mo Défense | | X | X | | | 0.5 Mn | පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව | NCC- රැස්වීම්කාර්ය සටහන් |
| **6.3** මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන නිලධාරීන් සඳහා පර්යේෂණ සංවර්ධනය සහ පුහුණුව | මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් සඳහා පර්යේෂණ කුසලතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම සහ පුහුණුව සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම | NSECD | INGOs, විශ්වවිද්‍යාල | | | X | | | 100 Mn | පුහුණු කළ ECCD නිලධාරීන් සංඛ්‍යාව | NCC- රැස්වීම්කාර්ය සටහන් |
| **6.4** මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබඳ පවතින සාක්ෂි පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක් සංවර්ධනය කිරීම | මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබඳ දැනට පවතින පර්යේෂණවල ග්‍රන්ථ නාමාවලියකට අදාළ තොරතුරු රැස්කිරීම සහ සම්පාදනය කිරීම | NSECD | විශ්වවිද්‍යාල/ ශාස්ත්‍රඥයන්, MoE, MoH, INGOs | | X | | | | 2 Mn | දේශීය සාක්ෂි සහිත ග්‍රන්ථ නාමාවලියක් තිබීම | NSECD වෙබ් ගබඩාව |

උපායමාර්ගික ක්‍රියාකාරී අංශය 06:

# පාලනය සහ ගුණාත්මක ව්‍යූහය වැඩිදියුණු කිරීම

2026-2030 වසර සඳහා වන සමස්ත අංශයේ අයවැය | රු. මි **171.55**

**උපායමාර්ගය 01** මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | මි රු. | | |
| **1.1** මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව ශක්තිමත් කිරීම | සියලුම අදාළ පාර්ශ්වකරුවන්ගෙන් සහ පළාත් ලේකම්වරුන් හෝ ඔවුන් විසින් නම් කරන ලද උසස් නිලධාරීන් ඇතුළත් කිරීම සඳහා ජාතික සම්බන්ධීකරණ කමිටු සංයුතිය යාවත්කාලීන කිරීම | MWCA | ජනාධිපති ලේකම් කාර්යාලය, MoE, MoH, MoF, MoD, ජනමාධ්‍ය අමාත්‍යාංශය, තොරතුරු තාක්ෂණ අමා., MoPI, SMEHCI | X | | | | | 0 Mn | NCC සාමාජිකයින්ගේ නව පැතිකඩ | NCC කාර්ය සටහන් |
| | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව සඳහා කාර්යභාර පැවරුමක් (TOR) සකස් කිරීම | MWCA | NCC හි සියලුම සාමාජිකයින් | X | | | | | 0 Mn | TOR ලබා ගැනීමේ හැකියාව | NCC කාර්ය සටහන් |
| | මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබඳ ප්‍රධාන ක්‍රියාකාරී අංශ සඳහා මුල් ළමාවිය රැකවරණය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව යටතේ තාක්ෂණික අනුකමිටු පිහිටුවීම | MWCA, NCC | NCC හි සියලුම සාමාජිකයින් | X | | | | | 0.3 Mn | TSCs ලබා ගැනීමේ හැකියාව | NCC කාර්ය සටහන් |
| | පළාත් මට්ටමේ මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය ක්‍රියාකාරකම් සභාගත කිරීම සඳහා මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටු න්‍යාය පත්‍රය සංශෝධනය කිරීම. | MWCA, NCC | NCC හි සියලුම සාමාජිකයින් | X | | | | | 0 Mn | සංශෝධිත න්‍යාය පත්‍රය | NCC කාර්ය සටහන් |
| **1.2** පළාත් සම්බන්ධීකරණ කමිටු ස්ථාපිත කර ශක්තිමත් කිරීම | ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් බහුආංශික නියෝජනය සහිත පළාත් සම්බන්ධීකරණ කමිටු පිහිටුවීම සහ පළාත් මුල් ළමාවිය අධ්‍යාපන ඒකකය විසින් එම කමිටුව කැඳවීම | පළාත් ECE ඒකකය | පළාත් සභාව, පළාත් ලේකම්, පළාත් ECE අධිකාරිය, PDHS, PDPCCS, පළාත් ECCD නිලධාරීන් | X | | | | | 0.45 Mn | ස්ථාපිත කරන ලද ක්‍රියාකාරී PCC | PCC කාර්ය සටහන් |
| | පළාත් සම්බන්ධීකරණ කමිටු සඳහා කාර්යභාර පැවරුම් (TOR) ලේඛණයක් සකස් කිරීම | පළාත් ECE ඒකකය | PCCහි සියලුම සාමාජිකයින් | X | | | | | 0 Mn | TOR ලබා ගැනීමේ හැකියාව | PCC කාර්ය සටහන් |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1.3**<br>දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ප්‍රති දිශානතිකිරීම සහ ශක්තිමත් කිරීම | සියලුම මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි දිස්ත්‍රික් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්ති කමිටුවල විෂය පථය පුළුල් කිරීම | දිස්ත්‍රික් ලේකම් | RDHS, MOHs DS, පළාත් ECCD නිලධාරීන්, CRC නිලධාරීන් | | X | | | | 0 Mn | පිහිටුවා ඇතිබහුආංශික දිස්ත්‍රික් CC | - |
| | සියලුම මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි ප්‍රාදේශීය ළමා අයිතිවාසිකම් ප්‍රඥප්ති කමිටුවල විෂය පථය පුළුල් කිරීම | ප්‍රාදේශීය ලේකම් | MOH, පළාත් ECCD නිලධාරීන්, CRC නිලධාරීන් | | X | | | | 0 Mn | පිහිටුවා ඇතිබහුආංශික කොට්ඨාශ CC | - |
| **1.4**<br>දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ප්‍රති දිශානතිකිරීම සහ ශක්තිමත් කිරීම | ග්‍රාමීය මට්ටමේ සම්බන්ධීකරණ කමිටු ශක්තිමත් කිරීම | ප්‍රාදේශීය ලේකම් | ECCD officers at DS කාර්යාලය, PHI, PHM, GN | | X | | | | 3 Mn | සක්‍රීය ගම්මාන කසසංඛ්‍යාව | - |

## උපායමාර්ගය 02 මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය සේවා සඳහා බහුආංශික සහයෝගීතාව ශක්තිමත් කිරීම

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. ම | | |
| **2.1**<br>මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී විවිධ මට්ටම් අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම | සියලුම පළාත් සම්බන්ධීකරණ කමිටු කැඳවුම්කරුවන් ජාතික සම්බන්ධීකරණ කමිටුව සඳහා සහභාගී වීම සහ පළාත් මට්ටමින් නව සංවර්ධනයන් යාවත්කාලීන කිරීම | NSECD<br>NCC | පළාත් සභා/ පළාත් ECE ඒකක | | X | X | X | X | 2 Mn | NCC හි PCC නියෝජනය | NCC කාර්ය සටහන් |
| | ද්වි පාර්ශ්වීය කටයුතු පහසු කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ නියෝජනයක් පළාත් සම්බන්ධීකරණ කමිටු වෙත ලබා දීම. | NSECD | | | X | X | X | X | 4.8 Mn | PCC හි NECD නියෝජනය | PCC කාර්ය සටහන් |
| | සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු කැඳවුම්කරුවන් පළාත් සම්බන්ධීකරණ කමිටුව සඳහා සහභාගී වීම සහ දිස්ත්‍රික් මට්ටමින් නව සංවර්ධනයන් යාවත්කාලීන කිරීම | PCC | පළාත් සභා/ පළාත්ලේකම් | X | X | X | X | X | 9 Mn | DCC හි PCC නියෝජනය | PCC කාර්ය සටහන් |

## උපායමාර්ගය 03

**මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය සහ එහි නිලධාරීන්ගේ තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කිරීම.**

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | ම රු. | | |
| **3.1** මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබඳ විශේෂඥ දැනුම සහිත තාක්ෂණික සේවක සංඛ්‍යාවක් ඇති කිරීමෙන් කේන්ද්‍රීය මට්ටමේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ශක්තිමත් කිරීම | මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබඳ විශේෂඥ දැනුම සහිත තාක්ෂණික සේවා තනතුරු මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය තුළ ස්ථාපිත කිරීම | MWCA | MoF, ජනාධිපති ලේකම් කාර්යාලය | | X | X | X | X | 80 Mn | ස්ථාපිත තාක්ෂණික තනතුරු සංඛ්‍යාව | MWCA වාර්ෂික වාර්තාව |
| **3.2** මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම | මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබඳ දැනුම තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා අවස්ථාව ලබා දීම | MWCA | MoE, FHB | | X | X | X | | 6 Mn | පුහුණු කළ ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | MWCA වාර්ෂික වාර්තාව |
| | මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන නිලධාරීන් සඳහා කාර්ය සාධන ඇගයීම්/ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කිරීම | MWCA | MWCA | | | X | | | 0.5 Mn | ඇගයීම් පද්ධතියක් ස්ථාපිත කිරීම | - |

## උපායමාර්ගය 04
අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **4.1** මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරකම් වාර්ෂිකව සමාලෝචනය කිරීම | සියලුම පළාත්වල මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරකම් වාර්ෂිකව සමාලෝචනය කිරීම | NSECD | MoE, MoH | X | X | X | X | X | 9 Mn | පළාත් මට්ටමේ වාර්ෂික සමාලෝචනය | NCC කාර්ය සටහන් |
| | සියලුම දිස්ත්‍රික්කවල මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරකම් අර්ධවාර්ෂිකව සමාලෝචනය කිරීම | NSECD | පළාත් සභාව, පළාත් ලේකම්, දිස්ත්‍රික් ලේකම් | X | X | X | X | X | 12.5 Mn | දිස්ත්‍රික් මට්ටමින් වාර්ෂික සමාලෝචනය | NCC කාර්ය සටහන් |
| **4.2** මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයෙහි නව ප්‍රවණතා පිළිබඳ යාවත්කාලීන කිරීම සඳහා ජාතික මට්ටමේ සමුළුවක් පැවැත්වීම | සියලුම පළාත් පාර්ශවකරුවන් ඇතුළුව මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනයහි නව ප්‍රවණතා පිළිබඳ යාවත්කාලීන කිරීම සඳහා ජාතික මට්ටමේ සමුළුවක් පැවැත්වීම | NSECD | MoE, NIE, MoH, DPCCS, NCPA | X | | X | | X | 9 Mn | ECCD පිළිබඳ ජාතික සමුළුව | - |

**උපායමාර්ගය 05** මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය හි තොරතුරු කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම.

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම් | වගකිව යුතු ප්‍රධාන ආයතනය | වෙනත් වගකිව යුතු ආයතන | කාලරාමුව සහ ඇස්තමේන්තුගත මුදල | | | | | | දර්ශක | සත්‍යාපනය කිරීමේ මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2026 | 2027 | 2028 | 2029 | 2030 | රු. මි | | |
| **5.1** ජාතික බහුආංශික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධීක්ෂණ හා ඇගයීම් රාමුවක් සකස් කිරීම | ජාතික බහුආංශික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධීක්ෂණ හා ඇගයීම් රාමුවක් සකස් කිරීම | MWCA | MoE, NIE, MoH, DPCCS, NCPA, පළාත් ECE අධිකාරීන්, PDHS | X | X | | | | 3 Mn | - | - |
| **5.2** පළාත් සහ කේන්ද්‍රීය මට්ටමේ මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවා ස්ථාන සම්බන්ධ කර තොරතුරු කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම | සියලුම පළාත් මුල් ළමාවිය අධ්‍යාපන කේන්ද්‍රස්ථාන සඳහා පොදු ලියාපදිංචි ආකෘතියක් හඳුන්වාදීම | MoE | NEC, MWCA-NSECD, පළාත් ECE අධිකාරීන් | | X | | | | 0.5 Mn | පොදු ලියාපදිංචි ආකෘතිය භාවිතා කරන පළාත් සංඛ්‍යාව | පළාත් ECE අධිකාරීන් |
| | සියලුම ලියාපදිංචි පෙර පාසල්වල තොරතුරු කළමනාකරණ පද්ධතිය හරහා අඛණ්ඩ අධීක්ෂණය කිරීමට අවශ්‍ය දත්ත ඇතුළත් කිරීමේ ආකෘතියක් සංවර්ධනය කිරීම | MoE | MWCA-NSECD, පළාත් ECE අධිකාරීන්, DCS, INGOs | | X | X | | | 1.5 Mn | පොදු දත්ත කළමනාකරණ ආකෘති ලබා ගැනීමේ හැකියාව | NCC වෙත යවන MoE වාර්තා |
| | සියලුම ලියාපදිංචි පෙර පාසල් සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීම | MoE | MWCA-NSECD, පළාත් ECE අධිකාරීන් | | | X | X | | 10 Mn | ප්‍රතිලාභ ළඟා වන පෙර පාසල් ප්‍රතිශතය | NCC වෙත යවන MoE වාර්තා |
| | තොරතුරු කළමනාකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම | MoE | MWCA-NSECD, පළාත් ECE අධිකාරීන්, INGOs | | | X | X | | 40 Mn | ඩිජිටල්කරණය වූ IMS තිබීම | NCC වෙත යවන MoE වාර්තා |

04

# ප්‍රධාන කාර්ය සාධන දර්ශක

මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික බහුආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (ECCD) 2026-2030 ක්‍රියාවට නැංවීමේ ප්‍රතිඵල ඇගයීම සඳහා වන ප්‍රධාන කාර්ය සාධන දර්ශක

**සෞඛ්‍ය සහ පෝෂණය**

අතිශයින් අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්ත්වයේ වෙසෙන ළමයින් ඇතුළුව සියලු ම මුල් ළමාවියේ පසුවන ළමයින්ට යහපත් සෞඛ්‍ය සහ පෝෂණ සේවාවාන්ට ප්‍රවිෂ්ට වීමට සමාන හා සාධාරණ අවස්ථා ලබා දීම.

| අපේක්ෂිත ප්‍රතිඵලය | තෝරාගත් දර්ශකය/දර්ශක | මූලික දත්ත | දත්ත මූලාශ්‍රය | ඉලක්කය (2029 වනවිට) |
|---|---|---|---|---|
| නියමිත කාලයට සියලුම ගැබිණි මව්වරුන්ට පූර්ව ප්‍රසව සේවා රැකවරණ ලබා දීම. | පුහුණු සෞඛ්‍ය සේවකයින්ගේ උපස්ථානය ලැබූ උපත් අනුපාතය | 99% | FHB සංඛ්‍යාලේඛන | 100% |
| සියලුම ගර්භණී මව්වරුන් සඳහා ප්‍රශස්ත පෝෂණය සහතික කිරීම | අඩු බර සහිත දරු උපත් ප්‍රතිශතය | 14.6% (FHB, 2022) | FHB සංඛ්‍යාලේඛන | 10% |
| අවුරුදු 5 ට අඩු සියලුම ළමයින්ට ප්‍රශස්ත පෝෂණය සහතික කිරීම | අඩු බර සහිත අවුරුදු 5 ට අඩු ළමයින්ගේ ප්‍රතිශතය | 15.3% (FHB, 2022) | FHB සංඛ්‍යාලේඛන | 40% දක්වා අඩු කිරීම |
| | වයස අවුරුදු 5 ට අඩු දරුවන්ගේ කුරුභාවයෙන් පෙළෙන ප්‍රතිශතය | 9.2% (FHB, 2022) | FHB සංඛ්‍යාලේඛන | 40% දක්වා අඩු කිරීම |
| | වයස අවුරුදු 5 ට අඩු දරුවන්ගේ කෘශභාවයෙන් පෙළෙන ප්‍රතිශතය | 10.1% (FHB, 2022) | FHB සංඛ්‍යාලේඛන | 40% දක්වා අඩු කිරීම |
| | වයස අවුරුදු 5 ට අඩු දරුවන්ගේ රක්තහීනතාවයෙන් පෙළෙන ප්‍රතිශතය | 14.6% (MRI, 2022) | MRI සමීක්ෂණය | <10% (NNP target) |
| අවුරුදු 5ට අඩු ළමයින්ට අනෙකුත් සෞඛ්‍ය සේවාවන් ප්‍රශස්ත ලෙස ලබාදීම සහතික කිරීම | 1වන වර්ෂයේදී ප්‍රතිශක්තිකරණ ආවරණය - MMR එන්නත | 99% (2022) | WHO, ප්‍රතිශක්තිකරණ දත්ත | 100% |
| | මාස 18 දී විටමින් අධි මාත්‍රාව ලැබූ ළමුන්ගේ ප්‍රතිශතය | 83.5% (FHB, 2022) | FHB සංඛ්‍යාලේඛන | 95% |
| පූර්ව ප්‍රසව මව්වරුන්ට සහ වයස අවුරුදු 5ට අඩු දරුවන්ට සියලුම සෞඛ්‍ය සේවාවන්හි සාධාරණ ප්‍රවේශය සහතික කිරීම | නවජ දරුවන්ගේ මරණ අනුපාතය | 4.2% (FHB, 2020) | FHB සංඛ්‍යාලේඛන | <2.2% |
| | ළදරු මරණ අනුපාතය | 8.4% (FHB, 2020) | FHB සංඛ්‍යාලේඛන | <5% |
| | අවුරුදු 5 ට අඩු ළමයින්ගේ මරණ අනුපාතය | 9.8% (FHB, 2020) | FHB සංඛ්‍යාලේඛන | <6% |
| | වයස අවුරුදු 2-5 අතර මනා සංවර්ධනයක් පෙන්වන ළමුන්ගේ ප්‍රතිශතය | 85.7% | SDG දර්ශකය සඳහා ජාතික මූලික සමීක්ෂණය 4.2.1 | >95% |

## මුල් ළමාවිය අධ්‍යාපනය

අතිශයින් අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්වයේ පසුවන ළමයින් ඇතුළුව මුල් ළමාවියේ සියලුම ළමයින්ට ගුණාත්මක මුල් ළමාවිය අධ්‍යාපනයකට සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම.

| අපේක්ෂිත ප්‍රතිඵලය | තෝරාගත් දර්ශකය/දර්ශක | මූලික දත්ත | දත්ත මූලාශ්‍රය | ඉලක්කය (2029 වනවිට) |
|---|---|---|---|---|
| සියලුම දරුවන්ට ගුණාත්මක මධ්‍යස්ථාන පදනම් කරගත් මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා ප්‍රවේශය තිබීම සහතික කිරීම. | මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා ළමයින් ජාතික මට්ටමින් ඇතුළත් කිරීමේ අනුපාතය - අවුරුදු 3-5 | 55.6% (2016) | ECD සංගණනය | 75% |
| | ළමයින්ගේ දළ ඇතුළත් කිරීමේ අනුපාතය - පෙර ප්‍රාථමික අධ්‍යාපනය (අවුරුදු 4-5) | 86.56% (2022) | DCS මඟින් ඇස්තමේන්තුව | 90% |
| | රජය විසින් ක්‍රියාත්මක කරන මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථානවල ප්‍රතිශතය | 19.8% (2016) | ECD සංගණනය | 25% |
| | වතුකරයේ පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට ඇතුළත් කරන ලද අවුරුදු 3-5 දරුවන්ගේ මුළු සංඛ්‍යාව | 42% (2018) | AHR (PHDT) | 60% |
| | පළාත් මුල් ළමාවිය අධ්‍යාපන අධිකාරියේ ලියාපදිංචි පෙර පාසල් ප්‍රතිශතය | අදාළ නොවේ | PECE දත්ත සමුදාය | 95% |
| | රජය විසින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා නියම කර ඇති අවම ප්‍රමිතීන් සපුරා ඇති පෙර පාසල් ප්‍රතිශතය | අදාළ නොවේ | PECE දත්ත සමුදාය | 90% |
| | එක් එක් පළාතේ පෙර පාසල්වල ගුරුංශිෂ්‍ය අනුපාතය 1:20 වීමේ ප්‍රතිශතය (%) | අදාළ නොවේ | PECE දත්ත සමුදාය | 90% |
| | අවම සුදුසුකම් සහිත පෙර පාසල් ගුරුවරුන්ගේ ප්‍රතිශතය (වසර 1ක ඩිප්ලෝමාව) | අදාළ නොවේ | ECD සංගණනය | 75% |
| | NIEහි ජාතික විෂයමාලා මාර්ගෝපදේශයට අනුගත පෙර පාසල් ප්‍රතිශතය | අදාළ නොවේ | ECD සංගණනය | 75% |

| | | | | |
|---|---|---|---|---|
| සියලුම දරුවන්ට ප්‍රශස්ත සංවර්ධනය තහවුරු කිරීම සඳහා උත්තේජක ගෘහ පරිසරයක් තිබීම | නිවසේ ළමා පොත් තුනක් හෝ වැඩි සංඛ්‍යාවක් ඇති මාස 24-59 අතර ළමුන් | 77.1% (2016) | DHS | 90% |
| | නිවසේ සෙල්ලම් බඩු දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් ඇති මාස 24-59 අතර ළමුන් | 69.4% (2016) | DHS | 85% |
| | නිරන්තරයෙන් දෙමාපියන් දැනුවත් කිරීමේ සැසි පවත්වන පෙර පාසල් ප්‍රතිශතය | අදාළ නොවේඳ | PECE දත්ත සමුදාය | |
| මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් රාජ්‍ය ආයෝජනයක් සහතික කිරීම | මුල් ළමාවිය අධ්‍යාපන සේවා සඳහා (රාජ්‍ය සහ පෞද්ගලික) වියදම් - දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 0.0001 (2014) | WB | 50% කින් ඉහළ නැංවීම |
| | ක්‍රියාකාරී තත්වයේ පවතින දත්ත කළමනාකරණ පද්ධතියක් තිබීම | අදාළ නොවේ | NSECD | 100% |

## රැකවරණය සහ ආරක්ෂාව

ප්‍රචණ්ඩත්වය, අපයෝජනය සහ නොසලකා හරිනු ලැබීම නිසා රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය වන ළමයින් ට විශේෂ අවධානය යොමු කරමින් මුල් ළමාවියේ පසුවන සියලුම ළමයින්ට, රැකවරණය සහ ආරක්ෂාව සලසන ගුණාත්මක සේවාවන් සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම.

| අපේක්ෂිත ප්‍රතිඵලය | තෝරාගත් දර්ශකය/දර්ශක | මූලික දත්ත | දත්ත මූලාශ්‍රය | ඉලක්කය (2029 වනවිට) |
|---|---|---|---|---|
| සියලුම ළමයින්ට රැකවරණ සහ ආරක්ෂණ සේවා සඳහා ප්‍රවේශය තිබීම සහතික කිරීම | අවුරුදු 50 අඩු දරුවන් සම්බන්ධව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා කර ඇති පැමිණිලි වලින් මැදිහත්වීමක් සිදු කරන ලද පැමිණිලි සංඛ්‍යාව | අදාළ නොවේ | NCPA දත්ත සමුදාය | 100% |
| | සිවිල් අධිකාරියක උපත් ලියාපදිංචි කර ඇති අවුරුදු 5 ට අඩු ළමයින්ගේ අනුපාතය | 98.9% (2019) | ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 100% |
| | ළමයින්ට එරෙහි වාර්තා වී ඇති අපරාධ සහ වැරදි | 3594 (2020) | ශ්‍රී ලංකා පොලිසිය | 50% දක්වා අඩු කිරීම |
| සෑම ළමයෙකු සඳහා ම රැකවරණ සහිත ආරක්ෂිත ගෘහ පරිසරයක් තිබීම සහතික කිරීම | ප.සෞ.නි. මඟින් නිවාස අවදානම් සාධක පරීක්ෂා කිරීම හරහා මැදිහත්වීම සඳහා යොමු කරන ලද ළමුන් සංඛ්‍යාව | අදාළ නොවේ | RHMIS | - |
| | පසුගිය වසරේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය (IPV) අත්විඳි 'විවාහ වූ' කාන්තාවන්ගේ ප්‍රතිශතය | 20% (2016) | DHS | <10% |
| | අවුරුදු 5 ට අඩු ළමයින්ගේ හේතු විශේෂිත මරණ අනුපාතිකය | අදාළ නොවේ | DHS | - |

**දෙමාපියන්, පවුල සහ ප්‍රජාව**

ළමයින් හදා වඩා ගැනීමේදී සිය කාර්යභාරය සහ වගකීම් වඩා ඵලදායී ලෙස ඉටු කිරීමට හා මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවාවන් හා වැඩසටහන්වලට තම උපරිම දායකත්වය සහතික කිරීමට දෙමාපියන්, පවුල හා ප්‍රජාව ශක්තිමත් කිරීම

| අපේක්ෂිත ප්‍රතිඵලය | තෝරාගත් දර්ශකය/දර්ශක | මූලික දත්ත | දත්ත මූලාශ්‍රය | ඉලක්කය (2029 වනවිට) |
|---|---|---|---|---|
| මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවාවන් ප්‍රශස්ත ලෙස බෙදා හැරීම සඳහා ආධාරක ප්‍රජා ජාලයක් තිබීම සහතික කිරීම. | අවම වශයෙන් එක් මවු හවුලක් සඳහා පහසුකම් සපයන ප.සෞ.නි. ≥50% සහිත අංශවල ප්‍රතිශතය | අදාළ නොවේ | මවු හවුල ක්‍රියාකාරකම් පිළිබඳ කාර්තුමය සාරාංශ වාර්තාව | 100% |
| ප්‍රමාණවත් ළමා මිතුරු පරිසරයක් තිබීම සහතික කිරීම. | සියලුම වයස්වල, ස්ත්‍රී/පුරුෂ සහ ආබාධ සහිත තැනැත්තන්ගේ පොදු භාවිතය සඳහා නගරවල එළිමහන් පරිසරයක නිර්මාණය වී ඇති සාමාන්‍ය පරිහරණය සඳහා ළමා මිතුරු පරිසරය | අදාළ නොවේ | UDA | 20% |

**මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා ආයෝජන**

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවාවන් සහ වැඩසටහන් සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා මූල්‍ය සම්පත් ඒ අතර සාධාරණව බෙදී යාමත් ඵලදායී ලෙස භාවිතා කිරීමත් සහතික කිරීම

| අපේක්ෂිත ප්‍රතිඵලය | තෝරාගත් දර්ශකය/දර්ශක | මූලික දත්ත | දත්ත මූලාශ්‍රය | ඉලක්කය (2029 වනවිට) |
|---|---|---|---|---|
| තෘප්තිමත් වූ මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන සේවා සඳහා ප්‍රමාණවත් ආයෝජන සිදු කිරීම | වැඩිදියුණු කළ පානීය ජල ප්‍රභවයක් ඇති පවුල් ප්‍රතිශතය | 90% (2016) | DHS | 98% |
| | පළාත් මට්ටමේ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තු කරන ලද අරමුදල්වලින් ලැබුණු මුදල් ප්‍රතිශතය | අදාළ නොවේ | PC | 100% |

# 05

# ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණය

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2018 ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ප්‍රතිපත්ති ලේඛනයේම පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව, බහු-ආංශික ක්‍රියාමාර්ග ජාතික (මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව), පළාත් (පළාත් සම්බන්ධීකරණ කමිටුව), දිස්ත්‍රික් (දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව), ප්‍රාදේශීය (ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව) සහ ග්‍රාමීය (ග්‍රාමීය සම්බන්ධීකරණ කමිටුව) මට්ටමින් විවිධ සම්බන්ධීකරණ කමිටු හරහා ක්‍රියාත්මක කර සම්බන්ධීකරණය කිරීමට නියමිතය (5.2 රූප සටහන බලන්න). කාර්යයන් ද්විත්වකරණය වීම වැළැක්වීම සඳහා ඒවායින්, දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ සම්බන්ධීකරණ කමිටු පවතින ළමා අයිතිවාසිකම් (CRC) කමිටු වලට සමගාමීව ක්‍රියාත්මක වේ.

මෙම යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා විශේෂයෙන් මෙම ක්‍රියාකාරී සැලැස්ම මගින් ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කරනු ලබයි. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවෙහි නියෝජනය ප්‍රධාන අමාත්‍යාංශවල ලේකම්වරුන් හෝ ඒ හා සමාන ඉහළ මට්ටමේ නිලධාරීන් විසින් සිදු කිරීම සහතික කිරීම සහ ජාතික මට්ටමින් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රධාන තීරණ ගැනීමේ ආයතනය වීමට කමිටුව සවිබල ගැන්වීම යෝජිත ප්‍රධාන ක්‍රියාමාර්ගවලින් එකකි.

තවද, මෙම ක්‍රියාකාරකමට ආධාර කිරීම සඳහා, මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී අංශ පහ සම්බන්ධයෙන් ප්‍රධාන තාක්ෂණික උපදේශක කමිටු පහක් පිහිටුවීමට යෝජිතය. තාක්ෂණික කමිටු විසින් උපදේශන කාර්යභාරයක් ඉටු කළ යුතු අතර අදාළ ක්‍රියාකාරී අංශ යටතේ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයහි සමස්ත සේවා ප්‍රතිපාදන වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ යෝජනා කළ යුතුය. තවද, මෙම තාක්ෂණික කමිටු දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ සම්බන්ධීකරණ කමිටුවල මතු කරන ගැටලු සලකා බලා මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ යෝජනා කරනු ඇත.

මෙම සම්බන්ධීකරණ කමිටුවලට එකඟතාවයන් ලබා ගැනීමට මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් තාක්ෂණික උපදේශක කමිටුවලට පහසුකම් සපයනු ඇත. දිස්ත්‍රික්, පළාත් සහ ජාතික සම්බන්ධීකරණ කමිටු අතර සිරස් සම්බන්ධීකරණය සහතික කිරීම සහ එමගින් ජාතික සම්බන්ධීකරණ කමිටුවෙහි කාර්යක්ෂම තීරණ ගැනීම මෙමගින් අපේක්ෂා කෙරේ. තාක්ෂණික කමිටු විසින් අදාළ ක්‍රියාකාරී අංශවල අධීක්ෂණ දර්ශක ද සොයා බලා ක්‍රියාවන්හි ප්‍රගතිය ජාතික සම්බන්ධීකරණ කමිටුව වෙත වාර්තා කරනු ඇත.

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2018 විසින් එක් එක් සම්බන්ධීකරණ කමිටුවේ වගකීම් සහ කාර්යයන් හඳුනාගෙන ඇත (ECCD ප්‍රතිපත්තිය - 2018 - පිටුව 24-28). එය නැවත සමාලෝචනය සහ කාර්යභාර පැවරුම (ToR) බවට පරිවර්තනය කිරීම කළ යුතුය. එම කාර්යය විධිමත් කිරීම සඳහා තාක්ෂණික උපදේශක කමිටු සතුව කාර්යභාර පැවරුම් ලේඛනයක් ද ඇත.

තොරතුරු කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම ඉහත ආයතනවල සුමට ක්‍රියාකාරිත්වයට සහාය වීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි, එබැවින් එය ප්‍රමුඛතා ක්‍රියාකාරී අංශයක් ලෙස හඳුනාගෙන ඇත. තවද, ඉහත සඳහන් කළ ආයතනවලට බිම් මට්ටමට ළඟා වීමට ජාතික සම්බන්ධීකරණ කමිටු මට්ටමින් ගනු ලබන තීරණ පිළිබඳ ප්‍රතිපෝෂණ ලබා දීම සඳහා පහළ සිට ඉහළට මෙන්ම ඉහළ සිට පහළට ප්‍රවේශයන් ද තිබිය යුතු අතර, ඒවා අදාළ කාර්යභාර පැවරුම් (ToRs) තුළට ඇතුළත් කළ යුතුය.




5.1 රූපය: බහුආංශික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම - ප්‍රධාන ක්‍රියාකාරීන්

As illustrated in this picture, the implementation of this multi-sectoral action plan is the collective responsibility of multiple key institutions responsible for provision of ECCD services under different action areas. Some of the institutions may provide services in more than one action area. The development partners and private sector may offer support to these identified institutions at National and provincial level aiming overall quality improvement of services.




5.2 රූපය: සම්බන්ධීකරණ කමිටු සහ තාක්ෂණික කමිටු අතර සම්බන්ධය

# ඇමුණුම 1:
## මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය (ECCD) - 2026-2030 පිළිබඳ ජාතික බහුආංශික උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී නියෝජනය දක්වන ලද නියෝජිත ආයතන

රාජ්‍ය ආයතන - මධ්‍යම

**කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය (MWCA)**
- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය (NSECD)
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA)
- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (DPCCS)
- සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**අධ්‍යාපන අමාත්‍යාංශය (MoE)**
- ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව
- සැමට අධ්‍යාපන ඒකකය
- ජාතික අධ්‍යාපන ආයතනය (NIE)

**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**
- නාගරික සංවර්ධන අධිකාරිය

**ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය**
- වැවිලි මානව සංවර්ධන භාරය

**ආරක්ෂක අමාත්‍යාංශය**
- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

**සෞඛ්‍ය අමාත්‍යාංශය (MoH)**
- පවුල් සෞඛ්‍ය කාර්යාංශය (FHB)
- පෝෂණ අංශය
- සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ (HPB)

**ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

**මුදල් කොමිෂන් සභාව**

**මුදල් අමාත්‍යාංශය**
- ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
- ජාතික අයවැය දෙපාර්තමේන්තුව

**අධිකරණ අමාත්‍යාංශය**

**ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**රජයේ ආයතන - පළාත්/ප්‍රාදේශීය**

- පළාත් ECE ඒකක-ඌව, මධ්‍යම, දකුණ, බස්නාහිර, උතුර, නැගෙනහිර, වයඹ, සබරගමුව, උතුරු-මැද
- පළාත්/කලාප අධ්‍යාපන ඒකක
- පළාත් ලේකම්වරු
- පළාත් අධ්‍යක්ෂ-සෞඛ්‍ය සේවා ඒකක
- පළාත් පරිවාස ඒකක-PDPCCS
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල

**වෘත්තීය සංවිධාන/ අධ්‍යාපනඥයින්/ ප්‍රවීණයන්**

- ළමා රෝග විශේෂඥයින්ගේ විද්‍යායතනය
- උපදේශක ප්‍රජා ළමා රෝග විශේෂඥ වෛද්‍ය දිලිනි විපුලගුණ මහත්මිය
- උපදේශක සායනික පෝෂණවේදී - වෛද්‍ය මනෝජි ගමගේ මහත්මිය

**UN / INGO / NGO / පෞද්ගලික අංශය**

- UNICEF
- ලෝක සෞඛ්‍ය සංවිධානය
- Save the Children
- ලෝක ආහාර වැඩසටහන
- Room to Read Sri Lanka
- Unilever company
- Child Fund-Sri Lanka
- සර්වෝදය - ළමා සංවර්ධන ඒකකය
- LEADS
- HEMAS outreach foundation
- DP education
- Atlas Company

# ඇමුණුම 2:
## මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ විවිධ මට්ටම්වල සෘජු සේවා සපයන්නන්

| | |
|---|---|
| **1. ජාතික මට්ටම** | ලේකම් - කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය<br>ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධ්‍යක්ෂ - මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජතික ලේකම් කාර්යාලය<br>කොමසාරිස් - පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>සභාපති - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය |
| **2. පළාත් මට්ටම** | ලේකම් - අධ්‍යාපන අමාත්‍යාශය<br>ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>පරිවාස කොමසාරිස්<br>අධ්‍යක්ෂ - අධ්‍යාපන, සෞඛ්‍ය, සමාජසේවා<br>අධ්‍යක්ෂ - ECCD/පෙර පාසල් ඒකක |
| **3. දිස්ත්‍රික් මට්ටම** | මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්<br>පරිවාස හා ළමා රක්ෂක සේවා නිලධාරීන්<br>උපදේශන නිලධාරීන්<br>සෞඛ්‍ය සේවා ග්‍රාමීය අධ්‍යක්ෂ<br>වෛද්‍ය නිලධාරී - මාතෘ හා ළමා සෞඛ්‍ය<br>ළමා ආරක්ෂක නිලධාරී<br>සමාජසේවා නිලධාරී<br>පළාත් පරිවාස නිලධාරී |
| **4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම** | මුල් ළමාවිය සංවර්ධන නිලධාරී<br>ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී<br>උපදේශන නිලධාරී<br>ළමා ආරක්ෂක නිලධාරී<br>සමාජ සේවා නිලධාරී<br>සමෘද්ධි සමාජ සංවර්ධන නිලධාරී<br>නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති නිලධාරී<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී<br>මහජන සෞඛ්‍ය හෙද නිලධාරී |
| **5. ග්‍රාමීය/ බිම් මට්ටම** | මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී<br>ග්‍රාම නිලධාරී<br>ආර්ථික සංවර්ධන නිලධාරී |